# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# (මහාමාර්ග අංශය)

# 2018

මහාමාර්ග හා මාර්ග සංවර්ධන
සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

# පෙරවදන

**මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ (මහාමාර්ග අංශය) වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මගින් ලබාදී ඇති උපදෙස් අනුව සකස් කර ඇත.**

**මෙම වාර්තාව මගින් මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ (මහාමාර්ග අංශය ) භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.**

## පටුන


**1.0 මහාමාර්ග පිළිබඳ හැඳින්වීම ........ 01**

1.1 හැඳින්වීම ........ 01

1.2 අමාත්‍යාංශයේ ක්‍රියාකාරී අංශ........ 02

1.3 කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු ........ 02

1.4 ආංශික කාර්යසාධනය........ 05

1.5 පුහුණු කිරීම් සහ සම්මන්ත්‍රණ (මහාමාර්ග අංශය)........ 25

1.6 මූල්‍ය කාර්යසාධනය........ 28

**2.0 වර්ධිත ආයෝජනය ප්‍රවේශයන් ........ 31**

2.1 නව ප්‍රවේශයන් ........ 31

**3.0 අධිවේගී මාර්ග සංවර්ධනය ........ 39**

3.1 අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය........ 40

3.2 පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය........ 43

3.3 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ........ 46

3.4 දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය ........ 49

**4.0 මහාමාර්ග සංවර්ධනය ........ 52**

4.1 ශ්‍රී ලංකාවේ මහාමාර්ග ජාලය ........ 52

4.2 මාර්ග සහ පාලම් නඩත්තු කිරීම........ 54

4.3 ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය ........ 57

4.4 රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය ........ 58

4.5 පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (ඒ 5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ...... 60

4.6 ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය - අතිරේක ණය ........ 62

4.7 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල-11........ 63

4.8 උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේකණය........ 65

4.9. අධිවේගී මාර්ග සබඳතා වැඩිදියුණුකිරීමේ සැලසුම් ව්‍යාපෘතිය ........................ 67

4.10. මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය................................................ 69

4.11 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය ........................................ 70

4.12 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

- (PRP III) අදියර I ................................................................ 73

4.13 දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය ............................................................. 75

4.14 ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන ................................ 77

4.15 දෙවන ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන (I Road 1&2).. 80

4.16 රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය ...................................................................... 82

4.17 ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය ................................ 83

4.18 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ

ව්‍යාපෘතිය 3 -අදියර II........................................................................ 85

4.19 බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය- අදියර III ................................ 87

4.20 බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය .......................... 88

4.21 ඌව සහ මධ්‍යම පළාත තුළ පිහිටා ඇති පාලම් හා මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම.............................................................................. 89

4.22 ප්‍රවාහන ව්‍යාපාති පහසුකම් සැකසීමේ ව්‍යාපෘතිය ........................................ 90

4.23 පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය.................................... 92

**5.0 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම ....................................................... 94**

5.1 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම ....................................................... 94

**6.0 පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම ........ 102**

6.1 ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම ප්‍රතිනිර්මාණය ........ 103

6.1 පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම ........ 104

6.2 ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II ........ 105

6.3 ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 ක් නැවත ඉදිකිරීම ........ 106

6.4 පාලම් 46 ක් නැවත ඉදිකිරීම ........ 108

6.5 ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ........ 110

6.6 දෙවන නව කැළණි පාලම ඉදිකිරිම ........ 111

6.7 පාලම් නඩත්තු ඒකක ක්‍රමවේදයක් (BMS) හා පාලම් තක්සේරු ඒකකයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ........ 113

6.8 සාමාවච්චතිච්- මුනෙයිච්නෙයි මාර්ගයේ පයිප්ප පාලමක් ඉදිකිරීම (තට්ටුතුරෙයි පාලම) ........ 113

6.9 පැලියගොඩ- පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම ඉදිකිරීම ........ 116

6.10 රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල යන ප්‍රදේශවල ගුවන් පාලම් 03 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ........ 116

**7.0 ස්වභාවික විපත්වලින් හානියට පත් මාර්ග වලින් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම ........ 120**

7.1 ජාතික මහාමාර්ග ජාලයේ නායයෑමේ ව්‍යසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය ........ 120

**8.0 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන ........ 123**

8.1 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය ........ 124

8.2 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය ........ 126

**9.0 ප්‍රගති සමාලෝචනය (2015 සහ 2016) ........ 127**

9.1 මූල්‍ය ප්‍රගතිය ........ 127

9.2 භෞතික ප්‍රගතිය ........ 144

## වගු පටුන


වගු අංක 1.3.1 2018/12/31 ට කාර්ය මණ්ඩල තොරතුරු (මහාමාර්ග අංශය)...................... 02

වගු අංක 1.3.2 2018/12/31 ට කාර්යමණ්ඩල වෙනස්වීම්(මහාමාර්ග අංශය)........................ 04

වගු අංක 1.4 2018/12/31 ට කාර්ය මණ්ඩල තොරතුරු .................................................. 05

වගු අංක 1.5.1 පුහුණු කිරීම් හා සම්මන්ත්‍රණ (මහමාර්ග අංශය) ........................................ 25

වගු අංක 1.5.2 නිල විදේශ පුහුණුවීම් ................................................................... 26

වගු අංක 1.6.1 සංශෝධිත අයවැය ප්‍රතිපාදනය සහ මුළු වියදම .......................................... 28

වගු අංක 1.6.2 පුනරාවර්තන වියදම .......................................................................... 28

වගු අංක 1.6.3 ප්‍රාග්ධන වියදම............................................................................. 29

වගු අංක 1.6.4 අත්තිකාරම් ගිණුම ......................................................................... 30

වගු අංක 2.1.4.2.1. වැඩි දියුණු කිරිමට යෝජිත මාර්ග- මධ්‍යම අධිවේගී මාර්ගය හා මහනුවර හා තදාසන්න ප්‍රදේශ වල මාර්ග........................................................................... 35

වගු අංක 2.1.5.2.2 කොහුවල,ගැටඹේ ,හා හීරස්සගල ඉදි කිරිමට යෝජිත ගුවන් පාලම්........... 37

වගු අංක 3.1.1 පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ රථවාහන ගමනාගමන ධාරිතාවය................. 40

වගු අංක 3.1.2 2018 වසරේ මාසික රථවාහන ගමනාගමන ධාරිතාවය.................................. 41

වගු අංක 3.1.3 දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ආදායම.......................................... 42

වගු අංක 3.1.4 මෙහෙයුම් තත්වයෙහි පවතින අධිවේගී මාර්ගයන්හි 2018 වසර සඳහා වාර්තා වූ ආදායම්.............................................................................................. 42

වගු අංක 4.1.1 ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය........................................................ 52

වගු අංක 4.1.2 2018.12.31 වන විට “ඒ “හා “බී “වර්ගයේ මාර්ගයන් හි පළාත්බද වර්ගීකරණය............................................................................................. 52

වගු අංක 4.1.3 මතුපිට පාෂ්ඨීය වර්ගීකරණය (%)........................................................... 53

වගු අංක 4.1.4 2018 වර්ෂයේ "බී "වර්ගයේ මහාමාර්ග සඳහා අළුතින් එකතු කරන

ලද මහාමාර්ග........................................................................................................... 54

වගු අංක 4.2.1 2018 .12.31 දින වන විට මාර්ග නඩත්තු කටයුතුවල ප්‍රගතිය ............................ 55

වගු අංක 4.3.1 ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ කාර්යයන්........................................................................................................... 57

වගු අංක 4.3.2 ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ වන ක්‍රියාකාරකම් ..... 57

වගු අංක 4.4.1රථවාහන ගමනාගමන කළමණාකරණ ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ සිදු කරනු ලද ක්‍රියාකාරකම්........................................................................................................... 59

වගු අංක 4.5.1 පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් පැකේජ ....... 60

වගු අංක 4.6.1ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘති-අතිරේක ණය යටතේප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග………………........................................................................................... 63

වගු අංක 4.7.1 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද

මාර්ග…………………. ........................................................................................ 64

වගු අංක 4.8.1උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේක ණය යටතේ ප්‍රතිසංස්කරණිත මාර්ග……………. ........................................................................................ 66

වගු අංක 4.10.1 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සහ පාලම් ........................................................................................ 69

වගු අංක 4.12.1 මූලික කොන්ත්‍රාත් පැකේජයන් හි ඉතුරුම් භාවිතා කරමින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග........................................................................................................... 74

වගු අංක 4.13. 1 දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරනු ලබන මාර්ග........................................................................................................... 76

වගු අංක 4.14.1 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් මාර්ග ............ 78

වගු අංක 4.16.2පළාත් අනුව මාර්ග පැකේජයන් හි භෞතික ප්‍රගතිය ............ 82

වගු අංක 4.14.3 ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා යෝජිතජාතික මාර්ග............ 79

වගු අංක 4.15.1දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන යටතේ තෝරාගත් මාර්ග ....... 80

වගු අංක 4.16.1ක්‍රියාත්මක තත්වයේ පවතින මාර්ග කොටස් වල ප්‍රගතිය............ 82

වගු අංක 4.20.1බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ තොරා ගත් මාර්ග............ 88

වගු අංක 4.21.1 ඌව සහ මධ්‍යම පළාත තුළ පිහිටා ඇති පාලම් හා මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා තෝරා ගත් ව්‍යාපාති ............ 90

වගු අංක 4.22.1 ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ ක්‍රියාකාරකම වල 2018.12.31 වන දිනට ප්‍රගතිය............ 91

වගු අංක 5.1.1 2018 වර්ෂයේ මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ භෞතික ප්‍රගතිය .. 95

වගු අංක 5.1.2 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය............ 96

වගු අංක 5.1.3 2017 හා 2018 වර්ෂයන්හි ලබාගෙන ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය ............ 97

වගු අංක 5.1.4 2018.12.31 දිනට අයවැය ප්‍රතිපාදනය ............ 98

වගුඅංක 5.1.5 2017.12.31 දිනට අයවැය ප්‍රතිපාදනය ............ 99

වගු අංක 5.1.6 2017 හා 2018 වර්ෂයන්හි පළාත් වශයෙන් මූල්‍ය ප්‍රගතිය............100

වගු අංක 6.1.1 2018 වර්ෂය තුළ ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති සඳහා භෞතික ප්‍රගතිය............103

වගු අංක 6.4.1 කොන්ත්‍රාත් පැකේජ 1 යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට තොරාගනු ලැබූ පාලම්වල භෞතික ප්‍රගතිය............ 107

වගු අංක 6.4.2 සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව2017 හා 2018 වර්ෂ වල අත් කර ගත් හා ළඟාකරගත් සමස්ථ ප්‍රගතිය ........ 108

වගු අංක 6.11.1 ඉදිකරනු ලබන ගුවන් පාලම් 3 පිළිබඳ විස්තර ........ 117

වගු අංක 6.11.2 2018.12.31 වන දිනට භෞතික ප්‍රගතිය ........ 118

වගු අංක 7.1.1 ස්වභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමේ භෞතික ප්‍රගතිය ........ 121

වගු අංක 8.1.1 2016,2017 හා 2018 වර්ෂයන්හි දි ඉදිකරන ලද නිර්මිතයන් ........ 124

වගු අංක 8.1.2 2017 ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක සපුරාගැනීමෙහි ප්‍රගතිය ........ 125

වගු අංක 9.1.1 2018.12.31 වන දිනට වාර්තාගත වැඩ ප්‍රමාණය සඳහා වන වියදමෙහි ඉතුරුම් සහ හිඟ බිල්පත් ........ 129

වගු අංක 9.1.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය ........ 131

වගු අංක 9.1.3. අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන මඟින් අත් කරගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය.

වගු අංක 9.1.4 අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනේ එක් එක් ව්‍යාපෘති මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය ........ 131

වගු අංක 9.1.5 මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය ........ 132

වගු අංක 9.1.6 මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි එක් එක් ව්‍යාපෘතීන් මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය ........ 133

වගු අංක 9.1.7මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය ........ 136

වගු අංක 9.1.8 මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා පළාත් මට්ටමින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය ........ 137

වගු අංක 9.1.9. පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සඳහාසමස්ත මූල්‍ය ප්‍රගතිය ........ 138

වගු අංක 9.1.10. පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතීන්හි මූල්‍යප්‍රගතිය ........ 138

වගු අංක 9.1.11 ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහනේ සමස්ත මූල්‍ය ප්‍රගතිය 140

වගු අංක 9.1.12 ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය........ 140

වගු අංක 9.1.13 ආයතනික සහාය වැඩසටහනේ එක් එක් ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රගතිය ........ 141

වගු අංක 9.1.14 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන මඟින් අත්කරගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය ........ 141

වගු අංක 9.1.15.1 දේශිය බැංකු දායකත්වය........ 143

වගු අංක 9.2.1 අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතට ගැනෙන ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය ........ 144

වගු අංක 9.2.2. මහාමාර්ග සංවර්ධන ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය ........ 146

වගු අංක 9.2.4 පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන ........ 148

## රූප සටහන්

රූපසටහන 4.1.1 මාර්ගයන්හි මතුපිට පෘෂ්ඨීය වර්ගීකරණය පිළිබඳ ප්‍රකාශාත්මක නිරූපණය......... 53

රූපසටහන 4.2.1 2018 වර්ෂයේ වැලි මුද්‍රිත තාර ආලේපනය කර නැවත සකසන ලද දුර ප්‍රමාණය.. 56

රූපසටහන 4.5.1 සිවිල් වැඩ ඉලක්ක අත්පත් කර ගැනීම........................................................... 61

රූපසටහන 4.5.2 උපයෝගිතා හුවමාරුව කිරීම හා ඉඩම් අත්පත් කර ගැනීම් හි ඉලක්කගත අත්පත් කර ගැනීම........................................................................................................................ 61

රූපසටහන 4.9.1 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂයේ භෞතික ඉලක්ක අත්පත් කර ගැනීම........................................................................................................................ 68

රූපසටහන 4.11.1 2018 වර්ෂයේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව අයිතම අංක 06,07, සහ අදියර II හි අයිතම අංක 11 සඳහා භෞතික ඉලක්ක අත්පත් කර ගැනීමේ ප්‍රගතිය........................ 72

රූපසටහන 6.0 ජාතික මහාමාර්ග ජාලයෙහි පිහිටි පාලම් පිළිබඳ සාරාංශගත තොරතුරු................. 102

රූපසටහන 6.7.1 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳූ කල කොන්ත්‍රාත් පැකේජ 1 සහ කොන්ත්‍රාත් පැකේජ II සඳහා භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය....................................... 112

රූපසටහන 6.8.1 2018 වර්ෂයේ දී සිදුකරන ලද පාලම් අධීක්ෂණ ක්‍රියාකාරකම් ඉලක්ක සපුරා ගැනීම් පිළිබඳ තොරතුරු.................................................................................................................... 114

රූපසටහන 8.1 2018 වර්ෂය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහනේ භෞතික ඉලක්ක සපුරා ගැනිමේ ප්‍රගතිය........................................................................................................... 125

රූපසටහන 9.1.1 සමස්ත මූල්‍ය ප්‍රගතිය - මහාමාර්ග අංශය....................................................... 127

රූපසටහන 9.1.2 මහාමාර්ග අංශය සඳහා 2018 වර්ෂයේ වෙන් කරන ලද සංශෝධිත අයවැය ප්‍රතිපාදන සංයුතිය............................................................................................................. 128

රූපසටහන 9.1..3.1 2018 වර්ෂයේ ව්‍යාපාති වශයෙන් දේශීය බැංකු ණය ආධාර දායකත්වය......... 142

රූපසටහන 9.1..3.2 මාර්ග සංවර්ධන ව්‍යාපාති සඳහා දේශීය බැංකු ණය ආධාර දායකත්වය.......... 143

## ඇමුණුම්


ඇමුණුම01 රුවන්පුර අධිවේගී මාර්ගය දැක්වෙන සිතියම.................................................. 153

ඇමුණුම02 කෝකිලායි පාලමෙහි පිහිටීම දැක්වෙන සිතියම ............................................... 154

ඇමුණුම03 ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය................................................................ 155

ඇමුණුම 04 අධිවේගී මාර්ගයන්හි වාහන ධාරිතාවය හා ආදායම.......................................... 156

ඇමුණුම 05 පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර III දැක්වෙන සිතියම ..................... 158

ඇමුණුම06 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ අදියරයන් දැක්වෙන සිතියම......................159

ඇමුණුම07 දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය......................................................... 163

ඇමුණුම08 ශ්‍රී ලංකාවේ නිම කරන ලද හා දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග ව්‍යාපෘති.. 164

ඇමුණුම09 බදුල්ල-චෙන්කලාඩි මාර්ග වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතියෙහි සිතියම................ 165

ඇමුණුම10 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 3-
අදියර 1.........................................................................................................166

ඇමුණුම11 රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන
මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති.............................................................. 168

ඇමුණුම 12 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 3 – අදියර II..... 171

ඇමුණුම 13 **මධ්‍යම හා ඌව පළාත් වල මාර්ග හා පාලම් *පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ* ව්‍යාපෘතියට අයත් මාර්ග හා පාලම් ලැයිස්තුව**................................................................... 172

ඇමුණුම 14 **පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම....................** 173

ඇමුණුම 15 ප්‍රා දේශීය පාලම් ව්‍යෘපෘතිය (අදියර II)........................................................ 176

ඇමුණුම 16 ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය................ 183

ඇමුණුම 17 ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය................. 185

ඇමුණුම 18 ජාතික මහාමාර්ග ජාලයේ නායයෑමේ ව්‍යවසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියේ **සිවිල්වැඩ ක්‍රියාකාරකම් පැකේජ** 187

ඇමුණුම 19 2007 -2018 දක්වා මහාමාර්ග අංශය සඳහා සිදු කරන ලද ආයෝජනය……….. 188

ඇමුණුම 20 **2011 සිට 2018/12/31 දක්වා දේශීය බැංකු ණය උපයෝජනය (ව්‍යාපෘති වශයෙන්) ....................................................................................................** 189

ඡායාරූප


I. පිටත වටරවුම් අධිවේගී මාර්ගය - කොට්ටාව සිට කඩවත දක්වා දීර්ඝ කිරීම............... 43

II. කි.මී. 0+ 915 ඉදිරියට ඇති පලමු කුළුණ............................................................ 46

III. 6 වන කිලෝමීටරයේ ඉවුරු ඉදි කිරිම.................................................................. 46

IV. බොරළු ස්ථරයක් යොදා මෘදු බිම් සැකසීම............................................................ 47

V. කුළුණ ඉදි කිරිම සඳහා සිදුරු සැකසිම 18............................................................. 47

VI. මාර්ගයේ කැණීම් කටයුතු සිදුකිරිම 58+530 -58+770............................................. 48

VII. ඒබිසී ඇතිරීම සහ කුළුණ උපයෝගී කර ගැනීම...................................................... 48

VIII. වලවේ පාලම ඉදි කිරීම......................................................................................... 50

IX. අන්තර් හුවමාරු ඉදිකිරීම....................................................................................... 51

X. පස්සර 152+240 මාර්ග කොටසේ මාර්ග දෙපස ඇස්පෝල්ට් තාර දැමීම.................. 62

XI. බදුල්ල 135+170-138+320 මාර්ග කොටසේ ඒබීසී තාර ඇතිරීම සහ මූලික වැඩ කටයුතු......................................................................................................... 62

XII. දෙහිඕවිට - දැරණියගල -නූරි මාර්ගයේ කොටස........................................................ 65

XIII. තඹලගමුව -කින්නියා මාර්ග කොටස........................................................................ 65

XIV. ඇහැලියගොඩ- දෙහිඕවිට මාර්ග කොටස.................................................................. 70

XV. පේරාදෙණි බදුල්ල-වෙන්කලාඩි මාර්ගයේ 0+ 390 හි වම් ඉවුර සැකසීම.................... 70

XVI. පාදම සකස් කිරිම( 11+ 090) ................................................................................ 73

XVII. ගල් අතුරා පිරවීම( 2+ 130)..................................................................................... 73

XVIII. හමන්නාපහුව -බරම්පොළ මාර්ගය........................................................................... 75

XIX. පදුගමුව-බිබිළදෙණිය - තල්ගහපොත්ත මාර්ගය....................................................... 75

XX. කැස්බෑව - පොකුණුවිට මාර්ගය............................................................................... 77

XXI. දක්ෂිණ අධිවේගී මාර්ගය - මාදුරුගොඩ මාර්ගය......................................................... 77

XXII. කුඩල්ගොඩ-සීලරතන මාවත.................................................................................... 80

XXIII. පහල මාරගහවැව - කටුපතුවැව මාවත........................................................................ 80

XXIV. ලුණුගම්වෙහෙර - කතරගම මාර්ගයේ කි.මී.12 + 766 නිම කරන ලද පාලම.................. 83

XXV. ලුණුගම්වෙහෙර - කතරගම මාර්ගයේ නිම කරන ලද කොටස........................................ 83

XXVI. හීන්නාරංදෙණිය මංසන්ධියෙ හි සිට අඩුවිට -ඇල්පිටිය මාර්ගය දක්වා සහ ඇල්පිටිය ගඟ සිට වැලිගම මංසන්දිය දක්වා වු මාර්ග කොටස................................................. 86

XXVII. එරමුදුලියද්ද - කොළුවැව - තිස්මැද මාර්ගය................................................................ 86

XXVIII. ඇස්වත්ත - රත්වල මාර්ගයෙහි කැළණි ගග හරහා ඉදි කරන ලද පාලම..........................106

XXIX. සල්ගස් හන්දිය ගං ඉවුර මාර්ගයෙහි සමඟ සම්බන්ධිත ගල්ඔය හරහා ඉදි කරන ලද පාලම..106

XXX. බඩල්කුඹුර - බුත්තල සෙල්ල කතරගම මාර්ගයෙ ඉදි කරන ලද පාලම............................ 109

XXXI. පේරාදෙණි බදුල්ල-චෙන්කලාඩි මාර්ගයේ ඉදි කරන ලද නො.194/1 පාලම.................109
XXXII. බී 403 මාර්ගයේ ඉදි කරන ලද අංක 21/1 අරිප්පු පාලම..............................................111
XXXIII. ඒ 032 මාර්ගය ඉදිකරන ලද අංක 39/2 මන්ඩායිකල්ලාර් පාලම ................................111
XXXIV. තට්ටුතුරෙ පාලම..............................................................................................115
XXXV. පොල්ගහවෙල - ගනේමුල්ල - රාජගිරිය ගුවන් පාලම්................................................119
XXXVI. ඒ 005 මාර්ගයේ බදුල්ල පුදේශයේ ඉදිකරන ලද නිර්මිතයන් හි පැතිකඩ.................... 122
XXXVII. ඒ 004 මාර්ගයේ වල්හපුතැන්න් ප්‍රදේශයේ ඉදි කර ලද නිර්මිතයන් හි ඉදිරි පෙනුම.......122
XXXVIII. වවුනියාව - දකුණු වව්නියාව මනිපුරම් හන්දිය මාර්ගය...............................................
XXXIX. රත්නපුර - ඒපනායක - දංදෙණිය සිට අඹේතැන්න මාර්ගයෙ හි කොටස....................

## දැක්ම

" කාර්යක්ෂම, ආරක්ෂිත හා නව තාක්ෂණය මත පදනම් වූ මාර්ග ජාලයක් සතු මහාමාර්ග ක්ෂේත්‍රයේ අද්විතීය සේවා සපයන්නා වීම"

## මෙහෙවර

විශේෂඥ දැනුම, අති නවීන තාක්ෂණය සහ රාජ්‍ය සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පුරවැසි අවශ්‍යතාවයන්ට සහ ජාතික සංවර්ධන අභිමතාර්ථයන්ට අනුකූලව මාර්ග ජාලය සංවර්ධනය කර, කළමණාකරණය කිරීම හා සංවර්ධනය කිරීම

# අරමුණු

- ජාතික සංවර්ධන ඉලක්කයන් කෙරෙහි ළඟාවිය හැකි වන පරිදි මහාමාර්ග අංශය සඳහා ජාතික ප්‍රතිපත්ති සැකසීම

- ප්‍රධාන නගර අතර ගමනාගමනය සැපයීම, ආර්ථික මධ්‍යස්ථාන අතර කාර්යක්ෂම සබඳතාවයන් ඇති කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශ වලට ප්‍රවේශය වැඩිදියුණු කිරීම

- තිරසාර සංවර්ධනයට දායකවන ආකාරයට මාර්ග ජාලය උසස් ප්‍රමිතියකින් යුතුව නඩත්තු කිරීම

- කාර්යක්ෂම රථවාහන කළමනාකරණය සඳහා සහ අධිවේගී මාර්ග සඳහා වන පරිගණකගත ප්‍රවාහන මෙහෙයුම් පද්ධතියක් පවත්වා ගෙන යාම

- උසස් මට්ටමේ සේවාවක් සැපයීම සහ පරිශීලක හිතකාමී මාර්ග ඉදිකිරීම සඳහා මහාමාර්ග අංශයේ මානව සම්පත් ධාරිතාවය වැඩිදියුණු කිරීම

- මාර්ග පද්ධතිය ප්‍රවර්ධනය සඳහා දායක වන පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍ර සඳහා ආයොජනය කිරීම

- මාර්ග භාවිතා කරන්නන් සඳහා මාර්ග ආරක්ෂක මිනුම් / මාන වැඩිදියුණු කිරීම

# 1.0 මහාමාර්ග පිළිබඳ හැඳින්වීම

## 1.1 හැඳින්වීම

පසුගිය වසර පහක කාලය තුළ මහාමාර්ග අංශය හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අංශය රටේ ආර්ථික හා සමාජයීය අභිවෘද්ධිය උදෙසා කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත. මෙම දෙඅංශයන් මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. 2018 වර්ෂය තුළදී ජාතික වශයෙන් වැදගත් සංවර්ධන ව්‍යාපෘති රැසක් සාර්ථකව නිම කිරීමට අමාත්‍යාංශය සමත් වී ඇති අතර සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා බලපෑම් ඇති කරලීම සඳහා මෙකී දෙඅංශයෙන්ම නව ව්‍යාපෘති රාශියක් ආරම්භ කිරීමට ද පියවර ගෙන ඇත.

මහාමාර්ග ජාලය රටක වඩාත් ම වටිනාම සහ වඩාත් සුවිශාල වූ සාමාජයීය වත්කමක් ලෙස සැලකෙන අතර එය ආර්ථික, සාමාජයීය, සංස්කෘතිකමය වශයෙන් මෙන්ම පාරිසරික වශයෙන් ද ඉතා වැදගත් වූ අංගයක් ලෙස පිළිගෙන ඇත.ශ්‍රී ලංකාව වර්ග කි.මී. 65610ක වපසරියකින් ද මිලියන 21කට ආසන්න වූ ජනගහණයකින් ද යුක්ත රටක් වන අතර වර්ග කි. මී. ය කි. මී. 1.76 ක මාර්ග ඝනත්වයකින් සමන්විත වේ. ( මහ බැංක වාර්ෂික වාර්තාව - 2018) මාර්ග ඝනත්වය අන්ව බොහෝ දකුණු ආසියානු රයවල් අභිබවා යාමට වත්මන් ශ්‍රී ලංකාවට හැකි ව ඇත. තව ද මාර්ග ප්‍රවාහනය අප රට තුළ පවතින ප්‍රධානත ම ප්‍රවාහන ක්‍රමය වන අතර එය බොහෝ සාධක සැලකීමේ දී දුම්රිය ප්‍රවාහනය අභිබවා මහජන උපයෝගීතාවයට ලක් ව ඇත.

මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග නඩත්තු භාර අරමුදල, මහනැගුම ඉදිකිරීම් සමාගම, මහනැගුම උපදේශන සේවා සමාගම සහ මහනැගුම ඉමල්ෂන් සමාගම මහාමාර්ග අංශය යටතට ගැනෙන ප්‍රධාන ආයතන ලෙස හැඳින්විය හැක. මාර්ග සංවර්ධන අධිකාරිය මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ව්වස්ථාපිත ආයතනයක් වන අතර 1981 අංක 73 දරණ පනත් කෙටුම්පත අනුව එසේ අමාත්‍යාංශය යටතට පවරා ගනු ලැබූ අතර 1986 දී එය මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අනුප්‍රාප්තිකයා බවට පත් විය.

මාර්ග සංවර්ධන අධිකාරිය දිවයිනේ මහාමාර්ග හා සම්බන්ධ ප්‍රමුඛ බලධරයා වන අතර එය ජාතික මහාමාර්ග ජාලයේ නඩත්තව සහ වැඩිදියුණු කිරීමෙහිලා වගකිව යුතු දායකත්වයක් සපයනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය 2018 වසර අවසන් වන විට ආසන්න වශයෙන් කි.මී. 12, 390කින් යුත් වන අතර එය ඒ ශ්‍රේණියේ මහාමාර්ග දුර කි.මී. 4215කින් ද බී ශ්‍රේණියේ මහාමාර්ග දුර ආසන්න වශයෙන් කි.මී. 8005කින් ද අධිවේගී මාර්ග දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 170කින් ද සමන්විත වේ.

මේ අනුව මෙම වාර්තාව මහාමාර්ග හා මාර්ග සංවර්ධන අංශයේ හා එම අංශය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතීන්හි විස්තරාත්මක කාර්යසාධනය දක්වා ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ

මෙන් ම ව්‍යාපෘති කළමනාකරණ ඒකක මගින් ක්‍රියාත්මක කරන ලද ඒ ඒ ව්‍යාපෘතීන්හි කාර්යසාධනයන් ද සවිස්තරාත්මක ව දක්වා ඇත.

## 1.2 අමාත්‍යාංශයේ ක්‍රියාකාරී අංශ

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධානියා වශයෙන් අමාත්‍යාංශ ලේකම් කටයුතු කරන අතර මීට අමතරව තවත් අංශ ප්‍රධානීන් 06 කගේ ප්‍රධානත්වයෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය ක්‍රියාකාරී අංශ 08 කින් යුක්ත වේ.

| | |
|---|---|
| පාලන අංශය | •අතිරේක ලේකම් (පාලන හා මුදල්) |
| ඉඩම් අංශය, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | •අතිරේක ලේකම් (සංවර්ධන) |
| ඉංජිනේරු අංශය , ප්‍රසම්පාදන අංශය | •අතිරේක ලේකම් (ඉංජිනේරු) |
| සැලසුම් හා මෙහෙයුම් අංශය | •ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ |
| ගිණුම් අංශය | •ප්‍රධාන මූල්‍ය නිළධාරි |
| අභ්‍යන්තර විගණන අංශය | •ප්‍රධාන අභ්‍යන්තර විගණක |

## 1.3 කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

**වගු අංක 1.3.1 2018/12/31 ට කාර්ය මණ්ඩල තොරතුරු (මහාමාර්ග අංශය)**

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 1 | ලේකම් | | විශේෂ | 1 | 1 | 0 |
| 2 | රාජ්‍ය ලේකම් | | විශේෂ | 1 | 1 | 0 |
| 3 | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 1 | 1 | 0 |
| 4 | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 1 | 1 | 0 |
| 5 | අතිරේක ලේකම් (ඉංජිනේරු) | ශ්‍රී.ලං.ඉ.සේ. | විශේෂ | 1 | 1 | 0 |
| 6 | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | විශේෂ | 1 | 1 | 0 |
| 7 | අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා ගිණුම් ) | ශ්‍රී.ලං.ග.සේ. | විශේෂ | 1 | 0 | 1 |
| 8 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | I | 1 | 1 | 0 |
| 9 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. | I | 1 | 1 | 0 |
| 10 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | I | 1 | 0 | 1 |

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| 11 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. | I | 1 | 1 | 0 |
| 12 | අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමණාකරන හා ප්‍රසම්පාදන) | ශ්‍රී.ලං.ප.සේ. | I | 1 | 1 | 0 |
| 13 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී.ලං.ඉ.සේ. | I | 1 | 1 | 0 |
| 14 | අධ්‍යක්ෂ (මහනැගුම) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | I | 1 | 1 | 0 |
| 15 | අධ්‍යක්ෂ (සැ. හා මෙ ) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | I | 1 | 1 | 0 |
| 16 | ගණකාධිකාරී (ව්‍යාපෘති) | ශ්‍රී.ලං.ග.සේ. | I | 1 | 0 | 1 |
| 17 | සහකාර ලේකම්(පාලන) | ශ්‍රී.ලං.ප.සේ. | III | 3 | 2 | 1 |
| 18 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | III | 3 | 2 | 1 |
| 19 | සහකාර අධ්‍යක්ෂ (මහනැගුම) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | III | 1 | 1 | 0 |
| 20 | සහකාර අධ්‍යක්ෂ(සැ. හා මෙ) | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | III | 2 | 2 | 0 |
| 21 | සහකාර අධ්‍යක්ෂ(ඉංජිනේරු) | ශ්‍රී.ලං.ඉ.සේ. | III | 3 | 2 | 1 |
| 22 | ඉංජිනේරු(මහනැගුම) | ශ්‍රී.ලං.ඉ.සේ. | III | 1 | 1 | 0 |
| 23 | අමාත්‍යාංශ ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | | 1 | 1 | 0 |
| 24 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. | අධි ශ්‍රේණිය | 1 | 0 | 1 |
| 25 | භාෂා පරිවර්තක | රජයේ භාෂා පරිවර්තක සේවය | II/I | 2 | 1 | 1 |
| 26 | සංවර්ධන සහකාර | | III/II/I | 14 | 7 | 7 |
| 27 | සංවර්ධන නිලධාරි | සංවර්ධන නි.සේ | III/II/I | 180 | 179 | 1 |
| 28 | තාක්ෂණ නිලධාරී | ලං.තා.සේ. | III/II/I | 2 | 0 | 2 |
| 29 | ප්‍රවාහන නිලධාරි | ශ්‍රී.ලං.තා.සේ | III/II/I | 1 | 0 | 1 |
| 30 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | III/II/I | 43 | 40 | 3 |
| 31 | නිශ්චල ඡායාරූප ශිල්පී | තාවකාලික | III/II/I/SPL | 1 | 0 | 1 |
| 32 | කැමරා ක්‍රියාකරු | | III/II/I/SPL | 1 | 0 | 1 |
| 33 | රියදුරු | ඒකාබද්ධ රියදුරු සේවය | III/II/I/SPL | 20 | 18 | 2 |
| 34 | කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | III/II/SPL | 18 | 11 | 7 |
| 35 | කැමරා ක්‍රියාකරු (සහායක) | තාවකාලික | III/II/I/SPL | 1 | 0 | 1 |
| | **එකතුව** | | | **314** | **281** | **33** |

වගු අංක 1.3.2 2018/12/31 ට කාර්ය මණ්ඩල වෙනස්වීම්

| තනතුර | සේවා ශ්‍රේණිය | වැටුප් පරිමාණය | අනුමත කාර්යමණ්ඩලය | ඇතුලත්වීම් | | | ඉවත්වීම් | | | වෙනස්වීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | නව පත්වීම් | ස්ථාන මාරුවීම් | උසස්වීම් | ස්ථාන මාරු | විශ්‍රාම යෑම | සේවය හැරයාම | |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | I | SPL | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු) | I | SL-1 2016 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| ගණකාධිකාරී (ව්‍යාපෘති) | I | SL-1 2016 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| සහකාර ලේකම් (ඉංජිනේරු) | III | SL-1 2016 | 3 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| පරිපාලන නිලධාරී | අධි ශ්‍රේණිය | MN-7 2016 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| සංවර්ධන සහකාර | III | MN-4 2016 | 14 | 0 | 0 | 0 | 6 | 0 | 0 | 6 |
| සංවර්ධන නිලධාරී | II/III | MN-4 2016 | 180 | 0 | 0 | 0 | 26 | 0 | 0 | 26 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | I/II/III | MN-2 2016 | 43 | 0 | 8 | 0 | 11 | 0 | 0 | 19 |
| රියදුරු | I/II/III | PL-3 2016 | 20 | 0 | 6 | 0 | 2 | 0 | 0 | 8 |
| කාර්යාල කාර්ය සහායක | I/II/III | PL-3 2016 | 18 | 0 | 2 | 0 | 0 | 3 | 0 | 5 |

## 1.4 ආංශික කාර්යසාධනය

### 1.4.1 පාලන අංශය

මහාමාර්ග පද්ධතිය සංවර්ධනය කර කළමනාකරණය කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මහාමාර්ග අමාත්‍යාංශය මඟින් ඉටු කරනු ලබන කාර්යයන්හි ගුණාත්මකභාවය නංවාලීම හා පවත්වාගැනීම සඳහා අවශ්‍ය භෞතික පරිසරය නිර්මාණය කිරීම, අඛණ්ඩ සහා ඵලදායි ආකාරයෙන් සේවා සැපයීම, අනෙකුත් ආයතන සමඟ විධිමත් සම්බන්ධීකරණයක් ඇති කිරීම, පවත්වාගැනීම හා මහාමාර්ග අංශයේ සමස්ත පරිපාලනය හා මෙහෙයවීම පාලන අංශය මඟින් සිදුකරනු ලැබේ.

**පාලන අංශයේ කාර්යභාර්ය**

- අමාත්‍යාංශයේ යටිතල පහසුකම් කාර්යක්ෂම සහ සඵලදායී ආකාරයට සැලසීම, ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර හා නඩත්තු සම්බන්ධයෙන් අදාළ ආයතනයන්ගෙන් සේවා ලබාගැනීම සහ පවත්වා ගැනීම.
- දෛනිකව අමාත්‍යාංශය වෙත ලැබෙන සහ බැහැර යැවෙන ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ එහි සාධනීයබව සහතික කිරීම.
- අමාත්‍යාංශයේ ආරක්ෂක කටයුතු සහ පවිත්‍රතා කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ රාජකාරී දුරකතන බිල්පත් පියවීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහ මාර්ග සංවර්ධන අධිකාරියෙන් අනුයුක්ත කර ඇති නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම.
- අමාත්‍යාංශ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම,අමාත්‍යාංශයේ සියලු වාහන ලියාපදිංචි කිරීම, නඩත්තු කිරීම, රක්ෂණය කිරීම, ආදායම් බලපත්‍ර ලබාගැනීම හා සියලු සංචිත වාහන සඳහා ඉන්ධන සැපයීම.
- වාහන අනතුරු සම්බන්ධයෙන් පියවර ගැනීම හා අදාල අනතුර සඳහා රක්ෂණ වන්දි නිසි පරිදි ලබා ගැනීම.
- මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ නිලධාරීන්ගේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ විදේශ සංචාර සම්බන්ධ විදේශ ගමන් බලපත්‍ර, වීසා, ගමන් වියදම් හා දීමනා ලබාදීම පිළිබඳ කටයුතු හා දිවයිනෙන් බැහැරයාම සඳහා අවසර ගැනීමේ කටයුතු ඉටු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ නිවාඩු, අතිකාල හා ගමන් වියදම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- අමාත්‍යාංශ නිලධාරීන් සඳහා ආපදා ණය, දේපල ණය, යතුරුපැදි ණය, උත්සව අත්තිකාරම් ලබාදීම සම්බන්ධ කටයුතු සහ අග්‍රහාර රක්ෂණ ඉල්ලුම් කිරීම සම්බන්ධ කටයුතු කිරීම.
- අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම හා තීරණ අදාල පාර්ශව වෙත දැන්වීම.

- පාර්ලිමේන්තු ප්‍රශ්න, උපදේශක කාරක සභා යෝජනා, මහජන පෙත්සම්, මානව හිමිකම් කඩවීම් හා ජනාධිපති කාර්යාලය හා විවිධ පාර්ශවයන්ගෙන් ලැබෙන පැමිණිලි, යෝජනා හා ඉල්ලීම් සඳහා සුදුසු පියවර ගැනීම.
- ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම් සහ අමාත්‍යාංශ මාණ්ඩලික නිලධාරීන්ගේ රාජකාරී ගමන් වලදී නවාතැන් පහසුකම් වෙන් කිරීම සහ බිල්පත් නිරවුල් කිරීම.
- අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන් සඳහා අත්තිකාරම් ලබාදීම, අත්තිකාරම් පියවීම, ලේඛනගත කිරීම හා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම, සුළු නඩත්තු කටයුතු සහ විවිධ සුළු මුදල් ගෙවීම් සම්බන්ධ සුළු මුදල් අග්‍රිම ලබාගැනීම හා පියවීම.
- කණිෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් දීමනා අනුමත කිරීම, භාෂා පරිවර්තන වෙනුවෙන් ගෙවීම් නිරවුල් කිරීම, ගෙවල් කුලී දීමනා අනුමත කිරීම, අමාත්‍යාංශ නිලධාරීන්ගේ සංග්‍රහ වියදම්, විවිධ වියදම් ප්‍රතිපූර්ණය කිරීම හා වියදම් නිරවුල් කිරීම.
- ජනාධිපතිවරණය, මහමැතිවරණය, පළාත්සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ ඇතුළු ඡන්ද විමසීම් වලට අදාළ මැතිවරණ චක්‍රලේඛ අදාළ පාර්ශව වෙත දැනුම් දීම, එම මැතිවරණ වලට අදාලව තැපැල් ඡන්දය දීම සම්බන්ධීකරණය සහ මැතිවරණ රාජකාරී සඳහා නිලධාරීන් පත්කිරීමේ කටයුතු සහ මැතිවරණ රාජකාරී වෙනුවෙන් ගෙවීම් නිරවුල් කිරීමේ කටයුතු.
- පාලන අංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වාගෙන යාම සහ අංශයට අදාල ලිපි ද්‍රව්‍ය ඉල්ලුම් කිරීම, භාර ගැනීම හා බෙදා හැරීම.
- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් රජයේ ආයතන වලින් ලැබෙන චක්‍රලේඛ හා නියෝග වෙන් වෙන් වශයෙන් ගොනු කිරීම හා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- සිංහල - ඉංග්‍රීසි සහ ඉංග්‍රීසි - සිංහල භාෂා පරිවර්තන කටයුතු, අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘතිවල නව පත්කිරීම්, සේවා දීර්ඝ කිරීම, නිවාඩු අනුමත කිරීම ඇතුළු ආයතනික කටයුතු

**2018 වර්ෂය තුළ ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ ඇගයීම**

- කාර්යක්ෂම, ඵලදායී රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය භෞතික වටපිටාව සකස් කිරීම.
- නිරතුරුවම මහජනතාව වෙනුවෙන් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමට ඇපකැප වීම.
- ජාතික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අමාත්‍යාංශයේ ඉටුවිය යුතු කාර්යයන් වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව ඉටුකිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම.

- නව්‍ය කාර්යාල කළමනාකරණ සංකල්ප අත්හදා බැලීම, ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීම සහ භාවිත කිරීම.
- රාජ්‍ය සේවයේ ගුණාත්මක අභිවර්ධනය සහ විනිවිද පෙනෙනා සේවා සම්පාදනයක් උදෙසා තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම.

**ඵලදායිතා වර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග හා ප්‍රගතිය**

- කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් සිදුකිරීම.
- විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් ලබාදීම සඳහා අවශ්‍යවන්නාවූ කාර්යක්ෂම හා ඵලදායී ලෙස සේවය කළහැකි කාර්ය මණ්ඩලයක් බිහිකිරීම සඳහා සියලු කාර්ය මණ්ඩලය ඇතුලත් වන පරිදි ආයතනික ඵලදායීතාවය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය පිළිබඳ පුහුණු පැවැත්වීම, අභ්‍යන්තර පරිපාලනය විධිමත් කිරීම.
- මෙම අමාත්‍යාංශයේ නව ලේඛනාගාරයක් ස්ථාපනය කර එහි ලිපිගොනු ක්‍රමානුකූලව සොයා ගැනීමට පහසු වන පරිදි පවත්වා ගෙන යාම, ස්ථාන ,ගමන් මාර්ග හඳුනා ගැනීම් සහිත පුවරු ප්‍රදර්ශනය කිරීමට පියවර ගැනිම

## සංවිධාන සටහන



අතිරේක ලේකම් (පාලන හා මුදල්)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ (ව්‍යා. කළ. හා ප්‍රසම්.)
සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (ව්‍යාපෘති කළමණාකරන හා ප්‍රසම්)
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්තක
භාෂා පරිවර්තක
ප්‍ර.කළම.සහකාර (පාලන)
සංවර්ධන නිලධාරී (මා.සං.අ. නිලධාරීන්)160
සංවර්ධන නිලධාරී (තො.මධ්‍ය.) (6)
මෙහෙයුම් සහකාර (1)
මානව සම්පත් සහකාර (4)
සංවර්ධන නිලධාරී (13)
ප්‍රසම්පාදන සහකාර (2)
සංවර්ධන නිලධාරී (2)
කළමනාකරණ සහකාර (13)
නිශ්චල ඡායාරූප ශිල්පී (1)
වීඩියෝ කැමරාකරු(1)
කළමණාකරන සහකාර(2)
රියදුරු 7 (7)
රියදුරු1)
කා.කා.ස-
දුරකථන ක්‍රියාකරු (1)
කැමරා සහකාර (1)
කා.කා.ස 1

### 1.4.2 ගිණුම් අංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත වාර්ෂික අයවැය මඟින් වෙන්කෙරෙන ප්‍රතිපාදන හැසිරවීම, මෙහෙයවීම හා පාලනය කිරිමේ වගකීම ගිණුම් අංශය වෙත පැවරී ඇත. මෙලෙස වෙන් කෙරුණු ප්‍රතිපාදන කළමණාකරණය කිරීමත්, මෙම ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව යෙදවීම තුලින් උපරිම ආර්ථික ප්‍රතිලාභ රජයට ලබාදීම මෙම අංශයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකිය හැක. මෙම අංශය මාර්ග සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය මහාභාණ්ඩාගාරය අතර සම්බන්ධීකරණ කාර්යයේ නියැලෙමින් ව්‍යාපෘති සඳහා අයවැය අරමුදල් ක්‍රමවත්ව උපයෝජනය කිරීම සඳහා කටයුතු කිරීම සිදුකරයි. මේ හැරුණු කොට උපයෝජිත අරමුදල් තුලින් මුල්‍යමය කාර්යසාධනයත් ඊට සමගාමීව සිදුකරණ ලද වැය බරත් නිරීක්ෂණය කොට අංශයේ මුල්‍යමය තත්වය වාර්තා කිරීමත් සිදුකරනු ලබයි.

මෙම අංශය විසින් මූලික එහෙත් වැදගත් ඉලක්කයන් සපුරාලමින් අමාත්‍යාංශය වෙත පැවරුණු කාර්යයන් වාර්ෂික අයවැය සීමාවන් තුල පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත. 2018 වර්ෂයේ දී මෙම අංශය මඟින් ව්‍යාපෘති ගිණුම් වාර්තා සහ මාර්ග සංවර්ධන අධිකාරියේ 2016 විසර්ජන ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට පෙර ලබාදීමට හැකිවිය.'අත්තිකාරම් බී ගිණුම' අවසන් වාර්තාව ද මෙලෙස පූර්ව සඳහන් කාලවකවානුව තුල ලබාදීමට හැකිවිය.

තවද උසස් අධ්‍යාපන හා මහාමාර්ග අංශ සඳහා වූ මාසික වියදම සාරාංශගත කර නියමිත දිනට මහාභාණ්ඩාගාරය වෙත ලබාදී ඇති අතර 2018 වර්ෂයේ වාර්ෂික විශ්ලේෂණ මණ්ඩලය එම කාර්යය නියමිත ලෙස සිදුකරඇත. අංශය සතු ක්‍රියාකාරකම් සහ සෑම උපලේඛනයක්ම වඩාත් යෝග්‍ය ලෙස හා හැකි උපරිමයෙන් ඉටුකර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන අංශයක් ලෙස ගිණුම් අංශය හැඳින්විය හැක. මේ හැරුණු කොට අංශය තුල සිදුකරනු ලබන දෛනික කාර්යයන් නිරතුරුවම සේවකයන් අතර හුවමාරු කිරීම, සේවකයන්ගේ දක්ෂතාවයන් ඔප්නැංවීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ සේවක සුභසාධන කළමනාකරණය කිරීම මඟින් 2018 වර්ෂය තුල වඩාත් තෘප්තිමත් සේවාවක් සැපයීමට හැකි වී ඇත.

**සංවිධාන සටහන**



ප්‍රධාන මූල්‍ය නිලධාරී
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී (ව්‍යාපෘති)
ගණකාධිකාරී (3)
අයවැය සහකාර (1)
මූල්‍ය සහකාර (15)
සංවර්ධන නිලධාරී (11)
කළමනාකරණ සහකාර (10)
රියදුරු (2)
කා.කා.ස. (3)

### 1.4.3 ප්‍රසම්පාදන අංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රසම්පාදන අංශය එවකට පැවති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ මග පෙන්වීම මත පිහිටවනු ලැබීය. ඒ අනුව මෙම අමාත්‍යාංශය යටතේ පවතින මාර්ග සංවර්ධන අධිකාරිය හා ඊට අයත් ව්‍යාපෘති මගින් කරනු ලබන අමාත්‍ය මණ්ඩල හා අමාත්‍යාංශ මට්ටමේ අනුමැතිය ඇතිව සිදුකළ යුතු වූ සියලුම ටෙන්ඩර් කටයුතු සඳහා පහසුකම් සපයන පාර්ශවය ලෙස ක්‍රියා කරමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දායකත්වය දැක්වීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින එම ව්‍යාපෘති මගින් වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කර මෙම අංශය වෙත එවනු ලබන අතර මෙම අංශය මගින් එම සියලුම දත්ත සම්බන්ධිකරණය කර සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම පිළියෙල කරනු ලබයි.එසේ පිළියෙල කරනු ලබන සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත මූලිකවම යවනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී වෙනත් රේඛීය අමාත්‍යාංශ, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය ආදී ආයතන වෙත ද, යැවීමට මෙම අංශය මගින් කටයුතු කරනු ලබයි.

මෙම අංශයේ මානව සම්පත් දායකත්වය ප්‍රසම්පාදන විශේෂඥ තනතුරු එකකින් ද, ප්‍රසම්පාදන සහකාර තනතුරු එකකින් ද, සංවර්ධන නිළධාරි තනතුරු තුනකින් ද, කළමණාකරණ සහකාර තනතුරු දෙකකින් ද, කාර්යාල කාර්යය සහයක තනතුරු එකකින් ද සමන්විත වේ.

**2018 වර්ෂය තුළ ප්‍රසම්පාදන අංශය මුහුණපා ඇති ගැටළු හා අභියෝග.**

අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී පහත ගැටළු හා අභියෝගයන් හඳුනාගෙන ඇත.

- මූලික සැලසුම් හා සම්බන්ධ ප්‍රමාණ බිල්පත් සකස් කිරීමේ දී ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳ සහතික වීමක් නොමැති බැවින් ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ දී ඒවායේ පිරිවැය බලාපොරොත්තු නොවූ ලෙස ඉහළයාම.
- සැලසුම් සැදීම, ප්‍රමාණ බිල්පත් සකස් කිරීම, ඉඩම් අත්පත් කරගැනීම හා පාරිසරික අධ්‍යන ආදී ප්‍රසම්පාදන පෙර සූදානම්වීමේ කටයුතු, ඇගයීම් කමිටු පත් කිරීමට ප්‍රථම අවසන් කළ යුතුය.
- ව්‍යාපෘති ආරම්භ කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතීන්හි විෂය පථය වෙනස් කිරීම හා සම්පූර්ණයෙන්ම නව අංගයන් ප්‍රසම්පාදන සැලැස්මට එකතු කිරීම.
- කාර්යය මණ්ඩලවල ප්‍රසම්පාදන සම්බන්ධ දැනුම හිඟවීම. (මෙය ශක්‍යතා ගොඩනැගීමේ වැඩසටහන් මගින් විසඳාලිය හැක.)
- ලංසු පත්‍රිකා අඩුපාඩු සහිතවීම / ප්‍රසම්පාදන කාලරාමුවට අදාල නොවන ලෙස ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ප්‍රමාදවීම.

**ප්‍රසම්පාදන අංශයේ ප්‍රධාන කාර්යභාරයන්**

මෙම අංශයේ කාර්යභාරය පහත දැක්වෙන පරිදි සාරාංශ කර ඉදිරිපත් කළ හැක.

1. අමාත්‍යාංශයේ වෙනත් අංශ වලින් ද තොරතුරු ලබා ගෙන මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පවතින ව්‍යාපෘති වලින් වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ද ලබා ගෙන අමාත්‍යාංශයට අදාළ සමස්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කිරීම.
2. මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ සහය ඇතිව මෙම අමාත්‍යාංශයට අදාල ව අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ සිදුකළ යුතු ටෙන්ඩර් කටයුතු සඳහා ස්ථාවර ප්‍රසම්පාදන කමිටු(SCAPC) ,සාකච්ඡා සම්මුති කමිටු (CANC),උපදේශක ප්‍රසම්පාදන කමිටු (CACPC) සහ ඒ සඳහා සහය දක්වන තාක්ෂණික ඇගයීම් කමිටු (TEC)සහ ව්‍යාපෘති කමිටු පත් කර ගැනිමට අදාල කටයුතු කිරීම.
3. අමාත්‍යාංශයට අදාල අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු (MPC), දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC), ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු (PPC) පත් කිරීම හා ඒවාට අදාල තාක්ෂණික ඇගයීම කමිටු (TEC)පත් කිරීම සහ එම මට්ටමේ උපදේශක ප්‍රසම්පාදන කමිටු (CPCM) පත් කිරීමට අදාල කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ඇතිව සිදු කිරීම.
4. තාක්ෂණික ඇගයීම කමිටු සඳහා වෙනත් අමාත්‍යාංශවල සුදුසුකම් ලත් නිළධාරීන් පත්කර ගැනීමේ කටයුතු සිදු කිරිම.
5. ප්‍රසම්පාදන කටයුතු හා සම්බන්ධ ලේඛන අනුමත කිරීම, පරිපූරක ලේඛන නිකුත් කිරීම, කොන්ත්‍රාත් ප්‍රදානය හා විචලතා අනුමත කිරීම සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු හා අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු රැස්වීම් සංවිධානය කිරිම හා එහි දි ගනු ලබන තීරණ පිළිබඳ වාර්තා තබා ගැනිම.
6. සියලු ම ප්‍රසම්පාදන කටයුතුවලට අදාල ව අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දීම.
7. සාර්ථක නොවූ කොන්ත්‍රාත්කරුවන්ගේ අභියාචනා ලැබුණු විට ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩල හා සහයෝගයෙන් කටයුතු කිරිම.
8. වාර්ෂික, කාර්තුමය හා මාසික වශයෙන් ප්‍රසම්පාදන ප්‍රගති වාර්තා සකස් කිරීම හා ඒවා භාණ්ඩාගාරයේ ඇති ප්‍රසම්පාදන අධීක්ෂණ ඒකකය වෙත ඉදිරිපත් කිරීම.
9. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව හා සහයෝගයෙන් කටයුතු කිරීම හා අවශ්‍ය විටෙක ඉල්ලුම් කරනු ලබන තොරතුරු සැපයීම.
10. කලින් කලට අනෙකුත් පාර්ශවකාර සංවිධාන මඟින් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව පවත්වනු ලබන රැස්වීම සඳහා සහභාගී වීම.
11. අමාත්‍යාංශයේ හෝ මාර්ග සංවර්ධන අධිකාරියේ සේවක මණ්ඩල සඳහා කලින් කලට අවශ්‍ය පුහුණු ව්‍යාපෘති සංවිධානය කිරීම.

### 1.4.4 සංවර්ධන අංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ සංවර්ධන අංශය, ඉඩම් සහ ග්‍රාමීය මාර්ග සංවර්ධන ලෙස අංශ 02 කට බෙදා දැක්විය හැකිය.

## සංවිධාන සටහන



අතිරේක ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ (මහනැගුම )
ජ්‍යෙ. සහකාර ලේකම් (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ
ඉංජිනේරු
සහකාර ලේකම් (සංවර්ධන)
මෙහෙයුම් සහකාර (11)
සැලසුම් සහකාර (2)
සංවර්ධන නිලධාරීන් (8)
සංවර්ධන නිලධාරීන් (5)
තාක්ෂණික නිලධාරී
කළමණාකරන සහකාර (5)
රියදුරු (2)
කා.කා.ස (3)

### 1.4.5 ඉඩම් අංශය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මහාමාර්ග අංශයේ ඉඩම් අංශය නව ව්‍යාපෘති ඉදිකිරීමේදී හා පුනරුත්ථාපනය කිරීමේදී අවශ්‍ය වන ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු හා ඒ සම්බන්ධ ක්‍රියාවලිය හා බැඳී සිටින ආයතන හා පුද්ගලයින් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම සහ ඒ හා අදාළ සියලු කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා වගකිවයුතු අංශයක් ලෙස හැඳින්විය හැක. මෙම අංශය මඟින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත පරිදි දැක්විය හැක.

**2018 වර්ෂය තුළ අංශයේ ප්‍රධාන කාර්යභාරයන්**

- නව මාර්ග ව්‍යාපෘති සහ මාර්ග සංවර්ධන කටයුතු වලට අදාල ඉඩම් අත්කර ගැනීම සඳහා, ඉඩම් අත්කරගැනීමේ පනතේ 2 වන වගන්තියට අනුව අත්පත් යෝජනා සහ 38(අ) අතුරු විධානය යටතේ කඩිනමින් භුක්තිය භාරගැනීමට අදාල ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
- අත්කරගත් ඉඩම් වලට අදාල ඉදිරි කටයුතු ඉඩම් අත්කරගරනීමේ පනතට අනුව සිදුකිරීම.
- අත්කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- ඉඩම් අත්කරගැනීම් හා වන්දි ගෙවීමට අදාල කාර්යයන් ඉටුකිරීමේදී ඉඩම් අමාත්‍යාංශය, මාර්ග ව්‍යාපෘති, තක්සේරු දෙපාර්තමේන්තුව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රජයේ මුද්‍රණාලය වැනි ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන සිදුකිරීම.
- ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ විශේෂ කමිටු පැවැත්වීම, කමිටු තීරණ සැකසීම හා කමිටු තීරණ දැනුම්දීම ඇතුළු කාර්යයන් ඉටුකිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, පාර්ලිමේන්තු කාරක සභා ආදී ආයතන මඟින් විමසනු ලබන කරුණු සඳහා වාර්තා ඉදිරිපත් කිරීම.
- මහජන දුක් ගැනවිලි විසඳීමට සහය වීම.
- මාර්ග අළුතින් ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීමේ කටයුතු වලදි ඉඩම් අත්කරගැනීම නිසා අවතැන් වන පිරිස් ප්‍රතිස්ථානගත කිරීම සඳහා ඉඩම් මිලදී ගැනීමට, ඉඩම් මිලදී ගැනිමේ කමිටුව මඟින් කටයුතු කිරීම.
- ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කරගත් එහෙත් මාර්ග සංවර්ධන කටයුතු වලට අවශ්‍ය නොවන බව හඳුනාගත් ඉඩම් සඳහා,ඉඩම් අත්කරගැනීමේ පනතේ 39 (1)

වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට සහ 39 (අ) (1) වගන්තිය යටතේ අවසතු කිරීමට අදාලව ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ ආඥාවක් නිකුත් කිරීමෙන් අනතුරුව මාර්ග සංවර්ධන කටයුතු වලට අවශ්‍ය නොවන බව හඳුනාගත් ඉඩම් සඳහා, ඉඩම් අත්කරගැනීමේ පනතේ 50 වන වගන්තිය යටතේ අත්හැරීම සඳහා වන නිර්දේශ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

**භෞතික ප්‍රගතිය**

- ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්පත් යෝජනා 90 ක් ඉඩම් හා පාර්ලිමේන්තු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ කඩිනමින් භුක්තිය භාර ගැනීම සඳහා ,ගරු අමාත්‍යතුමාගේ නිරිදේශ 61 ක් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථානගත කිරීමේ කමිටු 56 ක් පවත්වා ඇති අතර එම කමිටු වල දී ඉඩම් කැබලි 779 කට අදාලව සාකච්ජා කර තීරණ ලබා දී ඇත.
- ඉඩම් අත්කරගැනීමේ පනතේ 39 (1) වගන්තිය යටතේ අවසතු කිරිමට අදාල ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ 12 ක් සහ 50 වන වගන්තිය යටතේ වන අත්හැරීම සඳහා වන නිර්දේශ 12 ක් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- මාර්ග සංවර්ධන කටයුතු නිසා අවතැන් වන පිරිස් ප්‍රතිස්ථානගත කිරීමට, නව ඉඩම් මිලදී ගැනීම සඳහා , ඉඩම් මිලදී ගැනීමේ කමිටු 06 ක් පවත්වා ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලයෙන් එවන ලද මහජන ගැටළු 47 ක් සඳහා පිළිතුරු ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යවා ඇත.
- මහජනතාව විසින් සෘජුව ඉදිරිපත් කරනු ලබන ගැටළු 725 කට අදාලව පිළිතුරු ලබා දී ඇත.

### 1.4.6 (මගනැගුම) ග්‍රාමීය මාර්ග සංවර්ධන අංශය

2004 වර්ෂයේ ආරම්භ වූ මෙම අංශය 2005 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රුපියල් මිලියන 500 ක ප්‍රතිපාදන සමඟින් දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන සේ විධිමත් ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වීම ආරම්භ විය.

වර්තමානයේ දී උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ එක් ඒකකයක් වන මෙම අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන), අධ්‍යක්ෂ (මගනැගුම), සහකාර අධ්‍යක්ෂ (මගනැගුම), ඉංජිනේරු, සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) යන මාණ්ඩලික නිලධාරීගෙන් හා උපාධිධාරි යෝජනා ක්‍රමවලින් බඳවා ගන්නා ලද සැලසුම් සහකාර, වැඩසටහන් සහකාර, සංවර්ධන නිලධාරී හා රාජ්‍ය කලමනාකරණ සහකාර, ලිපිකරු (මාර්ග සංවර්ධන අධිකාරිය), කාර්යාල කාර්ය සහායකයින් සහිතව කණ්ඩායමක් සේවය කරති.

- වාර්ෂික වැඩ සැලැස්ම හා චක්‍රලේඛ සකස් කිරීම
- අදාල සැලැස්ම හා චක්‍රලේඛ අනුව ග්‍රාමීය මාර්ග සංවර්ධන යෝජනා කැඳවීම.
- සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබාගැනීම සහ ඇස්තමේන්තු සකස් කිරීම..
- ක්‍රියාත්මක ආයතන වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම සහ උපදෙස් ලබාදීම.
- ප්‍රාදේශීය මට්ටමේ සමිති සහ ක්‍රියාකාරී නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ක්ෂේත්‍ර පරීක්ෂණ / නිරීක්ෂණ සිදුකිරීම.
- බිල්පත් අමාත්‍යාංශය වෙත ලබාගැනීම හා පරීක්ෂා කර ගෙවීම් කටයුතු සිදුකිරීම.
- ප්‍රගති සමාලෝචන හා පසුවිපරම් කිරීම.

යන කාර්යයන් මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වේ.

වසර 12ක් පමණ පැරණි මෙම අංශය වඩාත් හොඳ ග්‍රාමීය ප්‍රවේශ මාර්ග පද්ධතියක් ඇති කිරීමටත්, ආර්ථික හා සමාජයීය සංවර්ධනයටත් මහත් පිටුවහලක් වෙමින් ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන අතර ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා ආයෝජනය තවදුරටත් ඉහල නංවමින්, වඩාත් ශක්තිමත් මාර්ග ජාලයක්ද සමඟින් ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් දක්වමින් ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීමට ද සහාය දීම ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනේ මූලික අරමුණ වේ.

**2018 වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මුහුණදුන් අභියෝග හා ගැටළු**

i. ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති යෝජනා ලබා දීමේ ප්‍රමාදය නිසා වර්ෂය තුළ අපේක්ෂිත වැඩ අවසන් කිරීමට නොහැකි වීම.
ii. කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරනු ලබන මාර්ග පිහිටි ඇතැම් දිස්ත්‍රික්ක වල තත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා ගැටළු පැන නැගීම.
iii. ලැබෙන බිල්පත් කඩිනමින් ගෙවීමට අවශ්‍ය අක්මුදල් මහා භාණ්ඩාගාරයෙන් කඩිනමින් නොලැබීම නිසා, ව්‍යාපෘති ක්‍රියාත්මක කළ ප්‍රජාපාදක සමිති මූල්‍ය අර්බුද වලට මුහුණ පෑම.
iv. පළාත් පාලන ආයතන මඟින් තෝරාගත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය අවසරය ලබා නොදීම පිළිබඳ ගැටළු පැණ නැගුන ප්‍රදේශයන්හි අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වීම හා ක්‍රියාත්මක කල නොහැකි වීම.

### 1.4.7 අභ්‍යන්තර විගණන අංශය

මු.රෙ.128 හි දක්වා ඇති රාජකාරි හා වගකීම ඉටු කිරීම සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනය තුළ අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බවට පැන වී ඇති මු.රෙ. 133 ප්‍රකාරව මෙම අමාත්‍යාංශය තුළ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර තිබේ.

මෙම අංශයේ ප්‍රධාන ප්‍රරමාර්ථ ලෙස පහත කරුණු සඳහන් කර තිබේ.

- අමාත්‍යාංශය තුල අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කිරිම.
- සංවර්ධන ව්‍යාපෘති සහ යෝජනා ක්‍රම , ක්‍රියාත්මක කිරිමෙහි සහ සැලසුම් හා වැඩසටහන් සපුරාලීමෙහි ලබා දී ඇති ප්‍රගතිය නිශ්වය කිරිමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට සහය විම.
- මෙම සංවර්ධන ව්‍යාපෘති වල නිරිතවන්නන්ගේ සහ අමාත්‍යාංශය ලේකම් හා ප්‍රගති කමිටු අතර සම්බන්ධ කාරකය වශයෙන් ක්‍රියා කිරිම.

<u>**අංශයේ ප්‍රධාන කාර්යභාරයන් හා අත්පත් කරගත් භෞතික ප්‍රගතිය**</u>

I. ආයතනයේ අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රම ,පරමාර්ථ ඉටු කර ගැනීමෙහි ලා සාර්ථකදැයි සොයා බැලීම.

II. ගිණුම් හා වෙනත් වාර්තා වල විශ්වාසනීයත්වය නිශ්වය කිරීම සහ අනුගමනය කරන ගිණුම් පිළිවෙත ඇගයීම් කිරිම.

III. යොදා ඇති ගිණුම් ක්‍රම මඟින් අවශ්‍ය තොරතුරු නියමාකාර ලෙස ලැබේදැයි විමසීම.

IV. කාර්ය මණ්ඩල කාර්ය සාධනයේ ගුණාත්මක භාවය ඇගයීම.

V. ආයතනයේ වත්කම් කොතරම් දුරට සියලු ආකාරයේ අලාභ හානිවලින් ආරක්ෂාකාරී ද යන්න පරීක්ෂා කිරීම.

VI. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන හා භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස් නිසි ලෙස පිළිපදිනු ලැබේදැයි පරීක්ෂා කිරීම.

VII. සම්පත් නාස්තිය වැලැක්වීමට මෙන්ම එය අනාවරණය කර ගැනිමට තෝරා ගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය පිළිබඳ සොයා බැලීම.

VIII. ආයතනයේ ගිණුම් පටිපාටිය හා මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ දේපළ හා වත්කම් ආරක්ෂාකාරී ලෙස අරපිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේදැයි සොයා බැලීම.

IX. විශේෂ විමර්ශන පැවැත්වීම.

මුදල් රෙගුලාසි වලින් නියම කර ඇති මෙම කාර්යභාරය ඉටු කිරිම තුළින් 2018 වසර තුළ දි ඵලදායි නිරික්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීමට අභ්‍යන්තර විගණන අංශය කටයුතු කර තිබේ.

## 2018 වසර තුළ ක්‍රියාත්මකකරන ලද විගණන ක්‍රියාකාරකම් හා විශේෂ විමර්ශන

2018 වර්ෂය තුලදී හඳුනාගන්නා ලද අවදානම් ඇගයීම් මත අමාත්‍යාංශය හා අනුබද්ධිත ව්‍යාපෘති කාර්යාල තුළ පහත සඳහන් විගණන ක්ෂේත්‍රයන් යටතේ විගණනයන් සිදුකර ඇත.

- කාර්යසාධන විගණනය
- මූල්‍ය විගණනය
- ආයතනික කටයුතු විගණනය
- භෞතික ක්ෂේත්‍ර පරීක්ෂාව

මේ සඳහා අංශය විසින් සකස්කර ඇති විගණන සැලැස්මට අනුව ඉහත ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් අඛණ්ඩ විගණනයන් සහ ඊට අදාල ස්වාධීන ඇගයීම් සිදුකර ඇති අතර අමාත්‍යාංශය යටතේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන අංශය තුල ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති තුලින් අපේක්ෂිත අරමුණු හා ඉලක්කයන් සපුරා ගැනීම සඳහා කටයුතු කිරීම පිළිබඳව විගණනයට ලක් කර අවශ්‍ය මඟ පෙන්වීම සිදුකරන ලදි.

විගණන සැලැස්මට පරිබාහිරව 2018 වර්ෂය තුළ ලේකම්තුමාගේ උපදෙස් පරිදි විශේෂ විමර්ශන 07 ක් සිදුකර, ඒ සම්බන්ධයෙන් විමර්ශන වාර්තා ඉදිරිපත් කර ඇත. මෙම අභ්‍යන්තර විගණන පරීක්ෂාව සහ විශේෂ විමර්ශන මඟින් අමාත්‍යාංශයට සෘජුව බලපාන අභ්‍යන්තර පාලන ගැටළු පිළිබඳව නිරික්ෂණ ඉදිරිපත් කර තිබේ.

**ඉලක්ක සපුරා ගැනීම් හා සමාලෝචනය**

2018 අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම සිදුකර ඇත.එක් එක් විගණන පරීක්ෂාවන් හා විශේෂ විමර්ශනයන් තුලින් ඵලදායී විගණන පැහැදිලි කිරීම්, නිරික්ෂණ හා නිර්දේශ ලබා දීමටත්, ඒ තුළින් කාර්ය මණ්ඩල කළමනාකරණය, වත්කම් කළමනාකරණය, පරිපාලන සහ ගිණුම්කරණ දුර්වලතා ,වාහන අවභාවිතයන් සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින දුර්වලතා ඉවත් කර ශක්තිමත්භාවය ඉහළ නැංවීමට යෝජනා ඉදිරිපත් කිරීමෙන් දායකත්වය ලබා දීමටත් අභ්‍යන්තර විගණන අංශයට හැකි විය.

**සංවිධාන සටහන**




## 1.4.8 ඉංජිනේරු අංශය

ශ්‍රී ලංකාව තුල මහාමාර්ග ඉදිකිරීම් සම්බන්ධ සියළු වගකීම් මහාමාර්ග අමාත්‍යාංශය වෙනුවෙන් දරනුයේ එහි ඉංජිනේරු අංශයයි. අංශ ප්‍රධානියා ලෙස කටයුතු කරන අතිරේක ලේකම්තුමාගේ (ඉංජිනේරු) පූර්ණ අධීක්ෂණය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහාමාර්ග ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

එසේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා ඊට අදාල තාක්ෂණික විගණනයන් සිදුකිරීම ද ඉංජිනේරු අංශය මඟින් සිදු කරනු ලබයි.

**අංශයේ ප්‍රධාන කාර්යභාරයන්**

- මහාමර්ග ඉදිකිරීම් සම්බන්ධ සියළු ඉංජිනේරුමය කටයුතු අධීක්ෂණය හා අදාල තාක්ෂණික විගණනයන් සිදුකිරීම.
- දේශීය හා විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය හා තත්වය අධීක්ෂණය කිරීම.
- වාර්ෂිකව මාර්ග මිලගණන් ලේඛනය (HSR) සැකසීම.
- මාර්ග උත්ශ්‍රේණිගත කිරීම් සිදුකිරීම.
- බිටුමන්(bitumen) මිලදී ගැණුම් වලදී ගැණුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කරදීම.
- සියළු ව්‍යාපෘති වලට අදාල "ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු (PCC)" සඳහා සහභාගී වීම සහ ඒවා සම්බන්ධීකරණය කිරීම.
- සියළු ව්‍යාපෘති වලට අදාල කාර්යසාධන වාර්තා පරීක්ෂා කිරීම
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (PPC) සභාපතීත්වය දැරීම.
- අමාත්‍යාංශ ලේකම් විසින් නියම කරනු ලබන පරිදි ජනාධිපති කාර්යාලයේ, අගමැති කාර්යාලයේ හා භාණ්ඩාගාරයේ පවත්වන වැදගත් රැස්වීම් සඳහා සහභාගී වීම.
- කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් හා ආරවුල් නිරාකරණයට අදාල රැස්වීම් වල සභාපතීත්වය දැරීම.
- අමාත්‍යාංශයේ පරිගණක ජාලය යාවත්කාලීන කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශ ලේකම් විසින් පවරනු ලබන රාජකාරී ඉටුකිරීම

**ඉලක්ක හා අත්පත් කර ගැනිම**

- 2018 වර්ෂයට අදාල මාර්ග මිලගණන් ලේඛනය (HSR) පෙබරවාරි මාසය තුල නිකුත් කරන ලදී.
- 2018 වර්ෂය තුළ බිටුමන් මිලදී ගැනීම සඳහා ඉල්ලුම් කරඇති ඉල්ලුම්කරුවන් 03ක ගේ අනන්‍යතාවය තහවුරු කරදීමට කටයුතු කර ඇත.
- මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද, මහාමාර්ග ඉදිකිරීම් වලට සම්බන්ධ මහජන පැමිණිලි, ස්ථානීය පරීක්ෂණයන් ද සිදුකරමින් ඒවායේ විමර්ෂණ කටයුතුද 2018 වර්ෂයේදී සිදුකර ඇත.
- අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් 2018 වර්ෂය තුල ක්‍රියාත්මක පැවති ව්‍යාපෘති මඟින් ඉදිකෙරුණු මාර්ග හා පාලම් ආදියෙහි ප්‍රගතිය හා තත්වය අධීක්ෂණය කරන ලද අතර අදාල කාර්යසාධන වාර්තා ද පරීක්ෂාවට ලක්කරන ලදී. එමෙන්ම ,ඊට සමගාමීව ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු වලට ද සහභාගී විය.

**2018 වර්ෂයේදී අංශය මුහුණදුන් අභියෝග හා ගැටළු**

1. මාර්ග මිලගණන් ලේඛනය (HSR) ජනවාරි මාසය තුල නිකුත් කිරීමේ අපහසුතාවය
    - අදාල මිලගණන් ගෙන්වා ගැනීමේදී කිහිපවරක් සිහිකැඳවීම් කලයුතු වීම
    - රජය මඟින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ නිසා මිල ගණන් වෙනස් වීම
2. මාර්ග උත්ශ්‍රේණිගත කිරීම් වලට අදාලව පළාත්සභා වලට යොමු කරන ලද ලිපි සඳහා කඩිනමින් පිළිතුරු නොලැබීමෙන් ප්‍රමාදයන් ඇතිවීම

## සංවිධාන සටහන


අතිරේක ලේකම්
(ඉංජිනේරු)
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
තාක්ෂණික විගණක
සහකාර අධ්‍යක්ෂ
(ඉංජිනේරු)(2)
සංවර්ධන
නිලධාරී (3)
වැඩසටහන්
සහකාර (3)
සංවර්ධන නිලධාරී
(3)
සැලසුම්
සහකාර (1)
තාක්ෂණික
නිලධාරී (1)
කළමනාකර
ණ සහකාර
කළමනාකරණ
සහකාර 3 (3)
රියදුරු
(2)
කා.කා.ස
(1)
කා.කා.ස
(1)

### 1.4.9 සැලසුම් හා මෙහෙයුම් අංශය

සැලසුම් හා මෙහෙයුම් අංශය මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන අංශයක් වන අතර එම අංශය මඟින් මහාමාර්ග සම්බන්ධව සිදුකරනු ලබන ව්‍යාපෘතිවල ප්‍රතිපත්ති සැකසීම, සුපරීක්ෂණය, සැලසුම් සම්බන්ධිකරණය, සැලසුම් ක්‍රියාත්මක කිරිම, නිරීක්ෂණය හා පසුවිපරම යන ප්‍රධාන වගකීම් ඉටු කරනු ලබයි. ඒ අනුව, මෙම අංශය මඟින් සිදුකරනු ලබන කාර්යයන් පහත පරිදි වේ.

- ව්‍යාපෘති සඳහා සම්බන්ධවන සියලු පාර්ශවයන්ගේ උපදෙස් අනුව මහාමාර්ග අංශයේ ප්‍රතිපත්ති සැකසීම.
- මහාමාර්ග අංශයේ ව්‍යාපෘති සඳහා සැලසුම් සැකසීම, ක්‍රියාත්මක කිරීම, අධික්ෂණය කිරීම.
- රජයේ ප්‍රමුඛතා සහ අයවැය ප්‍රතිපාදන අනුව වාර්ෂික කාර්යසාධන ක්‍රියාවලිය සැකසීම
- වාර්ෂික අයවැය සාකච්ඡා සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තා සහ ප්‍රගති වර්තා සැකසීම
- විවිධ අධිකාරීන් සඳහා අවශ්‍ය පරිදි කාර්යසාධන වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම
- මහාමාර්ග අංශයට අදාල දත්ත එක්රැස් කිරීම සහ විචලනයන්ට අනුව යාවත්කාලීන කොට දත්ත පද්ධතියක් සැකසීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත ප්‍රමුඛ ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම හා සම්බන්ධිකරණය කිරීම.
- රජයේ මුල්‍යාධාර ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා විශ්ලේෂණය කොට එම ව්‍යාපෘති වාර්තාවලට අදාල සංකල්ප වාර්තා අදාල අනුමැතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- විවිධ ජාත්‍යන්තර ආධාර ලබාදෙන සංවිධානයන් මඟින් ඉදිරිපත් කරනු ලබන රාජකාරි ලිපි ලේඛන සඳහා අමාත්‍යාංශ ලේකම් නියෝජනය කරමින් අදහස් දැක්වීම,පුනරීක්ෂණය කිරීම ,රැස්වීම් සඳහා සහභාගි වීම සහ සටහන් තැබීම හා එකඟතාවයන්ට එළඹීම.
- අමාත්‍යාංශයේ ඉලක්ක, අරමුණු, ක්‍රියාවලීන්, සංවර්ධන ප්‍රමුඛතාවන් අනුව විවිධ අධිකාරීන් මඟින් මෙහෙයවන රැස්වීම්, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීම.
- ආයතන සඳහා සකස් කළ කාර්යසාධන වාර්තා අදාල අවශ්‍යතා පරිදි නියමිත කාලසීමාව තුල අවසන් කිරීම සහ ලබාදීම.

2018 වර්ෂයේදී ව්‍යාපෘති කළමණාකරන අංශ 23ක් නියෝජනය කරමින් ව්‍යාපෘති සම්බන්ධිකරණ කමිටු රැස්විම් 113 ක් පවත්වා ඇත. එසේම ව්‍යාපෘතීන්හි මූල්‍ය හා භෞතික ප්‍රගතීන් අදාල කරගනිමින් සකස් කොට සම්පූර්ණ කරන ලද වාර්ෂික කාර්යසාධන වාර්තාව 2017, ප්‍රගති වාර්තාව 2018 , 2018 වසරේ කාර්තුමය ප්‍රගති වාර්තා සහ මාසික වාර්තා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. තවද ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් විසින් ඉදිරිපත් කර ඇති ප්‍රගති වාර්තාවන් තවදුරටත් ඇගයීමට ලක් කිරීම හා අංශයේ අරමුණු ඉටුකරගැනීමට අවශ්‍ය කාර්යයන් ඉටුකිරීම ද මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

**සංවිධාන සටහන**


ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)
සැලසුම් සහකාර (2)
සංවර්ධන නිලධාරී (4)
කළමනාකරණ සහකාර - (3)
රියදුරු - (1)
කා.කා.ස 2

## 1.5 පුහුණු කිරීම් සහ සම්මන්ත්‍රණ (මහාමාර්ග අංශය)

2018 වර්ෂයේදී අමාත්‍යාංශයේ නිළධාරීන් සඳහා සංවිධානය කරන ලද දේශීය හා විදේශීය පුහුණු කිරීම් සහ සම්මන්ත්‍රණ පහත දැක්වේ.

**වගු අංක 1.5.1 පුහුණු කිරීම් සහ සම්මන්ත්‍රණ (මහාමාර්ග අංශය)**

| කාණ්ඩය | සහභාගීවූවන් ගණන |
|---|---|
| **දේශීය පුහුණුවීම්** | |
| විධායක | 08 |
| විධායක නොවන හා වෙනත් | 104 |
| **විදේශ පුහුණුවීම්** | |
| විධායක | 08 |
| විධායක නොවන හා වෙනත් | - |
| **දේශීය සම්මන්ත්‍රණ** | |
| විධායක | - |
| විධායක නොවන හා වෙනත් | |
| **විදේශීය සම්මන්ත්‍රණ** | |
| විධායක | - |
| විධායක නොවන හා වෙනත් | - |

වගු අංක 1.5.2 නිල විදේශ පුහුණුවීම් - 2018

| නම | තනතුර | සංචාරය කරන ලද රට | කාලසීමාව | දූත මෙහෙය |
|---|---|---|---|---|
| බී. රණවීර මහතා | අතිරේක ලේකම් (සංවර්ධන) | චීනය | 2018.05.04 - 2018.05.14 | චීනයේ අධ්‍යාපන වැඩසටහනක් සඳහා සහභාගි වීම. |
| එච්.සී.එස්. ගුණතිලක මහතා | අතිරේක ලේකම් (ඉංජිනේරු) | කොරියාව | 2018.09.18 - 2018.09.20 | ගෝලීය යටිතල පහසුකම් සහයෝගීතා සමුළුව |
| ඩී.ඩී. මාතරආරච්චි මහතා | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ | තායිලන්තය | 2018.02.05 - 2018.02.16 | තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය |
| එච්.අයි. පල්ලාවල මහත්මිය | අධ්‍යක්ෂ (ව්‍යාපෘති කලමනාකරණ) | ඉන්දියාව | 2018.01.11 - 2018.01.12 | ශ්‍රී ලංකාවේ රජය නිලධාරීන් සඳහා ණය මාර්ගෝපදේහන සහ ක්‍රියාපටිපාටිය පිළිබඳ වැඩමුළුව |
| ඩී.ඩී. මාතරආරච්චි මහතා | ජ්‍යෙෂ්ඨ වැඩසටහන් අධ්‍යක්ෂ | තායිලන්තය | 2018.09.17 - 2018.09.18 | BIMSTEC - ප්‍රවාහන සබඳතා පිළිබඳ ප්‍ර ධාන සැලසුම් සම්බන්ධ වැඩමුළුව |
| පී.අමරතුංග මිය | සහකාර අධ්‍යක්ෂ | චීනය | 2018.07.11 - 2018.07.30 | විදේශීය නිළධාරීන් සඳහා මාර්ග ඉදිකිරීම හා මාර්ග ව්‍යාපෘති සඳහා මාර්ගෝපදේශ පිළිබඳ සම්මන්ත්‍රණය |
| ඊ.එන්.දයාරත්න මහතා | සහකාර ලේකම් (ව්‍යාපෘති කලමනාකරණ) | චීනය | 2018.06.07 - 2018.06.21 | ජාත්‍යාන්තර හා දේශසීමා අතර එකඟතාවය ඇති කිරීම පිළිබඳ 2018 වසරේ දී විදේශීය නිලධාරීන් සමඟ පැවති සම්මන්ත්‍රණය |
| ඩබ්.පී.කල්‍යාණී මිය | සහකාර අධ්‍යක්ෂ (මහනැගුම) | තායිලන්තය | 2018.01.22 - 2018.01.26 | ව්‍යාපෘති යටිතල පහසුකම් කළමනාකරණය |
| ඩබ්.එච්.කේ.ඩී.බී .රත්නායක | අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | | | |
| ජේ.කේ.එන්.පෙරේරා මහතා | ප්‍රධාන මූල්‍ය නිලධාරී | ඉන්දියාව | 2018.09.09 2018.09.15 | දෙවන අධ්‍යනය සංචාරය |
| ඩී.සී. දිසානායක මහතා | ලේකම් | වොෂින්ටන් | 2018.09.30- 2018.10.05 | අග්‍රාමාත්‍ය කාර්යාලීය සම්බන්ධීකරණය කරමින් මිලේනියම් අභියෝගිතා සමාගම විසින් පවත්වන ලද සම්බන්ධීකරණය |

## මාර්ග සංවර්ධන අධිකාරිය

### දැක්ම

“විශිෂ්ය මහාමාර්ග ජාලයක් සැපයීම පිළිබඳ සමාජයේ අපේක්ෂාවන් ඉටුකරන, මහාමාර්ග ඉංජිනේරු විද්‍යාවේ බහු විෂයික විශිෂ්යත්වයෙන් යුත්, ප්‍රමුඛ ජාතික ආයතනය ලෙස ඇගයීමට ලක්වීම.”



### මෙහෙවර

“මාර්ග අංශයේ ප්‍රමුඛ ජාතික ආයතනය ලෙස මහජනතාව හා භාණ්ඩ ප්‍රවාහනය සහ ජාතියේ සාමාජීය ආර්ථික සංවර්ධනය සඳහා මග පාදමින්, පිළිගත හැකි මට්ටමක, ආරක්ෂාව හා පහසුව සලසමින් පරිසර හිතකාමී අයුරින්, සංචලතාවය හා ප්‍රවේශකත්වය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් හා කාර්යක්ෂම ජාතික මහාමාර්ග ජාලයක් සැපයීම.”

1981 අංක 73 දරණ පනත් කෙටුම්පත මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය, මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත්කෙරුණු අතර 1986 දී එය මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම අනුප්‍රාප්තිකයා බවට පත්විය.

පවතින මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සඳහා අධිවේගී සහ ඒ හා බී ශ්‍රේණියේ මහාමාර්ග නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීමේ ද නව මාර්ග, පාලම් හා අධිවේගී මාර්ග සැලසුම්කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීමේ ද වගකීම මහාමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතුවේ.

## 1.6 මූල්‍ය කාර්යසාධනය

2018 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා ප්‍රතිශෝධිත අයවැය ප්‍රතිපාදනය සහ වියදම පහත වගුවෙන් දක්වා ඇත.

**වගු අංක 1.6.1 සංශෝධිත අයවැය ප්‍රතිපාදනය සහ මුළු වියදම**

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය 2018 (රු.මි.) | වියදම 2018 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 263,280,000.00 | 227,825,022.91 | 87 |
| ප්‍රාග්ධන වියදම | 196,055,130,000.00 | 166,449,293,419.16 | 85 |
| එකතුව | 193,318,410,000.00 | 166,677,118,442.07 | 85 |

**වගු අංක 1.6.2 පුනරාවර්තන වියදම**

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය 2018 (රු.මි.) | වියදම 2018 (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 207,800,000.00 | 172,926,114.02 | 83 |
| වෙනත් වියදම | 55,480,000.00 | 54,898,908.89 | 99 |
| එකතුව | 263,280,000.00 | 227,825,022.91 | 87 |

**වගු අංක 1.6.3 ප්‍රාග්ධන වියදම**

| ශීර්ෂය | වැඩසටහන | ව්‍යාපෘතිය | කාණ්ඩය/වැයවිෂය/අයිතම විස්තරය | ප්‍රතිශෝධිත ශුද්ධ ප්‍රතිපාදනය 2018 (රු.) | වියදම 2018.12.31 (රු.) |
|---|---|---|---|---|---|
| **117** | 1 | 1 | අමාත්‍ය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු | 3,208,000.00 | 3,013,886.12 |
| **117** | 1 | 2 | අමාත්‍යාංශ සාමාන්‍ය පරිපාලනය | 4,729,000.00 | 3,984,101.71 |
| **117** | 1 | 11 | රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ මෙහෙයුම් කටයුතු | 2,950,000.00 | 2,118,727.90 |
| **117** | 2 | 3 | අධිවේගී මාර්ග සංවර්ධනය | 78,627,250..00 | 61,454,939,844.28 |
| **117** | 2 | 4 | මහාමාර්ග සංවර්ධනය | 79,201,600,000.00 | 71,948,619,712.86 |
| **117** | 2 | 5 | මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම | 10,865,000,000.00 | 7,559,000,000.00 |
| **117** | 2 | 6 | පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම | 14,333,000,,000.00 | 13,311,019,373.29 |
| **117** | 2 | 7 | ස්වභාවික ආපදාවලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 3,805,,000,000.00 | 3,780,745,910.92 |
| **117** | 2 | 8 | ආයතනික සහාය | 6,112,000,000.00 | 6,112,000 ,000.00 |
| **117** | 2 | 9 | මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 3,100,330,000.00 | 2,003,807,172.71 |
| | | | **එකතුව** | **196,055,130,000.00** | **166,179,248,729.79** |

වගු අංක 1.6.4 අත්තිකාරම් ගිණුම

| විස්තරය | වියදමේ උපරිම සීමා (රු.) | ලැබීමේ අවම සීමා (රු.) | ණය ශේෂයේ උපරිම සීමා (රු.) |
|---|---|---|---|
| **2018 වසර සඳහා සීමාව** | 27,000,000.00 | 10,000,000.00 | 58,000,000.00 |
| **2018 වසර සඳහා සැබෑ මුදල** | 25,131,491.90 | 13,361,924.86 | 51,612,328.06 |

## 2.0 වර්ධිත ආයෝජනය සහ නව ප්‍රවේශයන්

රටේ ආර්ථිකය ඉහළ අනුපාතයකින් පවත්වාගෙන යාමට රජය අපේක්ෂා කරන බැවින් එකී සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම සඳහා රටේ මාර්ග පද්ධතිය උසස් තත්ත්වයකින් පවත්වාගත යුතුබව හඳුනා ගෙන ඇත. රටේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම සඳහා සිදු කරනු ලබන විශාල ආයෝජනයන් හමුවේ වුවද රජය විසින් 2018 වර්ෂය සඳහා මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය සඳහා වියදම් ශීර්ෂ 117 යටතේ රුපියල් මිලියන 136,236 ක මුදලක් වෙන් කළද වරින් වර පැනනැගුණු අවශ්‍යතා මත ලබාදුන් අමතර ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තුව මත එම මුදල රුපියල් මිලියන 196,318.38 ක් වූ සංශෝධිත අගයක් දක්වා වර්ධනය විය.

## 2.1 නව ප්‍රවේශයන්

### 2.1.1 නව කැලණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණුමත ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය

කොළඹ නගරය, අර්ධ නාගරික ප්‍රදේශ සහ අධිවේගී මාර්ගයන් අතර මාර්ග සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ ප්‍රධාන අරමුණෙන් සහ දැනට පවතින රථවාහන තදබදය අවම කිරීමේ පරමාර්ථ සහිත ව උක්ත අධිවේගී මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙම මාර්ගය භාවිතා කරන්නන්හට දෙමටගොඩ, රාජගිරිය, බත්තරමුල්ල පාර්ලිමේන්තු සංකීර්ණ පිවිසුම සහ කොස්වත්ත යන ප්‍රදේශවල ඉදිකිරීමට නියමිත අන්තර්හුවමාරු මධ්‍යස්ථානයන් ඔස්සේ මීට ප්‍රවේශ වීමේ පහසුකම් සහිතව ඉදිකරනු ලැබේ. මෙම ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතිය මාර්ග කොටස් 2 කින් යුක්තය. යෝජිත නව කැළණි පාලමෙන් ආරම්භ වී ඔරුගොඩවත්තදී බේස්ලයින් මාර්ගයට සම්බන්ධ වී රාජගිරියෙන් අවසන් වන කි.මී. 6.9 පමණ දිගැති මංතීරු 4න් යුත් කණුමත ඉදිවන මාර්ග කොටස මෙහි ප්‍රථම අදියර ලෙස ද රාජගිරිය සිට අතුරුගිරිය ප්‍රදේශයේ දී පිටත වටරවුම් අධිවේගී මාර්ගය හා සම්බන්ධ වන පරිදි කි.මී. 10.4 කින් දකුණු දෙසට දීර්ඝ කිරීම මෙහි දෙවන අදියර ලෙස ද දැක්විය හැකිය.

මෙම ව්‍යාපෘතියෙහි ප්‍රථම අදියර 2018 වසරේ දී ආරම්භ වී 2021 වසරේදී නිම කිරීමට අපේක්ෂිත අතර රු.මිලියන 50-60 ත් අතර මූල්‍ය ආයෝජනයක් සිදු කිරීමට නියමිතය. රු.මිලියන 70 පමණ මූල්‍ය ආයෝජනයක් මෙහි දෙවන අදියර සඳහා යෙදවීමට අපේක්ෂිතය. පැ.කි.මී. 80 ත් 100 ත් අතර වේග සීමාවන් සඳහා සැලසුම් කර ඇති මෙමඟින් නව කැළණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා මිනිත්තු 18කින් පමණ ළඟාවීමේ පහසුව සැලසෙනු ඇත.

ව්‍යාපෘතියෙහි පළමු අදියරෙහි ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර ඇති අතර ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී. 2018 වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියෙහි ඉඩම් මැනුම් කටයුතු 20% ක ප්‍රගතියක් සහිතව සිදු කරමින් පවතින අතර පළමු අදියරහි ආයෝජකයන් සඳහා වන ප්‍රසම්පාදන කටයුතු

17% ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. 2018 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම හා සැසඳුවිට ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙහි ඉලක්කය ලෙස එහි 100% සඳහන්ව තිබුනද ඉන් අත්පත් කරගැනීමට හැකිවී ඇත්තේ 22% ක ප්‍රගතියක් පමණක් වන අතර එය වර්ෂය තුල ඉලක්කගත අගයට වඩා අඩු අගයක් වී ඇත.

2018 වර්ෂය අවසන් වනවිට මෙම ව්‍යාපෘතියෙහි දෙවන අදියරෙහි ශක්‍යතා අධ්‍යයන සිදුකිරීම සඳහා උපදේශන සේවාවන් සඳහා වන ප්‍රසම්පාදන කටයුතු හා එහි ශක්‍යතා අධ්‍යයන කටයුතු පිළිවෙලින් 20% ක හා 90% ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු මෙතෙක් ආරම්භ වී නොමැත.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **117-02-03-15** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 250.0 | - | - |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 80.0 | 111.75 | 53.03 |
| | **එකතුව** | **400.0** | **111.75** | **53.03** |

2018 වර්ෂයේදී ව්‍යාපෘතිය මඟින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය 47% ක්වන අතර 2017 වසරේදී එම අගය 14% ක් ලෙස සඳහන්ව ඇත. 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වියදම් සඳහා වන ඉලක්කය රුපියල් මිලියන 400 ක් වන නමුත්, සැලසුම් කල අකාරයට ව්‍යාපෘතියෙහි ඉඩම් අත්පත් කරගැනීමේ වැඩකටයුතු කරගෙන යාමට නොහැකිවීම නිසා අවසන් මාස කිහිපය තුළ එම ප්‍රතිපාදන ප්‍රමාණය අඩුවී ඇත. කෙසේ වෙතත් 2018 වර්ෂයේ ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය පෙර වසරට වඩා ඉහළ අගයක් ගෙන ඇත.

### 2.1.2 කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය

කාර්යක්ෂම සහ කඩිනම් මාර්ග සේවාවක් ලබාදීමේ අරමුණින් සැලසුම්කර ඇති මෙම ව්‍යාපෘතිය පොළව මට්ටමට ඉහළින් කුළුණු මත ඉදිකරනු ලබන කි.මී. 5.28 දිගැති ප්‍රවේශ මාර්ගයකි. රු.මිලියන 36,500 ට ආසන්න මූල්‍ය ආයෝජන මත ඉදිවන මෙම මාර්ගය සඳහා මූල්‍ය සහාය ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබා දෙනු ලැබේ. මෙම ව්‍යාපෘතිය මඟින්,

- නව කැළණි පාලමේ සිට ගාලුමුවදොර දක්වා දිවෙන කුළුණු මත ඉදිවන මාර්ගය
- වරාය ඇතුළත ගොඩනැඟිලි ප්‍රතිස්ථාපනය
- උක්ත මාර්ගයට සමාන්තරව පොළොව මතින් දිවෙන මංතීරු 04කින් යුක්ත මාර්ගය

ආදි වූ නිමැවුම් අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය තුළින් කොළඹ නගරයේ කාර්යබහුල ප්‍රදේශයන් හරහා වාහන තදබදය අවම කර ගැනීමට හැකිවනු ඇති අතර භාණ්ඩ ප්‍රවාහනය හා මගී ගමනාගමන කටයුතු ද මේ තුළින් වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව ඉටුකර ගත හැකි වනු ඇත. තවද මේ තුළින් කොළඹ නගරයෙන් පිටත ඇති නැව්, බඩු බෙදා හැරීමේ දී හා නාවික සේවා සැපයීමේ කාර්යන්හී දි වරාය නාවික පර්යන්තයන් සමඟ කාර්යක්ෂමව සම්බන්ධවීමේ හැකියාව ද සැලසෙනු ඇත.

2018 වර්ෂයේ දී කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ගය ඉදිකිරීමේ ප්‍රසම්පාදනය, සමුද්‍රීය පහසුකම් සපයන මධ්‍යස්ථානය ඉදිකිරීම සහ එහි ආධාරක කොන්ක්‍රීට් කණු ඉදිකිරීම සිදුකෙරෙමින් පවතින අතර 2018 වසරේ අවසානය වනවිට ව්‍යාපෘතියෙහි විස්තරාත්මක නිර්මාණ සකස් කිරීම, කොන්ත්‍රාත්කරුවන් සඳහා වන ප්‍රසම්පාදනය සහ උපදේශනය සඳහා වන ප්‍රසම්පාදනය සඳහා පිළිවෙලින් 30%, 40% සහ 35% ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

2018 වර්ෂයේදී ව්‍යාපෘතිය 95% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති නමුත් 2018 වර්ෂයේදී අයවැය මඟින් ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන අවම වශයෙන් භාවිතා කිරීම හේතුවෙන් වෙනත් ව්‍යාපෘතීන් සඳහා එම ප්‍රතිපාදන වලින් කොටසක් මාරු කරන ලදී. 2018 වර්ෂය තුලදී ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ නොවීම හේතුවෙන් අදාල ප්‍රතිපාදන උපරිම මට්ටමින් යොදා ගැනීමට නොහැකිවිය.

ඒ අනුව, 2018 වර්ෂය තුලදී ව්‍යාපෘතියේ සංශෝධිත ප්‍රතිපාදනයෙන් 85% ප්‍රමාණයක් අදාල කටයුතු සඳහා යොදවා ඇත.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය ශීර්ෂය | විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **117-02-03-16** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 3,040.00 | 32.00 | 30.45 |
| | **එකතුව** | **3,040.00** | **32.00** | **30.45** |

## 2.1.3 රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

සබරගමුව පළාත, බස්නාහිර හා දකුණු පළාත් සමඟ සම්බන්ධ කිරීම මඟින් පලාත් අතර ප්‍රවාහන සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පෙරදැරි කරගනිමින් කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා ඉදිකිරීමට යෝජිත මෙම අධිවේගී මාර්ගය ආසන්න වශයෙන් කි.මී. 74 ක දිගකින් යුතුවේ. මෙම ව්‍යාපෘතිය අදියර 03 කින් නිමකිරීමට නියමිත වන අතර එම එක් එක් අදියර පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**පළමු අදියර – කහතුඩුව සිට ඉංගිරිය දක්වා කොටස (කි.මී 0.00 - කි.මී 26.30)**

මෙම අදියර මඟින් කහතුඩුව සිට ඉංගිරිය දක්වා කි.මී. 26.3 ක දිගකින් යුත් අධිවේගී මාර්ග කොටස ඉදිකිරීමට නියමිතය. එය කහතුඩුව, හොරණ හා ඉංගිරිය යන ස්ථානවල ඉදිකරනු ලබන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන 03 කින් යුක්ත වේ.

**දෙවන අදියර – ඉංගිරිය සිට රත්නපුර දක්වා කොටස (කි.මී 26.30 - කි.මී 52.50)**

දිගින් කි.මී 26.2 කින් සමන්විත වන මෙම අධිවේගී මාර්ග කොටස ඉංගිරිය සිට රත්නපුර දක්වා ඉදිකිරීමට නියමිතය. කිරිඇල්ල, කුරුවිට හා රත්නපුර යන ස්ථාන වල අන්තර් හුවමාරු මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කර ඇති මෙහි උමං 06 ක්ද තැනීමට සැලසුම් කර ඇත.

**තෙවන අදියර – රත්නපුර සිට පැල්මඩුල්ල දක්වා කොටස (කි.මී 52.50 - කි.මී 73.9)**

රුවන්පුර අධිවේගී මාර්ගයට අයත් අවසාන අධිවේගී මාර්ග කොටස වන කි.මී 21.4 කින් සමන්විත වන මෙම මාර්ග කොටස රත්නපුර සිට පැල්මඩුල්ල දක්වා ඉදිකිරීමට සැලසුම් කර ඇත.රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය තුළින් මගීන්ගේ ගමන් පහසුව සැලසෙන අතර ප්‍රවාහන පහසුකම් දියුණු වීම තුළින් මැණික්, තේ වැනි අපනයන නිෂ්පාදන මෙන්ම නව කර්මාන්ත වල ව්‍යාප්තියට ද මංපෙත් විවර වනු ඇත. තවද ඉඩම් වල වටිනාකම ඉහළ යාම හේතුවෙන් මහජනතාවගේ ජීවන තත්ත්වයද ඉහළ යනු ඇත.

2018 වසර අවසන් වනවිට උක්ත අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව අවසන් කර ඇත. තවද පාරසරික බලපෑම් තක්සේරු වාර්තාව 99% ක ප්‍රගතියක් සහිතව මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අපේක්ෂාවෙන් පසුවන අතර එතෙක් අදියර 1 හි ප්‍රසම්පාදන කටයුතු 70% ක ප්‍රගතියක් සහිතව සිදු කෙරෙමින් පවතී. ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2018 දෙසැම්බර් 31 වන විට එහි ප්‍රගතිය 20% ක් වන අතර 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ඉලක්කය ලෙස සඳහන්ව ඇත්තේ 5% කි. ව්‍යාපෘති කලමනාකරණ අංශය මඟින් 2018 වර්ෂයේ දී ව්‍යාපෘතියේ අදියර 03හිම ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළද අරමුදල් සැපයීමේ ගැටළුවක් හේතුවෙන් 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක වූයේ අදියර 1 හි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු පමණක් වන අතර ව්‍යාපෘතියේ සිවිල් වැඩ මෙතෙක් ආරම්භ වී නොමැත.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **117-02-03-13** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 110 | 90 | 75.3 |
| | 2105 ඉඩම් හා ඉඩම් අත්පත් කර ගැනීම | 500 | - | - |
| | **එකතුව** | **610** | **90** | **75.3** |

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දී රුපියල් මිලියන 610 ක් මුදලක් වෙන් කෙරුණ ද වර්ෂය අවසානය වනවිට එම මුදල වෙනත් ව්‍යාපෘති වෙත මාරු කරන ලදී. එසේම ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලියේ මන්දගාමී බව හේතුවෙන් 2018 වර්ෂය තුල දී කිසිදු වන්දි ගෙවීමක් සිදු නොකෙරිණි. එමනිසා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 15% ක් ලෙස දැක්විය හැක. එහෙත් වසර අවසන් වනවිට සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට අනුව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 84% ක් ලෙස සඳහන් කල හැක. උක්ත ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී 84% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2017 වර්ෂයේදී එම අගය 77% ක් ලෙස වාර්තා විය.

යෝජිත අධිවේගී මාර්ගයේ විහිදීම දැක්වෙන මාර්ග සිතියම ***ඇමුණුම 01*** මඟින් දක්වා ඇත.

### 2.1.4 මහනුවර හා තදාසන්න ප්‍රදේශවල මධ්‍යම අධිවේගී මාර්ගය හා සම්බන්ධිත මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මහනුවර දිස්ත්‍රික්කය කඳුකර ප්‍රදේශයක පිහිටා ඇති අතර බොහෝ කඳු වලින් වටවී තිබෙන බැවින් අවශ්‍ය කරන අධිවේගී මාර්ග නිවැරදි ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකිරීමට හා නඩත්තු කිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවන අතර එය මූල්‍යමය වශයෙන් අහිතකර තත්ත්වයක් පෙන්නුම් කරයි. එබැවින් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන ලද පුළුල් අධ්‍යයනයකින් අනතුරුව කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගය (ඒ 10) ගලගෙදර දක්වා අධිවේගී මාර්ගයක් ලෙස ඉදිකිරීමට සහ මහනුවර නගරය හා ප්‍රධාන වශයෙන් සම්බන්ධිත මාර්ග නිවැරදි ප්‍රමිතීන්ට අනුව ඉදිකිරීමටත් පවත්නා ප්‍රධාන මාර්ග කිහිපයක් දියුණු කිරීමටත් තීරණය කර ඇති අතර එමඟින් මහනුවර නගරය අධිවේගී මාර්ග ජාලය හා සම්බන්ධ කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් මාර්ග 06 වැඩිදියුණු කිරීමට තෝරා ගෙන ඇත.

**වගු අංක 2.1 වැඩිදියුණු කිරීම සඳහා යෝජිත මාර්ග**

| පැකේජය | අංකය | මාර්ගයේ නම | දුර (කි.මී) | ප්‍රගතිය |
|---|---|---|---|---|
| පැකේජ අංක **01** | 01 | කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගය කටුගස්තොට සිට ගලගෙදර දක්වා පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම (0+000 – 13+000) ( මංතීරු 04 ) | 13 | භූලක්ෂණ සමීක්ෂණය හා ජ්‍යාමිතික නිර්මාණ කටයුතු නිමකරඇත. |
| පැකේජ අංක **02** | 02 | ඒ009 මාර්ගය සහ ඒ 010 මාර්ගය කටුගස්තොට නගරය හා සම්බන්ධ කරමින් අතුරු මාර්ගයක් ඉදිකිරීම ( මංතීරු 04කින් යුත් නව මාර්ගය ) | 0.53 | |
| | 03 | අලදෙනිය -ඊරියගම මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (බී 005) | 10 | |
| පැකේජ අංක **03** | 04 | බරිගම - හල්ඔළුව මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (බී 537) (0+000 - 5+750) | 5.75 | භූලක්ෂණ සමීක්ෂණය හා ජ්‍යාමිතික නිර්මාණ කටයුතු නිමකරඇත. |

| පැකේජය | අංකය | මාර්ගයේ නම | දුර (කි.මී) | ප්‍රගතිය |
|---|---|---|---|---|
| | 05 | අරඹකඩේ - බොක්කාවල - අඹතැන්න මාර්ගයේ (බී 015) අරඹකඩේ - බොක්කාවල - පූජාපිටිය කොටස පුළුල් කර වැඩිදියුණු කිරීම | 2.5 | භූ ලක්ෂණ සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. |
| | 06 | අලවතුගොඩ - පූජාපිටිය මාර්ගය පුළුල් කර වැඩිදියුණු කිරීම (බී 377) | 8.1 | |
| | | **එකතුව** | **39.88** | |

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වසරේ අයවැය ප්‍රතිපාදන වෙන් වී නොමැති අතර හඳුනාගැනීමේ ක්‍රියාකාරකම් පමණක් 2018 වර්ෂය තුලදී සිදු කර ඇත. ඉහත සඳහන් කළ ක්‍රියාකාරකම්වලට අමතරව ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සඳහා උපදේශකවරුන් තෝරාගැනීමේ ලිපිලේඛන සකස් කරමින් පවතී.

### 2.1.5. කොහුවල, ගැටඹේ සහ හීරස්සගල ගුවන් පාලම් 03ක් ඉදිකිරීම

සමස්ත මාර්ග ජාලයේ ධාරිතාවය ඉහළ නැංවීමේ අරමුණින් මූලෝපායික වැදගත්කමකින් යුත් මංමාවත්වල අන්තර් කොටස් හා ඒවායේ විවිධ මට්ටම් වැඩිදියුණු කිරීම අවශ්‍යතාවයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇති අතර මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉහත සඳහන් කළ වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබේ.ඒ අනුව, කොහුවල, ගැටඹේ හා හීරස්සගල යන ස්ථාන වල හංගේරියානු ආධාර යටතේ නව ගුවන් පාලම් ඉදිකිරීම නුදුරු කාලයේදීම ආරම්භ වනු ඇත.

කොළඹ - හොරණ මාර්ගයේ (බී 84) කොහුවල මංසන්ධියේ කොහුවල ගුවන් පාලම ඉදිකිරීමට යොජනා කර ඇති අතර එය කොළඹ නගරය සඳහා අවතීර්ණ වීමට හැකි ප්‍රධාන මාර්ග අතුරින් එකක් වන අතර එම ප්‍රදේශය අධික ජනගහනයකින් යුත් නාගරික ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැක. මෙකී මංසන්ධිය පිළිබඳව සලකා බැලීමේදී කොළඹ - හොරණ මාර්ගයේ (බී84) කොහුවල මංසන්ධිය හරහා අධික රථවාහන තදබදයක් ඇතිවන අතර ප්‍රධාන වශයෙන් බී120 හා බී229 යන මාර්ග හරහා පැමිණෙන රථවාහන බී 229 මාර්ගය ඔස්සේ බී84 මාර්ගය දෙසට හැරවීමේදී මේ තත්ත්වය උද්ගත වේ. ඒ හේතුවෙන් මෙම ස්ථානයේ ගුවන් පාලම ස්ථාපනය කිරීම මඟින් පවතින රථවාහන තදබදය අවම කිරීමට හැකිවන අතර රථවාහන බී84 මාර්ගය ඔස්සේ සෘජුවම ගමන් කිරීමට හැකියාව සැලසෙනු ඇත.

මහනුවර ප්‍රවේශ වීමට හැකි ප්‍රධාන මාර්ගයන් 02ක් ලෙස විලියම් ගොපල්ලව මාවත (ඒබී42) සහ ඒ1 මාර්ගයේ අන්තර් කොටසක් වන ගැටඹේ මංසන්දිය හැඳින්විය හැක. ගැටඹේ සිට මීටර් 120 ක් දුරින් ඒබී042 විලියම් ගොපල්ලව මාවතේ දැනට පවතින හරස් මාර්ගයක් ද පිහිටා ඇත. මහනුවර දක්වා දිවෙන යෝජිත ගුවන් පාලම ඒ1 මාර්ගය ඔස්සේ ඒබී42 මාර්ගය හරහා ඉදිකරනු ලබයි.

මීට අමතරව යෝජිත ගුවන් පාලම ඒබී42 මාර්ගයේ ඇති හරස් මාර්ගය හරහා ඉදිකිරීම තුළින් දුම්රිය හරස්මඟ නිසා ඇතිවන රථවාහන තදබදය අවම වන අතර අතුරු මාර්ගය හරහා මහනුවර නගරය වෙත ළඟාවීමේදී දුම්රිය ධාවනය හේතුවෙන් මාර්ගයේ ඇතිවන රථවාහන තදබදය සීමාවන අතර ප්‍රමාදයකින් තොරව මහනුවර නගරය වෙත ළඟාවීමේ පහසුව සැලසෙනු ඇත.

යෝජිත ගුවන් පාලම් අතුරින් තෙවැන්න වන හීරස්සගල ගුවන් පාලම විලියම් ගොපල්ලව මාවත සහ ගැටඹෙ මංසන්දියේ සිට කි.මී. 1.6ක දුරකින් හීරස්සගල මංසන්දියේ ඉදිකිරීමට යෝජනා වී ඇත. මෙම මංසන්දිය ඒබී42 මාර්ගයේ තිබෙන ඉතා වැදගත් සංදිස්ථානයනයන්ගේ එකක් වන අතර මහනුවර නගරය වෙත ප්‍රවේශවීමට හැකි ප්‍රධාන මාර්ගයක් ද වේ. එසේම මෙහි පිහිටා ඇති දුම්රිය මාර්ගයද ප්‍රධාන මාර්ගයට සමාන්තරව වෙන්ව පිහිටා ඇත. මෙම අන්තර් කොටසෙහි පිහිටා ඇති දුම්රිය හරස් මාර්ගය මඟින් අතුරු මාර්ගය හා දුම්රිය හරස් මාර්ගය අතර රථවාහන ගමනාගමන කටයුතුවල තදබදයක් නිර්මාණය වන අතර මෙම ගුවන් පාලම ඉදිකිරීම මඟින් එම ගැටළුවද නිරාකරණය වනු ඇත.

තවද, මෙම ගුවන් පාලම මඟින් ගැටඹේ ගුවන් පාලම වඩාත් සඵලදායී ලෙස භාවිතයට ගැනීමට හැකිවන අතර එමඟින් තදබදයකින් තොරව, අවම කාලයකින් ගැටඹේ නගරයේ සිට මහනුවර නගරය දක්වා ළඟාවීමේ පහසුව සැලසෙනු ඇත.

**වගු අංක 2.2 . යෝජිත ගුවන් පාලම් 03**

| ගුවන් පාලමේ නම | ගුවන් පාලමේ දුර | බෑවුමේ දුර | ආරුක්කුවේ සැකැස්ම | ගුවන් පාලමේ පළල |
|---|---|---|---|---|
| **කොහුවල** | මීටර් 229 | මීටර් 97.6 | ආරුක්කු 3 - මීටර් 132 | මීටර් 9.4 |
| **ගැටඹේ** | ප්‍රධාන ගුවන්පාලම - මීටර් 396.7<br>ඒ01 දක්වා වන ශාඛාව - මීටර් 432.4 | ප්‍රධාන ගුවන්පාලම මීටර් 116.7 ශාඛාව මීටර් 147.4 | ප්‍රධාන ගුවන්පාලම ආරුක්කු 8 , ශාඛාව ආරුක්කු 8 | මංතීරු 3ක් සහිත කොටස මීටර් 13.4<br>මංතීරු 2ක් සහිත කොටස මීටර් 9.4<br>තනි මංතීරුවක් සහිත ශාඛාව මීටර් 5.4 |
| **හීරස්සගල** | මීටර් 316.4 | මීටර් 132.4 | ආරුක්කු5- මීටර් 184 | මීටර් 9.4 |

## 2.1.6. කෝකිලායි පාලම ඉදිකිරීම

නැගෙනහිර පළාත හා උතුරු පළාත අතර වෙරළබඩ තීරයේ අඛණ්ඩ සම්බන්ධතාවයක් ඇතිකිරීම සඳහා මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගයේ කෝකිලායි කලපුව හරහා මීටර් 1050ක දිගින් යුතු සංයුක්ත පාලමක් ඉදිකිරීම යෝග්‍ය බවට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත. ජාතික මහාමාර්ග

ජාලයේ, පුල්මුඩේ ඉක්මවා වෙරළ තීරය ඔස්සේ අඛණ්ඩ සම්බන්ධතාවයක් නොමැත. මෙම ගැටළුවට විසඳුමක් ලෙස චීනයේ ආනයන හා අපනයන බැංකුවේ මූල්‍යාධාර මත උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ මුලතිව් - කෝකිලායි මාර්ගය (බී297) කි.මී 42.4 ක් දුරක් පුල්මුඩේ දක්වා දීර්ඝ කර මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගය ලෙස වැඩිදියුණු කරනලදී.

මෙම මාර්ගය උතුරු පළාත සමඟ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සම්බන්ධ කරන ලබන ප්‍රධාන සංදිස්ථානයකි. මෙය පවතින රථවාහන තදබදය මඟහැර නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය හා මඩකලපුව යන දිස්ත්‍රික්කවල සිට උතුරු සීමාවේ මුලතිව්, කිලිනොච්චි හා යාපනය යන දිස්ත්‍රික්ක වලට ලඟාවිය හැකි කෙටිම මාර්ගය වේ. මෙම මාර්ගය නායරු කලපුව සහ කෝකිලායි කලපුව ලෙස නම්කරන ලද ප්‍රධාන සමුද්‍රීය හරස් මාර්ග 02කින් යුක්ත වේ. එසේ වුවද ඉහත සඳහන් කළ මාර්ග ව්‍යාපෘතිය මඟින් නායරු කලපුව හරහා පාලමක් ඉදිකරනු ලැබුවද ව්‍යාපෘතියේ පැවති මූල්‍යමය සීමාවන් නිසා කෝකිලායි කලපුව හරහා පාලමක් ඉදිකිරීම එම ව්‍යාපෘතිය යටතට නොගැණිනි. මෝසම් කාලයේදී කෝකිලායි කලපුවේ මීටර් 1025 පමණ දියකපොල්ලක් නිර්මාණය වන අතර වියළි කාලයේදී එය මීටර් 800ක් දක්වා අඩුවේ. මෙම මාර්ගයේ රථවාහන තදබදය වැඩි වී ඇති අතර වර්තමානය වනවිට එය පළාත් හා ප්‍රාදේශීය සභා මාර්ගයන් ඔස්සේ කි.මී. 25ට වඩා වැඩි ප්‍රමාණයක් දක්වා වර්ධනය වී ඇත. මෙම අතුරු මාර්ග බොහෝමයක් බොරළු අතුරන ලද මාර්ග හෙයින් ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර වැසි සහිත කාලයන්හීදී ගමනාගමනය සඳහා වඩාත් අපහසු වේ.

තවද, පුල්මුඩේ සිට කෝකිලායි දක්වා වූ මුහුදු තීරයේ ටොන් මිලියන 04ක් පමණ වූ ඛනිජ වැලි සාන්ද්‍රණයක් ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ මෙම මූලාශ්‍ර ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීමට හැකිවනු ඇත. කෝකිලායි කුරුළු උද්‍යානය ද පිහිටා ඇත්තේ කෝකිලායි කලපුව ආසන්නයේය. එමනිසා, කෝකිලායි පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් සංචාරක කර්මාන්තය සංවර්ධනය මෙන්ම එම ප්‍රදේශයේ කර්මාන්ත සංවර්ධනය සඳහා ද දැවැන්ත රුකුලක් වනු නියතය. මුලතිව් - කෝකිලායි - පුල්මුඩේ මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ උපරිම ප්‍රයෝජනය ලබාගැනීම සඳහා කෝකිලායි කලපුව හරහා පාලම ඉදිකිරීම ඉතා වැදගත්වේ. එසේම, 2013 හා 2014 වසරවලදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික කටයුතු සිදුකර ඇති නමුත් ප්‍රමුඛතාවයේ වෙනසක් සිදුවීම හේතුවෙන් එය අත්හිටවූ වද 2018 වර්ෂයේදී එය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බැලීමට යොමු කරන ලදී.

චෙකොස්ලෝවෙන්ස්කානු Bilfinger MCE Slanys.r.o. විසින් ව්‍යාපෘති සම්පාදකයෙකු ලෙස භාරකාර පදනම මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සිය කැමැත්තෙන්ම ව්‍යාපෘති යෝජනාවක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලදී. චෙකොස්ලෝවෙන්ස්කාවේ සීඑස්ඕබී බැංකුව (CSOB) මඟින් යුරෝ මිලියන 48.8 ක කොන්ත්‍රාත් වටිනාකමක් ලබා දී ඇති අතර ඉන් යුරෝ මිලියන 41.5 ක් සීඑස්ඕබී බැංකුව (CSOB) මඟින් සපයන අතර ඉතිරි යුරෝ මිලියන 7.3 හැටන් නැෂනල් බැංකුව (HNB) විසින් ලබා දෙනු ඇත. කෝකිලායි පාලමේ පිහිටීම දැක්වෙන සිතියම ***ඇමුණුම 02*** හි දක්වා ඇත.

## 3.0 අධිවේගී මාර්ග සංවර්ධනය

ඕනෑම රටක පුද්ගල ජීව තත්වය වැඩිදියුණු කිරීමට සහ වේගවත් ආර්ථික සංවර්ධනයක් ඇති කරලීමට කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ස්ථාපනය පූර්ව අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. පවතින මාර්ග ජාලය ඉතා පුළුල් වුවද බොහෝ ජාතික හා පළාත් මාර්ග ඉදිකර ඇත්තේ දැනට අවුරුදු 50 කටත් බොහෝ කලකට පෙර වන අතර එමඟින් පහසුකම් සලසා ඇත්තේ එකී කාලයේ පැවති රථවාහන ධාරිතාවය සහ වාහනවල වර්ගයන් සහ අදාල වේග සීමාවන්ට අනුවය.

එමනිසා දිවයිනේ සියලුම ප්‍රදේශ එකිනෙක සම්බන්ධ කරමින් එහා මෙහා යා හැකි උසස් තත්වයකින් යුත් මාර්ග ජාලයක අවශ්‍යතාවය මේ වන විට හඳුනාගෙන ඇති නිසා ජාතික මාර්ග ජාලය වර්ධනය උදෙසා සියලුම ආර්ථික මධ්‍යස්ථාන ආවරණය වන පරිදි කි.මී. 800 කින් යුත් අධිවේගී මාර්ග ජාලයක් ඇති කිරීමට සැලසුම් කර ඇත.

උක්ත අධිවේගී මාර්ග ජාලය යටතේ පහත දැක්වෙන අධිවේගී මාර්ග 08 හඳුනාගෙන ඇත.

- කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
- දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
- පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය
- දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය
- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
- රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය
- නව කැළණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණුමත ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය
- කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය

කි.මී.169.3 දිගකින් යුත් අධිවේගී මාර්ග ජාලය කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය,දක්ෂිණ අධිවේගී මාර්ගය සහ පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතියේ කොට්ටාව සිට කඩවත දක්වා වූ අධිවේගී මාර්ග කොටස ලෙස මේ වන විට ක්‍රියාත්මක තත්වයේ පවතින අතර එමගින් කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීමේ හැකියාව ලැබී ඇත.

ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලය විදහා දැක්වෙන සිතියම **ඇමුණුම 03** හි දක්වා ඇත.

පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර III, දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සහ මධ්‍යම අධිවේගී මාර්ගය අදියර II යන ව්‍යාපෘතීන් 2019 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂිත වන ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ජාලයේ නවතම සාමාජිකයන් වේ.

## 3.1. අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශය

මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකාරියේ, අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු සහ කළමනාකරණ අංශය සතු වගකීම වන්නේ මෙහෙයුම් කටයුතු, නඩත්තු කිරීම් කටයුතු සහ කළමනාකරණය යන කාර්යයන් ඉටුකිරීම මඟින් අධිවේගී මාර්ගයන්හි කටයුතු බාධා රහිතව පවත්වාගෙන යාමයි.

මෙම අංශයේ ප්‍රධාන වගකීම් වනුයේ අයවැය කරණය සහ විගණනය කිරීම ද ඇතුළත්ව රථවාහන ගමනාගමන කටයුතුවල මූලික සැලසුම් කිරීම්, කළමනාකරණය කිරීම සහ මෙහෙයවීම, ගාස්තු අයකිරීමේ කාර්යයන් සහ අධිවේගී මාර්ගයන්හි අදාල නඩත්තු කටයුතු සිදු කිරීම වේ.

දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ රථවාහන ගමනාගමන ධාරිතාවය පිළිබඳ විස්තර වගු අංක 3.1.1 හි දක්වා ඇත. උක්ත අධිවේගී මාර්ගයන්හි රථවාහන ධාරිතාවන් සංසන්දනාත්මක ව ***ඇමුණුම 4(අ)*** මගින් ප්‍රස්ථාරිකව නිරූපණය කර දක්වා ඇත.

**වගු අංක 3.1.1 - පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ රථවාහන ගමනාගමන ධාරිතාවය**

| වර්ෂය | දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය සඳහා සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය | කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සඳහා සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය |
|---|---|---|
| 2011 | 8,531 | - |
| 2012 | 9,458 | - |
| 2013 | 11,737 | 15,194 |
| 2014 | 19,095 | 18,401 |
| 2015 | 27,736 | 20,782 |
| 2016 | 44,384 | 23,974 |
| 2017 | 52,977 | 25,844 |
| 2018 | 60,524 | 27,971 |

වගු අංක 3.1.1 හි ඇති දත්ත මගින් දැක්වෙන පරිදි 2018 වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය යන අධිවේගී මාර්ගයන්හි සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය 2017 වර්ෂය සමඟ සැසඳූ විට 14%කින් වර්ධනය වී ඇත. උක්ත අධිවේගී මාර්ගයන්හි මගී භාවිතය සංඛ්‍යාත්මකව ඉහළ යාම මීට බලපෑ ප්‍රධාන හේතුවයි. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ සාමාන්‍ය දෛනික රථවාහන ගමනාගමන ධාරිතාවය 2017 වර්ෂය සමඟ සැසඳූ විට 2018 වර්ෂයේදී 8%කින් වර්ධනය වී ඇත. 2018 දෙසැම්බර් 31 දිනට වාර්තා වී ඇති දත්තයන්ට අනුව පසුගිය වසර කිහිපය සමඟ සැසඳුවිට රථවාහන ගමනාගමන ධාරිතාවයේ උපරිම වර්ධනය වාර්තා වී ඇත්තේ 2018 වර්ෂයේදීය.

උක්ත අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ගමනාගමන ධාරිතාවය පහත පරිදි දැක්විය හැක.

**වගුඅංක 3.1.2 – 2018 වසරේ මාසික රථවාහන ගමනාගමන ධාරිතාවය**

| මාසය | රථවාහන ගමනාගමන ධාරිතාවය | |
|---|---|---|
| | දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය | කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය |
| ජනවාරි | 1,824,645 | 889,783 |
| පෙබරවාරි | 1,607,721 | 769,693 |
| මාර්තු | 1,867,735 | 848,883 |
| අප්‍රේල් | 1,870,813 | 794,963 |
| මැයි | 1,814,713 | 820,112 |
| ජූනි | 1,742,304 | 817,965 |
| ජූලි | 1,824,481 | 877,078 |
| අගෝස්තු | 2,064,149 | 934,067 |
| සැප්තැම්බර් | 1,856,199 | 848,896 |
| ඔක්තොම්බර් | 1,806,040 | 842,979 |
| නොවැම්බර් | 1,758,602 | 807,515 |
| දෙසැම්බර් | 2,102,059 | 957,780 |
| **එකතුව** | **22,091,461** | **10,209,714** |

2018 වර්ෂයේදී උක්ත අධිවේගී මාර්ගයන්හි උපරිම රථවාහන ගමනාගමන ධාරිතාවයක් වාර්තා වී ඇත්තේ දෙසැම්බර් මාසයේදී වන අතර අවම අගය වාර්තා වී ඇත්තේ පෙබරවාරි මාසයේදීය. 2017 වර්ෂයේදී ද රථවාහන ගමනාගමනයේ උපරිම හා අවම අගයන් වාර්තා වී ඇත්තේ 2018 වසරේ වාර්තා වූ ලෙසින්මය. මෙය සැම වසරකදීම සමාන රටාවකට සිදුවන්නක් බව නිරීක්ෂණය වන කරුණකි. 2018 වර්ෂයේ දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයන්හි මාසික රථවාහන ගමනාගමන ධාරිතාවයන්හි සන්සන්දනාත්මක විස්තරයක් ***ඇමුණුම 04 (ආ)*** මඟින් දක්වා ඇත.

2011 සිට 2018 වසර දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වාර්ෂික ආදායම වගු අංක 3.1.3 මඟින් දක්වා ඇත. උක්ත දක්ෂිණ අධිවේගී මාර්ගයේ සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ ආදායම 2017 වසර සමඟ සැසඳූ විට 13%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2011 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ජනතා අයිතියට පත්වූ දක්ෂිණ අධිවේගී මාර්ගයේ අදියර 1 හි ආදායම 2012 වර්ෂයේදී වාර්තා ගතලෙස ඉහළයාමක් දිස්වුණි. 2012 වර්ෂය ආරම්භයේ සිට දෙසැම්බර් දක්වා උපයන ලද ආදායම දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිතයෙන් පමණක් වූ අතර කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ ප්‍රථම අදියර දෙසැම්බර් මස මගී ජනතාව සඳහා විවෘත වීමත් සමඟ එහි භාවිතයෙන් එක්වන ආදායම ද ඊට එක්විය. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ වාර්ෂික ආදායම 2017 වර්ෂය හා සැසඳුකළ 2018 වර්ෂයේදී 8% ක වර්ධනයක් පෙන්වා ඇත. 2013 ඔක්තොම්බර්

මාසයේදී කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ජනතා අයිතියට පත් කෙරුණු අතර එමඟින් උපයන ලද ආදායම 2014 වර්ෂයේදී වාර්තාගත ලෙස වර්ධනය වී ඇත. උක්ත අධිවේගී මාර්ගයෙහි ආදායම් ඉපැයීම පිළිබඳ සංසන්දනාත්මක විස්තරයක් ***ඇමුණුම 04 (ඇ)*** මඟින් දක්වා ඇත.

**වගුඅංක 3.1.3 – දක්ෂිණ අධිවේගී මාර්ගය, කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගය සහ කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ ආදායම**

| වර්ෂය | දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි ආදායම ( රු.මි ) | කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි) |
|---|---|---|
| 2011 | 83.19 | - |
| 2012 | 1,017.02 | - |
| 2013 | 1,256.65 | 282.16 |
| 2014 | 2,141.35 | 1,887.73 |
| 2015 | 3,128.89 | 2,163.27 |
| 2016 | 4,550.89 | 2,496.81 |
| 2017 | 5,214.20 | 2,606.75 |
| 2018 | 5,893.92 | 2,821.78 |

ඉහත සඳහන් කළ අධිවේගී මාර්ගයන්හි ගමන් කරන ලද වාහන වලින් උපයන ලද ආදායම පිළිබඳ සලකා බැලීමේදී 2016 සහ 2017 වර්ෂවලදී මෙන්ම 2018 වර්ෂයේදී ද දෙසැම්බර් මාසයේදී වැඩිම ආදායමක් වාර්තා වී ඇති අතර අඩුම ආදායම වාර්තා වී ඇත්තේ පෙබරවාරි මාසයේදීය.

**වගු අංක 3.1.4 - මෙහෙයුම් තත්ත්වයෙහි පවතින අධිවේගී මාර්ගයන්හි 2018 වසර සඳහා වාර්තා වූ ආදායම**

| මාසය | දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි) | කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි) |
|---|---|---|
| ජනවාරි | 492.80 | 245.25 |
| පෙබරවාරි | 441.87 | 213.83 |
| මාර්තු | 510.49 | 234.98 |
| අප්‍රේල් | 513.55 | 220.48 |
| මැයි | 470.50 | 225.78 |
| ජූනි | 450.97 | 225.06 |
| ජූලි | 470.50 | 242.44 |
| අගෝස්තු | 542.13 | 258.88 |

| මාසය | දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි) | කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයෙහි ආදායම (රු.මි) |
|---|---|---|
| සැප්තැම්බර් | 494.80 | 234.58 |
| ඔක්තොම්බර් | 471.06 | 232.86 |
| නොවැම්බර් | 465.88 | 223.41 |
| දෙසැම්බර් | 569.37 | 264.22 |
| එකතුව | **5,893.92** | **2,821.77** |

ඉහත වගුවට අනුව කි.මී. 1 ක් සඳහා වාර්තා වූ ආදායම දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොට්ටාව සිට කඩවත දක්වා වූ පිටත වටරවුම් අධිවේගී මාර්ගයට සාපේක්ෂව කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඉහළ අගයක් ගෙන ඇති බවක් දක්නට ලැබේ. 2018 වර්ෂය සඳහා උක්ත අධිවේගී මාර්ගයන්හි වාර්තාගත ආදායම **ඇමුණුම අංක 04 (ඇ)** මගින් තවදුරටත් දක්වා ඇත.

## 3.2 පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය

කොළඹ නගරයට ප්‍රවේශවීම සඳහා නිර්මිත පිටත වටරවුම් මහාමාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හා කොළඹ නගරයේ සිට විහිදෙන අනෙකුත් ජාතික මහාමාර්ගයන් (ඒ1,ඒ3,ඒ4) හා සම්බන්ධ වන නව අධිවේගී මාර්ගයකි. කි.මී 29.1ක දිගකින් යුත් මෙම අධිවේගී මාර්ගය පැ.කි.මී. 80 -100 ත් අතර වේග සීමාවන් සඳහා සැලසුම් කර ඇත. මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පහත දැක්වෙන පරිදි අදියරයන් 03කට වෙන් කර ඇත.

- I වන අදියර - කොට්ටාව සිට කඩුවෙල දක්වා කොටස (කි .මී.11)
- II වන අදියර - කඩුවෙල සිට කඩවත දක්වා කොටස (කි.මී. 8.9)
- III වන අදියර - කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස (කි.මී. 9.3)



**පිටත වටරවුම් අධිවේගී මාර්ගය-කොට්ටාව සිට කඩවත දක්වා කොටස**

මෙම ව්‍යාපෘතියෙහි පළමු අදියරෙහි හා දෙවන අදියරෙහි වැඩකටයුතු සම්පූර්ණයෙන්ම නිමාවට පත්කර මහජනතාව වෙත විවෘත කරඇති අතර ඒ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අදියර | දුර (කි.මී) | ආරම්භ කළ වර්ෂය | අවසන් කළ වර්ෂය | මූල්‍යාධාර සපයන ආයතනය | අන්තර් හුවමාරු මධ්‍යස්ථාන |
|---|---|---|---|---|---|
| **1** | 11 | 2009 | 2014 | ජපාන ජාත්‍යාන්තර සහයෝගීතා ආයතනය (JICA) | කොට්ටාව, අතුරුගිරිය, කොතලාවල |
| **2** | 8.9 | 2011 | 2015 | | කඩුවෙල, කඩවත |

එහෙත් පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ දෙවන අදියරෙහි සියලු ඉදිකිරීම් කටයුතු 2015 වර්ෂය වනවිට නිමාවට පත් කෙරුණු අතර 2018 වර්ෂයේදී බිල්පත් ගෙවීම් කටයුතු පමණක් සිදු කෙරුණි.

එමනිසා 2018 දෙසැම්බර් මස 31 වන විට මෙම ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය 96% ක් වන අතර 2017 එම අගය 2017 වර්ෂයේදීද සඳහන් වන්නේ 96% ක් ලෙසය.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘති විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **117-02-03-05** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 10.0 | 13.0 | 12.5 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 710.0 | 379.0 | 364.1 |
| | **එකතුව** | **720.0** | **392.0** | **376.6** |

පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය අදියර III හි විස්තර පහත සඳහන් පරිදි වේ.

### III වන අදියර - කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටස (කි.මී. 9.3)

පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ III වන අදියර වන කඩවත සිට කෙරවලපිටිය දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි මාසයේදී ආරම්භ කළ අතර 2019 වසරේ මැදභාගය වන විට නිම කිරීමට අපේක්ෂා කරන අතර ඒ අනුව එහි කාලසීමාව මාස 42කි. මෙම අදියරෙහි සම්පූර්ණ දිග ප්‍රමාණය කි.මී. 9.3 කි. මෙම ව්‍යාපෘතිය චීන ආනයන හා අපනයන බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන අතර මුළු ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 494.03කි. මෙම අදියර සිවිල් වැඩ කොන්ත්‍රාත්තු සඳහා 2017 වර්ෂයේදී 34% ක ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2018 දෙසැම්බර් 31 වනවිට එම අගය 84% ක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව මෙම අදියර 2018 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු සඳහා 50% ක ඉහළ කාර්යසාධනයක් අත්පත්

කරගෙන ඇති බව පෙනීයයි. එහෙයින් 2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ ඉලක්ක කරා ළඟාවීමේ ප්‍රගතිය 100% ක් ලෙස දැක්විය හැකි අතර 2018 වසරේ ඉලක්කගත අගය වූයේ 50%කි.

මිල්ලගහවත්ත නැවත පදිංචි කිරීමේ භූමියෙහි අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම සහ ජයසුමනවත්ත - අදියර 1 හි අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ කටයුතු ද 2017 වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන්ම නිම කර ඇත. ජයසුමනවත්ත - අදියර 2 හි අභ්‍යන්තර මාර්ග ඉදිකිරීමේ කටයුතු 2017 වසරේ සිව්වන කාර්තුවේදී ආරම්භ කෙරුණු අතර 2017 දෙසැම්බර් 31 වනවිට 2% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. නමුත්, 2018 වර්ෂයේ ඔක්තොම්බර් වනවිට එම කටයුතු සම්පූර්ණයෙන්ම නිමාවට පත්විය.

2018 දෙසැම්බර් 31 වනවිට ව්‍යාපෘතිය අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැක.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘති විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **117-02-03-10** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 400.0 | 72 | 56.0 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 3030.0 | 17,313.0 | 13167.6 |
| | **එකතුව** | **3,430.0** | **17,385.0** | **13,223.6** |

සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට අනුව මෙම ව්‍යාපෘතිය අත්පත් කරගත් මූල්‍ය ප්‍රගතිය 76% ක් ලෙස දැක්විය හැකිය. ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මූලික අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය වසරේ මුල්භාගය වනවිට සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගන්නා ලදී. එහෙයින්, ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී තවත් ප්‍රතිපාදන ලබාදෙන ලදී. නමුත් ප්‍රතිශතාත්මකව බලන කල ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය 2017 වර්ෂයට වඩා අඩු අගයක් ගෙන තිබිණි.

කෙසේවෙතත් 2017 වර්ෂය අවසන් වනවිට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 88% ක් පමණක් ව්‍යාපෘතිය මඟින් උපයෝගී කරගෙන ඇත. 2018 වසරේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, සිවිල් වැඩ / ඉදිකිරීම් කටයුතු සඳහා 50% ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2018 ක්‍රියාකාරී සැලැස්මට අනුව අධිවේගී මාර්ග ඉදිකිරීමෙහි ඉලක්ක පූර්ණ කිරීම 100% ක් ලෙස සඳහන්ව ඇත.

පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර 3 පිහිටීම දැක්වෙන සිතියමක් ***ඇමුණුම 05*** හි දක්වා ඇත.



කි.මී.0+915 ඉදිරියට ඇති කුළුණු 1



6 වන කි.මී. ඉවුරු ඉදිකිරීම

## 3.3 මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

නව යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගය මීට ඉහත යෝජනා වී තිබූ කොළඹ - නුවර අධිවේගී මාර්ගයේ හා උතුරු අධිවේගී මාර්ගයේ විෂය පථයන් ඒකාබද්ධ කර නව අධිවේගී මාර්ගයක් ලෙස හඳුන්වා දෙන ලද අතර මෙම නව සැලැස්ම මධ්‍යම අධිවේගී මාර්ගය ලෙස නම් කරන ලදී. යෝජිත මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදකිරීම් කටයුතු කොන්ත්‍රාත් පැකේජ 04ක් යටතේ සිදු කිරීමට තීරණය කර ඇති අතර ඊට අදාල තොරතුරු පහත දක්වා ඇත. ඉදිකිරීමට නියමිත සම්පූර්ණ මාර්ග කොටසෙහි ආර්ථික ශක්‍යතා අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර ඇති අතර එය මොරටුව විශ්වවිද්‍යාලය මඟින් සිදු කරන ලදී. එසේම, මේ සඳහා වන පාරසරික බලපෑම් තක්සේරු වාර්තාව සඳහා අනුමැතිය ලබා දී ඇත.

**පැකේජ අංක 1: කඩවත සිට මීරිගම දක්වා කොටස**

මංතීරු හතරකින් යුත් මෙම කොටසේ සම්පූර්ණ දිග ප්‍රමාණය කි.මී. 37.09 ක් වන අතර එය කඩවත, ගම්පහ, වේයන්ගොඩ සහ මීරිගම-දකුණ යන ස්ථානවල පිහිටි අන්තර් හුවමාරු 04කින් ද සමන්විත වේ. මෙම අදියර කොන්ත්‍රාත් පැකේජ 02ක් යටතේ සිදු කෙරේ.

I. කොන්ත්‍රාත් පැකේජ 1 - කඩවත සිට කොස්සින්න දක්වා කොටස ඉදිකිරීම
II. කොන්ත්‍රාත් පැකේජ 2 - කොස්සින්න සිට මීරිගම දක්වා කොටස ඉදිකිරීම

කොන්ත්‍රාත් පැකේජ 1 සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුම 2016 ජූලි මාසයේ ද කොන්ත්‍රාත් පැකේජ 2 සඳහා වන කොන්ත්‍රාත් ගිවිසුම 2015 අගෝස්තු මාසයේදී ද චීනයේ එම්සීසී (MCC) සමාගම සමඟ අත්සන් කරන ලදී. 2018 වර්ෂයේ අවසානය වනවිට මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය 86% ක් වන අතර ඉන් 6% ක් 2018 වර්ෂය තුලදී අත්පත් කරගන්නා ලදී. 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා අත්කරගත් භෞතික ප්‍රගතිය 30% කි. එසේවුවද, මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2018 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිමා කිරීමට සැලසුම් කර තිබුන ද, එය සිදු කරගැනීමට නොහැකි වූයේ වන්දි ගෙවීමේ ප්‍රමාදය සහ මහජන විරෝධතාවයන් වැනි විවිධ ගැටළු හේතුවෙනි. එසේම, ඇතැම් අදියරවල ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාදවී ඇත්තේ ඒවායෙහි වංගු සහිත මාර්ග කොටස් පැ.කි.මී. 110 ක වේගසීමාවකට උචිත වන පරිදි පුළුල් කිරීමේ

නිර්මාණ කටයුතු අවසන් අදියරේ පවතින බැවිනි. මෙම අදියරෙහි සිවිල්වැඩ 2016 සැප්තැම්බර් වනවිට ආරම්භ කෙරුණු අතර 2016 වසර අවසන් වනවිට 0.2% ක ප්‍රගතියක් අත් කරගෙන ඇත. 2017 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතිය අත්කරගත් සමස්ත භෞතික ප්‍රගතිය 1%කි. එහෙත් 2018 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියෙහි සිවිල්වැඩ සඳහා වූ සමුච්චිත ප්‍රගතිය 5%කි. 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම අදියරෙහි ඉලක්ක පූර්ණය කිරීම 16%කි. මේ සඳහා බලපෑ ප්‍රධාන හේතුව වන්නේ මෙම අදියර සඳහා වන ණය ගිවිසුම මේ වනතෙක් අත්සන් කර නොමැතිවීමය.



බොරළු ස්ථරයක් යොදා මෘදු බිම් සැකැස්ම



කුළුණු ඉදිකිරීම සඳහා සිදුරු සැකසීම 18

**පැකේජ අංක 2 : මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස**

මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවන කොටසේ ඉදිකිරීම් කටයුතු 2019 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට නියමිතව ඇත. මංතීරු 04කින් යුත් මෙම අධිවේගී මාර්ග කොටස දළ වශයෙන් කි.මී. 39.7 ක දිගකින් යුක්ත වන අතර මීරිගම-උතුර, නාකලගමුව, පොතුහැර (හුවමාරු පද්ධතිය), දම්බොක්ක සහ කුරුණෑගල යන ස්ථානවල පිහිටා ඇති අන්තර්හුවමාරු 05කින් ද සමන්විත වේ. ශ්‍රී ලංකා රජය විසින් දේශීය බැංකු හරහා ණය මුදලක් මෙම අදියර සඳහා වෙන් කර ඇත. 2018 වර්ෂය අවසන් වනවිට මෙම අදියර ඉඩම් අත්පත් කරගැනීම සඳහා අත්කරගත් සමස්ත ප්‍රගතිය 87%කි. 2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම අධිවේගී මාර්ග කොටසෙහි ඉඩම් අත්පත් කරගැනීම සඳහා ආසන්න වශයෙන් 60% ඉලක්කයක් පූර්ණය කරගෙන ඇත. මෙම අදියරෙහි සිවිල්වැඩ ක්‍රියාකාරකම් සඳහා 2017 සහ 2018 වර්ෂ පිළිවෙලින් 7.5% හා 52% භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත. මෙයින් ප්‍රත්‍යක්ෂ වන කරුණ වන්නේ මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවන කොටස 2018 වසරේදී වේගවත් හා ඵලදායී කාර්යසාධනයක් කරා ළඟාවී ඇති බවයි. තවද, 2018 වසර තුළදී ව්‍යාපෘතිය සඳහා කිසිදු මූල්‍යමය බාධාවක් ඇති නොවී ප්‍රමාණවත් පරිදි මූල්‍යමය සහයෝගය ලැබුනේනම් වඩාත් හොඳ කාර්යසාධනයක් අත්පත් කරගැනීමට හැකියාව සැලසෙනු ඇත.



මාර්ගයේ කැණීම් කටයුතු සිදුකිරීම 58+530-58+770



ඒබීසී ඇතිරීම හා කුළුණු උපයෝගී කරගැනීම 57+380-57+830

**පැකේජ අංක 3 : පොතුහැර සිට ගලගෙදර දක්වා කොටස**

මංතීරු 04කින් සහ පොතුහැර, පොල්ගහවෙල, රඹුක්කන හා ගලගෙදර පිහිටි අන්තර්හුවමාරු 04කින් ද සමන්විත මේ කොටසේ මුළු දුර ප්‍රමාණය කි.මී. 32.5කි. ටෝකියෝ - මිට්සුබිෂී බැංකුව මඟින් මේ සඳහා මූල්‍යාධාර සැපයීමට එකඟත්වය පළකර ඇති අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා වූ මුළු කාලසීමාව අවුරුදු 03කි.

මෙම අදියරේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 84% ක ප්‍රගතියක් සහිතව මේ වනවිට සිදුකරමින් පවතී. 2017 වර්ෂය අවසන් වනවිට මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීම සඳහා 71% ක සමස්ත ප්‍රගතියක් වාර්තා වී ඇති අතර 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ ඉඩම් අත්පත් කරගැනීමේ භෞතික ඉලක්ක පූර්ණය කිරීමේ සමස්ත ප්‍රගතිය 43%කි. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සඳහා අපේක්ෂා කරනු ලැබූ ඉලක්කය කරා ළඟාවීමට නොහැකි වූයේ මූල්‍යමය බාධාවන් ඇතිවීම වැනි විවිධාකාරයේ ගැටළු පැනනැඟීම හේතුවෙනි.

මෙම අදියරෙහි සිවිල් වැඩ මෙතෙක් ආරම්භකර නොමැත. සීමිත ජාතික ලංසු කැඳවීමේ ක්‍රමය මඟින් ජපන් ජාතික කොන්ත්‍රාත්කරුවෙක් හා උපදේශකවරයෙක් තෝරාගෙන ඇති අතර මෙතෙක් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සිදු කර නොමැත. ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සහ විස්තරාත්මක ජලවිද්‍යා අධ්‍යයනය සම්පූර්ණයෙන්ම නිම කර ඇත.

- **පැකේජ අංක 04: කුරුණෑගල සිට දඹුල්ල දක්වා කොටස**

මංතීරු 04කින් යුත් මෙම අධිවේගී මාර්ග කොටසෙහි මුළු දුර කි.මී. 60.3 ක් වන අතර රිදීගම, මැල්සිරිපුර, ගලේවෙල, දඹුල්ල (ඒ009) හා දඹුල්ල (ඒ006) යන ස්ථානවල අන්තර් හුවමාරු පද්ධති 05ක් ඉදිකිරීමටද යෝජිතව ඇත. මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු සඳහා චීන ආනයන අපනයන බැංකුව (EXIM Bank) මඟින් මූල්‍යාධාර සැපයීම සඳහා එකඟත්වය පලකර ඇත. මධ්‍යම අධිවේගී මාර්ගයේ සිව්වන අදියරෙහි ශක්‍යතා අධ්‍යයන කටයුතු හා පාරසරික බලපෑම් තක්සේරු වාර්තාව (EIA) අවසන් කර ඇති අතර ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය 16%ක භෞතික ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි එහි ඉලක්කගත අගය ලෙස සඳහන් කර ඇත්තේ 40%කි. ඒ අනුව, ව්‍යාපෘතිය 40%ක ඉලක්කයක් පූර්ණය කරගෙන ඇත. 2018 දෙසැම්බර් 31 වනදින වනවිට මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ සමුච්චිත භෞතික ප්‍රගතිය 68%කි.

2018 වර්ෂය අවසානයේදී මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අත්කරගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය 97% ක් වන අතර 2017 වර්ෂය අවසානයේදී එම අගය වාර්තා වී තිබුණේ 70%ක් ලෙසිනි. ව්‍යාපෘතියෙහි ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කරගැනීම සඳහා අයවැය මඟින් වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය 2018 වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම උපයෝගී කරගැනීමට නොහැකි විය. එමනිසා, එකී ප්‍රතිපාදනයන් මුදල් හුවමාරු කිරීමේ රෙගුලාසි වලට අනුකූලව වෙනත් ව්‍යාපෘති සඳහා මාරු කරන ලදී. එසේම, 2018 වසර තුළදී, යටිතල පහසුකම් සංවර්ධනය උදෙසා වැයවන වියදම් සැපයීමට නොයෙකුත් විධිවිධාන සලසා ඇත.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | ව්‍යාපෘති විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **117-02-03-7** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 5,000.00 | 2,243.00 | 2,236.67 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 3,700.00 | 5,664.00 | 5,439.00 |
| | **එකතුව** | **8,700.00** | **7,907.00** | **7,676.00** |

මධ්‍යම අධිවේගී මාර්ගයේ පිහිටීම විදහා දැක්වෙන සිතියම **ඇමුණුම 06** හි දක්වා ඇත.

## 3.4 දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය

දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීම, දකුණු පළාතේ මාර්ග ජාලය පුළුල් කිරීමේ එක් ප්‍රධාන අංගයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ හම්බන්තොට වරාය හා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ශ්‍රී ලංකාවේ වාණිජ අගනුවර සමඟ සම්බන්ධ කිරීමයි. 2015 ජූලි මස 04 වන දින චීන ආනයන හා අපනයන බැංකු අරමුදල් යටතේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ අතර එහි සමස්ත ණය මුදල රුපියල් බිලියන 171.52ක් පමණ වේ.

මෙම අධිවේගී මාර්ගයේ මුළු දුර ප්‍රමාණය කි.මී. 96ක් වන අතර ගොඩගම - නාගොඩ, අපරැක්ක, බෙලිඅත්ත, කසාගල, අඟුණුකොළපැලැස්ස, වැටිය, සූරියවැව සහ අන්දරවැව යන ස්ථානවල පිහිටි අන්තර්හුවමාරු මධ්‍යස්ථාන 08කින ද සමන්විත වේ. උක්ත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු පහත පරිදි කොටස් 04ක් යටතේ සිදුකෙරෙමින් පවතී.

**අදියර 1 : මාතර සිට බෙලිඅත්ත දක්වා කොටස (කි.මී 0.0 - කි.මී 30.0)**

කි.මී. 30 ක දුර ප්‍රමාණයකින් යුත් දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියරෙහි ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි මාසයේදී ආරම්භ කළ අතර 2019 ජූලි මාසයේදී නිමකිරීමට අපේක්ෂිතය. ඒ අනුව ව්‍යාපෘතියේ කාලසීමාව මාස 42කි. 2018 දෙසැම්බර් 31 වනවිට මෙම අදියරෙහි සමස්ත භෞතික ප්‍රගතිය 82% ක්වන අතර 2017 වර්ෂය අවසානයේදී එම අගය 52%ක් ලෙස වාර්තා වී තිබිණි. 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම අදියරෙහි භෞතික ඉලක්ක සපුරාගැනීම 70%කි. 2018 වර්ෂය තුළදී භෞතික ක්‍රියාකාරකම් සඳහා මෙම අදියර ළඟා කරගත් ප්‍රගතිය 30% කි. 2018 දෙසැම්බර් මස අවසානය වනවිට මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු, සමීක්ෂණ සහ විමර්ෂණ කටයුතු සම්පූර්ණ කර ඇති අතර විස්තරාත්මක නිර්මාණ ක්‍රියාවලිය 98%ක ද ඉවුරු ඉදිකිරීම 95%ක ද ප්‍රගතියක් සහිතව අවසන් අදියරේ පවතී.

**අදියර 2 : බෙලිඅත්ත සිට වැටිය දක්වා කොටස (කි.මී 30.0 - කි.මී 56.0)**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවේ දෙවන අදියර බෙලිඅත්ත සිට වැටිය දක්වා කි.මී. 26ක දුර ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඉදිකිරීම් කටයුතු 2016 ඔක්තොම්බර් මාසයේදී ආරම්භ කෙරිණි. 2017 වර්ෂය අවසානයේදී මෙම අදියර 29% ක සමස්ත භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබූ අතර 2018 වර්ෂය අවසානයේදී එම අගය 25%ක ප්‍රතිශතයකින් වර්ධනයවී 54% අගයක් කරා ළඟාවී තිබිණි. මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය 2018 වර්ෂය අවසන් වනවිට 99% ප්‍රගතියක් සහිතව සිදුකෙරෙමින් පවතින අතර 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළදී මෙම අදියර පූර්ණය කරගත් සමස්ත ඉලක්කය 54% කි.

**අදියර 3 : වැටිය සිට අන්දරවැව දක්වා කොටස (කි.මී 56.0 - කි.මී 71.0)**

කි.මී 15කින් යුතු මෙම අදියරෙහි ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි මාසයේදී ආරම්භ කළ අතර 2019 වර්ෂය තුළදී නිමකිරීමට අපේක්ෂිත වේ. 2017 වසරේ අවසානය වනවිට මෙම අදියර අත්කරගත් සමස්ත භෞතික ප්‍රගතිය 45% ක් විය. 2018 වර්ෂය තුළදී මෙම අදියර 44% ක ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර ඒ අනුව 2018 දෙසැම්බර් මාසය අවසන් වනවිට ව්‍යාපෘතිය අත්පත් කරගත් සමස්ත භෞතික ප්‍රගතිය 89%කි. 2018 සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව සිවිල් වැඩ සඳහා 51% ක ඉලක්කයක් සඳහන්ව තිබූ අතර 2018 වර්ෂය සඳහා වන ඉලක්ක පූර්ණය 86%කි.



**වලවේ පාලම ඉදිකිරීම**

**අදියර 4: අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා කොටස (කි.මී 71.0 - කි.මී 96.0)**

කි.මී. 25ක් දුරකින් යුතු මෙම අදියරේ ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි මාසයේ ආරම්භ කර 2019 ජනවාරි වනවිට නිමකිරීමට අපේක්ෂා කරන ලදී. නමුත්, අදාල කාලය තුළ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිමා කිරීමට නොහැකිවූයෙන් ව්‍යාපෘති කාලසීමාව තවත් මාස 06කින් දීර්ඝ කිරීමට සිදුවිය. ඒ අනුව, ව්‍යාපෘතියේ මුළු කාලසීමාව මාස 42කි. 2017 වසර අවසන් වනවිට මෙම අදියරෙහි සමස්ත භෞතික ප්‍රගතිය 48% ක්වූ අතර 2018 වර්ෂය තුළ සිව්වන අදියර සඳහා වාර්තා වූයේ 38% ප්‍රගතියකි. ඒ අනුව, 2018 දෙසැම්බර් අවසානය වනවිට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 86% ක් ලෙස සඳහන් කල හැක. මෙම අදියරෙහි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2017 වර්ෂය තුලදී සම්පූර්ණයෙන්ම නිමාවට පත්විය. 2018 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම අදියරෙහි භෞතික ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කය ඉක්මවා ඇති අතර ඉලක්ක පූර්ණය කිරීමේ අගය 131%කි.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘති විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018/12/31 දිනට සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| **117-2-3-9** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 1,500.00 | 836.00 | 834.39 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 13,578.00 | 51,873.5 | 39,185.55 |
| | **එකතුව** | **15,078.00** | **52,709.5** | **40,019.94** |



අන්දරවැව අන්තර්හුවමාරුව ඉදිකිරීම

මෙම ව්‍යාපෘතියේ සියළු අදියරයන් සඳහා 2017 වර්ෂය අවසානයේදී වාර්තා වී ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය 99% ක් වන අතර 2018 වර්ෂයේදී එම අගය 76% ක් ලෙස වාර්තා විය. අක්මුදල් ලැබීමේ ගැටළුවක් හේතුවෙන් 2018 වසර සඳහා මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කරන ලද මුළු මුදලම සම්පූර්ණයෙන්ම උපයෝගී කරගැනීමට නොහැකි විය. එසේ නැතහොත් 2018 වර්ෂය අවසන් වනවිට ගෙවීමට බැඳීසිටින වගකීමක් ලෙස සැලකියයුතු වටිනාකමකින් යුතු අතැති බිල්පත් ප්‍රමාණයක් ව්‍යාපෘතිය සතුවිය. දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවේ පිහිටීම දැක්වෙන සිතියමක් **ඇමුණුම 07** හි දක්වා ඇත.

## 4.0 මහාමාර්ග සංවර්ධනය

### 4.1 ශ්‍රී ලංකාවේ මහාමාර්ග ජාලය

මහාමාර්ග ජාලයට සම්බන්ධ අධිවේගී මාර්ග සහ ඒ හා බී වර්ගයේ මහාමාර්ග ඉදිකිරීම හා නඩත්තු කිරීමේ වගකීම මහාමාර්ග අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති මාර්ග සංවර්ධන අධිකාරිය සතු වේ. ඉහත එක් එක් ශ්‍රේණිවලට අයත් මහාමාර්ගයන්හි දැනට පවතින මාර්ග දුර ප්‍රමාණයන් පහත දැක්වේ.

**වගු අංක 4.1.1 ශ්‍රී ලංකාවේ ජාතික මහාමාර්ග ජාලය**

| ජාතික මාර්ග වර්ගය/ ශ්‍රේණිය | මුළු දුර (කි.මී) |
|---|---|
| 'ඒ' ශ්‍රේණියේ මහාමාර්ග | 4,215 |
| 'බී' ශ්‍රේණියේ මහාමාර්ග | 8,005 |
| අධිවේගී මාර්ග | 170 |
| **එකතුව** | **12,390** |

**වගු අංක 4.1.1 2018.12.31 වන විට "ඒ" හා "බී" වර්ගයේ මහාමාර්ගයන්හි පළාත්බද වර්ගීකරණය**

| පළාත | ජාතික මහාමාර්ග (කි.මී) | | |
|---|---|---|---|
| | "ඒ" වර්ගයේ මහාමාර්ග | "බී" වර්ගයේ මහාමාර්ග | එකතුව |
| බස්නාහිර පළාත | 374.48 | 1,229.82 | 1,604.30 |
| මධ්‍යම පළාත | 408.57 | 1,338.41 | 1,746.98 |
| දකුණු පළාත | 346.88 | 1,154.36 | 1,501.24 |
| උතුරු පළාත | 734.49 | 524.97 | 1,259.46 |
| නැගෙනහිර පළාත | 619.55 | 551.13 | 1,170.68 |
| වයඹ පළාත | 352.43 | 1,002.75 | 1,355.18 |
| උතුරු මැද පළාත | 492.04 | 701.74 | 1,193.78 |
| ඌව පළාත | 471.04 | 693.19 | 1,164.23 |
| සබරගමුව පළාත | 415.57 | 808.58 | 1,224.15 |
| **එකතුව** | **4,215.05** | **8,004.95** | **12,220.00** |

“ඒ” හා “බී” වර්ගයේ මහාමාර්ගවලින් වැඩිම මාර්ග ප්‍රමාණයක් පිළිවෙලින් උතුරු පළාත තුල හා මධ්‍යම පළාත තුල ද අඩුම ප්‍රමාණයක් දකුණු පළාත සහ උතුරු පළාත තුල ද පිහිටා ඇත. ජාතික මහාමාර්ග ජාලය ඉහත වගුවේ දක්වා ඇති පරිදි පළාත් වශයෙන් මෙන්ම මාර්ග ඉදිකිරිම/ නැවත ඉදිකිරීම සඳහා යොදා ගනු ලබන මතුපිට පෘෂ්ඨීය වර්ගීකරණය අනුවද පහත පරිදි ඉදිරිපත් කළ හැකිය.

වගු අංක **4.1.3** මතුපිට පෘෂ්ඨීය වර්ගීකරණය (%)

| මාර්ග ඇතුරුම් වර්ගය | දුර (කි.මී) | දායකත්වය ( %) |
|---|---|---|
| **ගල් මිශ්‍ර තාර ඇතිරීම** | 8272.3 | 72.1% |
| **මතුපිට පෘෂ්ඨීය ඇතුරුම** | 141.7 | 1.2% |
| **ගල් අතුරා තාර දැමීම** | 2896.5 | 25.3% |
| **කොන්ක්‍රීට් ඇතිරීම** | 98.2 | 0.9% |
| **බොරළු දැමීම** | 60.2 | 0.5% |

ඉහත වගුවේ දක්වා ඇති පරිදි ජාතික මහාමාර්ග ජාලය තුල වැඩිම මාර්ග ප්‍රමාණයක් සඳහා යොදා ගෙන ඇත්තේ කොන්ක්‍රීට් දැමීම වන අතර අඩුම මාර්ග ප්‍රමාණයක් සඳහා බොරළු දැමීම සිදු කර ඇත. එම මාර්ගයන්හි ප්‍රතිශතාත්මක ඉදිරිපත් කිරීම පහත ප්‍රස්ථාරයෙන් නිරූපණය වේ.




ප්‍රස්ථාර අංක 4.1 - මතුපිට පෘෂ්ඨීය වර්ගීකරණයේ නිරූපණය

**ජාතික මහාමාර්ග ජාලයේ වර්තමාන තත්වය**

2017 වර්ෂය තුල මාර්ග දුර කි.මී.174 ක් හා කි.මී. 33 ක් පිළිවෙලින් ජාතික මහාමාර්ග ජාලය තුල හා මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කරන ලදී. 2017 වර්ෂය විදේශීය ණය හා දේශීය බැංකු ණය මගින් කි.මී.360 ක් ප්‍රතිසංස්කරණය කරමින් පැවතිනි. මීට අමතරව, පාලම් 30ක් විදේශීය ආධාර යටතේ ත් පාලම් 13ක් දේශීය ආධාර මගිනුත් 2017 වර්ෂය තුල දී නැවත ඉදි කරන ලදී.

2018 වර්ෂයේදී විදේශීය හා දේශීය ණය ආධාර යටතේ කි.මී.47.73 ක් මාර්ග වැඩිදියුණු කිරීම/ පුනරුත්ථාපනය කිරීම සම්පූර්ණ කරන ලද අතර කි.මී.1,050 ක මාර්ග වල වැඩිදියුණු කිරීම් සිදු කෙරෙමින් පැවතිණි. ඊට අමතරව, විදේශ ආධාර යටතේ වර්ෂය තුල පාලම් 12 ක නැවත ඉදිකිරීම් සම්පූර්ණ කරන ලදී. තවද දේශීය ආධාර යටතේ ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම ව්‍යාපෘතිය යටතේ පාලම් 10 ක නැවත ඉදිකිරීම් සම්පූර්ණ කරන ලදී.

2018 වර්ෂයේදී "බී" වර්ගයේ මාර්ග දුර ආසන්න වශයෙන් කි.මී.10 කින් පමණ වැඩි වූ අතර එසේ වැඩිදියුණු කරන ලද මාර්ග පිළිබඳ විස්තර පහත වගුවෙන් දැක්වේ. මේ අනුව, කි.මී. 7,995 ලෙස පැවති බී ශ්‍රේණියේ මහාමාර්ග වල සමස්ත දුර ප්‍රමාණය කි.මී. 8005 ලෙස සංශෝධනයට ලක්විය.

**වගු අංක 4.1.2 2018 වර්ෂයේදී "බී" වර්ගයේ මහාමාර්ග ජාලය සඳහා අළුතින් එකතු කරන ලද මහාමාර්ග**

| අනු අංකය | මාර්ගයේ නම | දුර (කි.මී) |
|---|---|---|
| 1 | පැලවත්ත ආරක්ෂක මූලස්ථානය සඳහා ප්‍රවේශ මාර්ගය (බී 642) | 1.255 |
| 2 | කෑගල්ල අතුරු මාර්ගය (බී 643) | 4.400 |
| 3 | කැලණිමුල්ල - අංගොඩ - කොස්වත්ත මාර්ගය (බී 644) | 4.567 |

ශ්‍රී ලංකාවේ දැනට නිමකරන ලද සහ ක්‍රියාත්මක වන මාර්ග සඳහන් සිතියම ***ඇමුණුම 08*** හි දක්වා ඇත.

## 4.2 මාර්ග සහ පාලම් නඩත්තු කිරීම (RMTF)

ජාතික මහාමාර්ග කි.මී. 12,220 ක් සහ පාලම් 4,662 කට ආසන්න ප්‍රමාණයක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වාර්ෂිකව නඩත්තු කරනු ලැබේ. උක්ත වාර්ෂික නඩත්තු වැඩසටහන යටතේ මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත් අධ්‍යක්ෂකවරු, ප්‍රධාන ඉංජිනේරුවන් සහ විධායක ඉංජිනේරුවන් විසින් දෛනික, කාලීන සහ හදිසි වැඩිදියුණු කිරීම් කටයුතු සිදුකරනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ වැලි මුද්‍රිත තාර ආලේපනය, කඩතොළු පියවීම , මාර්ග උරහිස් ව්‍යුහ ඉදිකිරීම්, මාර්ග වැඩිදියුණු කිරීම් , සංඥා පද්ධති ස්ථාපිත කිරීම හා මාර්ග සලකුණු කිරීම් වැනි විවිධ පරාසයන්ට

අයත් වන මාර්ග නඩත්තු කිරීම් කටයුතු දිවයින පුරා සිදුකරනු ලැබේ. 2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා මාර්ග කි.මී. 110.62 ක් පමණ දුර ප්‍රමාණයක් ද 2018 වර්ෂයේදී කි.මී.227.2 ක පමණ දුර ප්‍රමාණයක්ද වැලි මුද්‍රිත තාර ආලේපන කටයුතු සෘජු ශ්‍රමය හා ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය(ICTAD) යටතේ ලියාපදිංචිය ලැබූ කොන්ත්‍රාත්කරුවන් යොදවා සිදු කරන ලදි. මාර්ග නඩත්තු කිරීමේ කටයුතු වල ප්‍රගතිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

**වගු අංක 4.2.1 – 2017/ 2018 වර්ෂයන්හි මාර්ග නඩත්තු කටයුතුවල ප්‍රගතිය**

| පළාත | 2017/12/31 වන විට වැලි මුද්‍රිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද දුර ප්‍රමාණය( කි.මී.) | 2018/12/31 වන විට වැලි මුද්‍රිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද දුර ප්‍රමාණය( කි.මී.) |
|---|---|---|
| බස්නාහිර පළාත | 1.7 | 3.7 |
| මධ්‍යම පළාත | 14 | 13.0 |
| දකුණු පළාත | - | - |
| උතුරු පළාත | | 26.0 |
| නැගෙනහිර පළාත | | 3.0 |
| නැගෙනහිර පළාත - අක්කරෛයිපත්තු | 19.07 | 25.0 |
| වයඹ පළාත | 2.5 | - |
| උතුරු මැද පළාත | 5.3 | 6.5 |
| ඌව පළාත | 21.32 | 28 |
| සබරගමු පළාත | 26.4 | 122.0 |
| ඉරිතැලීම් නැවත සැකසීම බස්නාහිර | 20.33 | - |
| **එකතුව** | **110.62** | **227.2** |

වගු අංක 4.2.1 හි දැක්වෙන ආකාරයට 2017 වර්ෂයේ මෙන්ම 2018 වර්ෂය තුල ද වැලි මුද්‍රිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද උපරිම මාර්ග දුර සබරගමු පළාතෙහි වාර්තා විය.

**රූපසටහන් 4.2.1** 2018 වර්ෂයේ වැලි මුද්‍රිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද දුර ප්‍රමාණය




වැලි මුද්‍රිත තාර ආලේපනය කර නැවත සකසන ලද සහ මතුපිට සකසන ලද මාර්ග දුර ප්‍රමාණයට අමතරව 2018 වර්ෂයේදී මාර්ගවල ගල් මිශ්‍ර තාර ඇතිරීමේ ක්‍රියාවලිය ද සිදු කරන ලද අතර එම ඉලක්කගත මාර්ග දුර ප්‍රමාණය වන කි.මී 191.6 අතුරින් 68% ක ඉලක්කයක් අත්පත් කරගෙන ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-01** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 5,000.0 | 5,385.0 | 4,360.0 |
| | **එකතුව** | **5,000.0** | **5,385.0** | **4,360.0** |

2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට මෙම වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය 81% වූ අතර 2017 වර්ෂයේදී එය 91% ලෙස වාර්තා විය. ඒ අනුව 2018 වර්ෂය තුල වාර්තා ගත මූල්‍ය ප්‍රගතිය වර්ෂ ආරම්භයේදී අපේක්ෂා කළ මූල්‍ය ප්‍රගතියට වඩා ඉහළ අගයක් විය.

2018 වර්ෂයේ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව එම ඉලක්කගත මූල්‍ය ප්‍රගතිය වර්ෂයේ මුල් කාර්තු තුන තුළදී ළඟා කරගැනීමට ව්‍යාපෘතියට හැකියාව ලැබී ඇත.

## 4.3. ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය

මෙම වැඩසටහන යටතේ මාර්ග ජාලය තුළ සිදු වන මාර්ග අනතුරු හේතුවෙන්, මාර්ග ආරක්ෂණය සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කරනු ලැබේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රධානතම ඒකකය වනුයේ මාර්ග සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයේ ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ඒකකයයි.

ඒ අනුව මෙම ඒකකය මඟින් පදිකයින්ගේ හා වාහන පදවන්නන්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මාර්ග ජාලය අනතුරු වලින් නිදහස් තැනක් කිරීමට සිය නිරන්තර උත්සාහයන් ක්‍රියාත්මක කරනු ලැබේ. උක්ත ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පහත වගුවේ දැක්වේ.

මෙම වැඩසටහන යටතේ විවිධ ක්‍රියාකාරකම් වාර්ෂිකව ක්‍රියාත්මක වන අතර එම ක්‍රියාකාරකම් හි ප්‍රමුඛත්වය මාර්ග ජාලය තුල ඇතිවන හදිසි තත්වයන් මෙන්ම මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් රථ වාහන පොලීසිය හා මහජනතාව විසින් සිදු කරන ඉල්ලීම් මත තීරණය වේ. නමුත් උක්ත වැඩසටහන සඳහා ජාතික අයවැය මඟින් වාර්ෂික අයවැය ප්‍රතිපාදන හා මාර්ග සංවර්ධන අධිකාරියේ ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ඒකකය සතු මානව සම්පත ප්‍රමාණවත් නොවීම මත ඇතැම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී ගැටළු සහගත තත්වයන් උද්ගත වී ඇත.

**වගු අංක 4.3.1. ජාල සැලසුම්කරණ හා මාර්ග ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ වන ක්‍රියාකාරකම්**



2018 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

| අයිතම | ක්‍රියාකාරකම | ප්‍රගතිය | % |
|---|---|---|---|
| 01 | ජාතික මාර්ග ජාලයෙහි හඳුනාගත් අනතුරුදායක ස්ථානයන්හි ආරක්ෂක උපකරණ සවිකිරීම. | ආරක්ෂක ප්‍රත්‍යාස්ථ කණු 100ක් සවිකිරීම | 100% |
| 02 | පාසල් සහ කර්මාන්ත කලාප අසල මාර්ග ආරක්ෂණ විධි වැඩිදියුණු කිරීම | මේ සඳහා පාසල් කලාප 5 ක් තෝරාගත් අතර ඒවායේ මාර්ග සංඥා සවිකිරීම. | 100% |

2017 වර්ෂයේදී මෙම වැඩසටහනේ මූල්‍ය ප්‍රගතිය 34% වූ අතර 2018 වර්ෂය අවසානයේදී එය 86% විය. 2018 වර්ෂය ආරම්භයේදී පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල සැලසුම් කල අයිතමයන් සියල්ලම ක්‍රියාත්මක නොවීම මත වර්ෂය තුල වෙන්කරන ලද අයවැය ප්‍රතිපාදන වෙනත් වැඩසටහනක් සඳහා මාරු කොට ඇත.

ඒ අනුව 2018 වර්ෂයේ සංශෝධිත අයවැය ප්‍රතිපාදනයට අනුව 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ඉහළ මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය - 2018 (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-21** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 25.0 | 19.0 | 16.36 |
| | **එකතුව** | **25.0** | **19.0** | **16.36** |

## 4.4. රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය

මෙය වාර්ෂික වැඩසටහනක් වන අතර පාසල්, රෝහල් හා පොදු ස්ථාන අසල පදිකයන්ගේ ආරක්ෂාව සඳහා සහ ජාතික මහාමාර්ග ජාලයෙහි මංසන්ධිහි රථවාහන තදබදය අවම කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග නිර්මාණ ඒකකය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ පහත ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

- මාර්ග සංඥා හා මාර්ග සලකුණු කිරීම් නිර්මාණය හා අධීක්ෂණය
- මාර්ග සංඥා සහිත අන්තර්හුවමාරු මධ්‍යස්ථානයන් නිර්මාණය, ස්ථාපනය කිරීම හා නඩත්තු කටයුතු

2017 වර්ෂය තුල විලියම් මංසන්ධියෙහි වාහන ආලෝක සංඥා පද්ධතිය වැඩිදියුණු කිරීම සම්පූර්ණ කළ අතර බෙල්ලන්විල පන්සල ,මව්න්ට් මේරි පල්ලිය, මොරටුව විශ්ව විද්‍යාලය යන ස්ථානයන්හි පදික මාරු හා වෙම්පඩි, කෝපායි , නෙල්ලිඅඩි, අරියකුලම්, චුන්නාක්කම් සහ තිරුනෙල්වේලි යන මංසන්ධින්හි වාහන ආලෝක සංඥා පද්ධතිය සවිකිරීම 2016 වර්ෂයේ දී සම්පූර්ණකරන ලදී.

පහත සඳහන් ක්‍රියාකාරකම් 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව නිමකිරීමට සැලසුම් කළද 2017 වර්ෂයේ දෙන ලද ප්‍රතිපාදන 2016 වර්ෂයේ දී නිම කරන ලද ක්‍රියාකාරම් වෙනුවෙන් ගෙවීමට තිබූ අතැති බිල්පත් වලින් කොටසක් ගෙවීම සඳහා උපයෝගී කරගත් බැවින් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය( 2016 වර්ෂය අවසාන වනවිට වැඩ නිමකළ ද බිල්පත් ගෙවීම සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොලැබුණි.)

- කදාන මංසන්ධියෙහි පදික මාරුව නිම කිරීම සහ සංඥා සවි කිරීම.
- ගල්කිස්ස දිසා අධිකරණය ඉදිරිපිට පදික මාරුව නිම කිරීම.
- දෙපානම ( බත්තරමුල්ල - පන්නිපිටිය මාර්ගයෙහි ) පදික මාරුව නිම කිරීම.
- නාවල විවෘත විශ්ව විද්‍යාලය අසල පදික මාරුව.

2018 වර්ෂයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්‍රියාකාරකම් 04 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කළ අතර වර්ෂය තුල දී එම ක්‍රියාකාරකම් සංශෝධනය කොට නොමැත. වර්ෂය තුල මෙම ක්‍රියාකාරකම් 04 අතුරින් 03 ක් 100% ක භෙ ෟතික ප්‍රගතියක් යටතේ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇත. සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් අතුරින් ක්‍රියාත්මක නොවූ ක්‍රියාකාරකමෙහි ප්‍රතිපාදන පන්නිපිටිය ගුවන් පාලමේ මංසන්ධියේ ආලෝක සංඥා පුවරු සවිකිරීම සඳහා මාරු කොට ඇති අතර එය පහත දැක්වෙන වගුවේ අයිතම අංක03 යටතේ දැක්වේ. එම අයිතමය හැරෙන්නට සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ අනෙකුත් ක්‍රියාකාරකම්හි භෞතික ප්‍රගතිය 100% කි.

| අනු අංකය | ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් | ස්ථානය | 2018/12/31 ට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| 1 | ඒ් 5 හා බී 36 මාර්ගයේ අන්තර්හුවමාරු මධ්‍යස්ථානයන්හි මාර්ග සංඥා පද්ධතියක් සවිකිරීම | බදුල්ල | 100% |
| 2 | දෙපානම හා බත්තරමුල්ල යන ප්‍රදේශයන්හි පදික මාරු සලකුණු කිරීම | කොළඹ | 100% |
| 3 | කදාන මංසන්ධියෙහි පදික මාරුව නිම කිරීම සහ සංඥා සවි කිරීම | ගම්පහ | භූගෝලීය වැඩිදියුණු කිරීම් සැලසුම් කල ආකාරයට ක්‍රියාත්මක නොවිණි. ඒ හේතුවෙන් මෙම ක්‍රියාකාරකම ක්‍රියාත්මක නොවිණි. |
| 4 | පන්නිපිටිය ගුවන් පාලම් මංසන්ධියේ ආලෝක සංඥා පද්ධතියක් සවි කිරීම | කොළඹ | 100% |

උක්ත වැඩසටහන 2017 වර්ෂයේදී 100% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. 2018 වර්ෂයේදී මූලික අයවැය ප්‍රතිපාදනය රු.මී.25 ක් වූ අතර පෙර වර්ෂවල බිල්පත් පියවීම් සඳහා එය 66% කින් ඉහළ නංවා ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය - 2018 (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-22** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 25.0 | 41.5 | 37.4 |
| | **එකතුව** | **25.0** | **41.5** | **37.4** |

## 4.5 පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (A005) මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (ඒ005) මාර්ගයේ මාර්ග කි.මී.147 ක දුර ප්‍රමාණයක් ද්විත්ව මංතීරු ලෙස ඌව පළාතේ බදුල්ල සිට නැගෙනහිර පළාතේ චෙන්කලාඩි දක්වා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තෝරා ගෙන ඇත.

පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (ඒ 5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුළු ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 140 කි. සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල හා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල මේ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 60 ක් බැගින් සමානව අරමුදල් සපයනු ලැබේ. ඉතිරි මුදල වන ඇමෙරිකානු ඩොලර් මිලියන 20 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කරනු ලැබේ. බදුල්ල-චෙන්කලාඩි මාර්ග ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ 6 ක් යටතේ ක්‍රියාත්මක වන අතර එම කොන්ත්‍රාත් පැකේජ පිලිබඳ තොරතුරු පහත වගු අංක 4.6.1 හි දක්වා ඇත.

**වගු අංක 4.5.1 පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් පැකේජ**

| සවුදි අරමුදල යටතේ ඇති කොන්ත්‍රාත් පැකේජ 'ඒ' | | |
|---|---|---|
| **පැකේජ 01** | බිබිලේ-පදියතලාව මාර්ග කොටස | කි.මී. 29 |
| **පැකේජ 02** | පදියතලාව- තම්පිටිය මාර්ග කොටස | කි.මී. 30 |
| **පැකේජ 03** | තම්පිටිය- චෙන්කලාඩි මාර්ග කොටස | කි.මී. 27.8 |
| ඔපෙක් අරමුදල යටතේ ඇති කොන්ත්‍රාත් පැකේජ 'බී' | | |
| **පැකේජ 01** | බදුල්ල-පස්සර මාර්ග කොටස | කි.මී. 20 |
| **පැකේජ 02** | පස්සර-ලුනුගල මාර්ග කොටස | කි.මී. 21 |
| **පැකේජ 03** | ලුනුගල- බිබිලේ මාර්ග කොටස | කි.මී. 19 |

සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල් යටතේ ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් පැකේජ 1 හා 2 හි සිවිල් වැඩ 2018 ජූලි මාසයේදී ආරම්භ වූ අතර එය 2018 වර්ෂය අවසානය වන විට 3% ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන ඇත. කොන්ත්‍රාත් පැකේජ 3 හි සිවිල් වැඩ 2018 වර්ෂයේදී ආරම්භ නොවූ නමුත් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම මෙම වසරේදී සිදුකරන ලදී. එසේම ගොඩනැගිලි ප්‍රතිස්ථාපනය හා ඉඩම් අත්පත් කරගැනීම් කටයුතු 90% ක ප්‍රගතියක් යටතේ වර්ෂය තුල ක්‍රියාත්මක වූ අතර එය 2017 වර්ෂයේදී 70% විය. සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල් යටතේ වූ කොන්ත්‍රාත් පැකේජයන්හි සිවිල් වැඩ සඳහා වූ ඉඩම් අත්පත් කරගැනීම 2017 ජූනි මස ආරම්භ වූ අතර ඒ යටතේ වූ කොන්ත්‍රාත් පැකේජ 3 හිම 6% සමස්ත භෞතික ප්‍රගතියක් වර්ෂය අවසාන වනවිට වාර්තා කොට ඇත. නමුත් එය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්කගත ප්‍රගතියට වඩා අඩු අගයක් වේ. 2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය37% කි.







**වගු අංක 4.5.1 සිවිල් වැඩ ඉලක්ක අත්පත්කරගැනීම්හි ප්‍රගතිය** **වගු අංක 4.5.1 සිවිල් වැඩ ඉලක්ක අත්පත්කරගැනීම්හි ප්‍රගතිය**

සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල් යටතේ වූ කොන්ත්‍රාත් පැකේජය2017 වර්ෂයේදී 87% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර එය 2018 වර්ෂයේදී 57% ලෙස වාර්තා විය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31 (සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල)**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි.) | සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-23 (සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල)** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 100.0 | 35.0 | 5.5 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 1,200.0 | 1,180.0 | 689.0 |
| | **උප එකතුව ( සවුදි)** | **1,300.0** | **1,215.0** | **694.5** |

සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල් යටතේ වූ කොන්ත්‍රාත් පැකේජය 2017 වර්ෂයේදී 97% ක මූල්‍ය ප්‍රගතියක් හා 2018 වර්ෂයේදී 81% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය 2017 වර්ෂය සඳහා 97% හා 2018 වර්ෂය සඳහා 72% ලෙස වාර්තා විය

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31 (සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල)**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි.) | සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-41 (සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල)** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 100.0 | 120.0 | 120.0 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 1,950.0 | 1,645.0 | 1,317.0 |
| | **උප එකතුව ( ඔපෙක්)** | **2,050.0** | **1,765.0** | **1,437.0** |

2018 වර්ෂය අවසානය වන විට මෙම ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 2017 වර්ෂයට වඩා අඩු අගයක් පෙන්වන කරන අතර වර්ෂය තුල මූලික අයවැය ප්‍රතිපාදනය සංශෝධනය වීම ඊට බලපා ඇත.

පහත රූපසටහන් අංක 4.5.4 හා 4.5.5 මගින් මෙම මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතින ආකාරය පිළිඹිබු වන රූපසටහන් දැක්වේ.



**පස්සර - 152+420 මාර්ග කොටසේ මාර්ග දෙපස ඇස්පොල්ට් තාර දැමීම**



**බදුල්ල - 138+170-138+320 වන මාර්ග කොටසේ ඒබීසී තාර ඇතිරීම හා මූලික වැඩකටයුතු**

ව්‍යාපෘතියේ මාර්ග සිතියම ***ඇමුණුම 09*** න් දැක්වේ.

## 4.6 ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය - අතිරේක ණය

ණය අංක 2767 සඳහා අතිරේක ණය යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගයේ යෝජිත සම්බන්ධිත මාර්ග සඳහා අතිරේක අරමුදල් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී ඇත. මෙම ව්‍යාපෘතියට අදාල සමස්ත ණය මුදල ඇ.ඩො.මි. 85 කි.ඉහත ව්‍යාපෘතිය මගින් පැකේජ 06 ක් යටතේ මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය.

ව්‍යාපෘතිය 2012 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2015 ජනවාරි මාසය වන විට පැකේජ 05 ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කර ඇති අතර පාමංකඩ සිට කැස්බෑව (බී 084) මාර්ග කොටස පමණක් 2016 පෙබරවාරි මාසයේදී නිම කරන ලදි. **2017 වර්ෂයේදී මෙන්ම 2018 වර්ෂයේදීද මෙම ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම් කටයුතු සිදු කෙරෙමින් පැවතුනි.**

මෙම අතිරේක ණය මුදල යටතේ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පහත දැක්වෙන මාර්ග තෝරා ගන්නා ලදී.

**වගු අංක 4.8.1ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘති-අතිරේක ණය යටතේප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග**

| අනු අංකය | මාර්ග/ව්‍යාපෘති විස්තරය | දිග (කි.මී) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 1 | මාතර සිට ගොඩගම (ඒ 024) දක්වා මාර්ග කොටස | 3.4 | නිම කොට ඇත |
| 2 | හික්කඩුව සිට නයාපාමුල අන්තර් හුවමාරුව දක්වා (බී153) කොටස | 14.34 | |
| 3 | අළුත්ගම සිට වැලිපැන්න අන්තර්හුවමාරුව දක්වා (බී 157) කොටස | 11.07 | |
| 4 | කටුකුරුන්ද සිට නාගොඩ (බී 207) මාර්ග කොටස | 2.72 | |
| 5 | පාමංකඩ සිට කැස්බෑව (බී 084) මාර්ග කොටස | 12.76 | |
| 6 | කිරුළපන සිට ගොඩගම (ඒ 004) මාර්ග කොටස | 14.36 | |

මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී 98% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2018 වර්ෂයේදී එය 100% කි.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-28** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 100.0 | 100.0 | 100.0 |
| | **එකතුව** | **100.0** | **100.0** | **100.0** |

## 4.7 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල II )

කි.මී. 79 ක සම්පූර්ණ දිගකින් යුත් මාර්ග කොටස් 06 ක් ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ඇ.ඩො.මි. 60 ක මුදලක් සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල වෙතින් ශ්‍රී ලංකා රජය වෙත මෙම ව්‍යාපෘතිය සඳහා ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වනුයේ ප්‍රමුඛතා පදනම මත තෝරාගත් මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණුකිරීම මගින් ජාතික මාර්ග ජාලය සංවර්ධනය කිරීමයි.

කොන්ත්‍රාත් පැකේජ 06 ප්‍රදානය කර ඇති මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ 2013 ජුනි මාසයේදී ආරම්භ කර 2015 වර්ෂය අවසානය වන විට නිම කරන ලද අතර බිල්පත් ගෙවීම් කටයුතු පසුගිය වසර දෙක තුල මෙන්ම 2018 වසර තුලද ක්‍රියාත්මක කරන ලදී.

**වගු අංක 4.9.1 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග**

| ව්‍යාපෘති විස්තරය | දිග (කි.මී) |
|---|---|
| ඒ 09 මහාමාර්ගයේ කටුගස්තොට - අලවතුගොඩ මාර්ග කොටස | 10.9 |
| ඒ 09 මහාමාර්ගයේ අලවතුගොඩ - පලාපත්වෙල මාර්ග කොටස | 16.9 |
| ඒ 09 මහාමාර්ගයේ පලාපත්වෙල - නාඋල මාර්ග කොටස | 21.6 |
| බී 541 මාර්ගයේ තම්බලගමුව - කින්නියා මාර්ග කොටස | 8.5 |
| බී 93 මාර්ගයේ දෙහිඕවිට - දැරණියගල මාර්ග කොටස | 14.0 |
| ඒ 01 මහාමාර්ගයේ පෑලියගොඩ - කිරිබත්ගොඩ මාර්ග කොටස | 7.2 |
| **එකතුව** | **79.1** |

ඉහත වගුවේ දක්වා ඇති සම්පූර්ණ කරන ලද මාර්ගවලට අමතරව, මහනුවර - යාපනය මාර්ගයේ නා- උල නගරයද ඇතුලුව මාර්ග කි.මී 53+740 – 58+000 දක්වා වන මාර්ග කොටස පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලද නමුත් මෙම මාර්ග කොටසේ ඉදිකිරීම් සැලසුම් කර තිබුණේ මෙම වසරේ මුල් කාර්තුව තුලදී ආරම්භ කිරීමටය. අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා වීමට නොහැකි වීම හේතුවෙන් 2018 වර්ෂ අවසානයේදී සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ තත්‍ය ප්‍රගතිය අඩු අගයක් ගනු ලැබිණි.

මෙම ව්‍යාපෘතිය 2017 හා 2018 වර්ෂයන්හි පිළිවෙලින් 95% හා 27% ක මූල්‍ය ප්‍රගතියක් ළඟා කර ගෙන තිබුණි. 2018 වර්ෂය සඳහා මූලික අයවැය ප්‍රතිපාදනය රු.මි. 2.25 කින් වර්ධනය වුවද, මූල්‍ය ප්‍රගතිය ඊට සාපේක්ෂව වර්ධනය වී නොතිබුණි. ඒ සඳහා, ඉහත සඳහන් කළ පරිදි ව්‍යාපෘතියේ නව මාර්ග කොටසේ ඉදිකිරීම් කටයුතු වර්ෂයේ මුල් භාගය තුල ආරම්භ නොවීම අහිතකර ලෙස බලපා ඇත. නා-උල නගරය සංවර්ධන කටයුතු සඳහා සංශෝධිත අයවැය ප්‍රතිපාදනය රු.මි.150 ක් වූ අතර නව මාර්ග කොටස සඳහා අනුමැතිය ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රතිපාදන වලින් බොහෝ ප්‍රමාණයක් සැලසුම් ගත පරිදි භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද මාර්ග කොටස් පහත රූපසටහන් මඟින් දැක්වේ.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-29** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 10.0 | 10.0 | 9.6 |
| | 2105 ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් | 151.0 | 153.25 | 38.1 |
| | **එකතුව** | **161.0** | **163.25** | **47.7** |



**දෙහිඕවිට-දැරණියගල-නූරි මාර්ග කොටස**



**තඹගලගමුව - කින්නියා මාර්ග කොටස**

## 4.8 උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේක ණය

උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසු , ආසියානු සංවර්ධන බැංකුව විසින් අතිරේක ණය මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදානය කරන ලද අතර ඒ යටතේ උතුරු සහ උතුරුමැද පළාත්වල ‘ඒ’ ශ්‍රේණියේ මාර්ග කි.මී. 61.2 කුත් ‘බී’ ශ්‍රේණියේ මාර්ග කි.මී. 56.2 කුත් වශයෙන් සම්පූර්ණ කි.මී. 118 ක ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීම සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ සමස්ත කාර්යසාධනය ඉහළ අගයක පවතී.කොන්ත්‍රාත් පැකේජ 9 හිම සිවිල් වැඩ 2015 වර්ෂයේ අවසානය වන විට සම්පූර්ණ කොට ඇත.

2015 වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ සිවිල්වැඩ අවසන් කර ඇති අතර මේ වන විට මෙම ව්‍යාපෘතිය අඩුපාඩු නිවැරදි කිරීමට බැඳී ඇති කාලසීමාවේ පවතින අතර කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කටයුතු සිදු කරමින් පවතී. **2018 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතියේ ගෙවීම් කටයුතු සිදුකරන ලදී.**

එයට අමතරව මේ සඳහා ලද ණය මුදලේ ඉතුරුම් උපයෝගී කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන CP 22 (A 09) මහනුවර- යාපනය මාර්ගයේ (කි.මී.14+100-0150+4000 මාර්ග කොටසෙහි ප්‍රතිසංස්කරණ කටයුතු 2017 මාර්තු මස ආරම්භ කරන ලදී.

**වගු අංක 4.8.1 උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේක ණය යටතේ ප්‍රතිසංස්කරණිත මාර්ග**

| මාර්ගයේ/ව්‍යාපෘතියේ නම | දිග (කි.මී.) |
|---|---|
| ඒ 029 වව්නියාව - හොරොව්පතාන මාර්ගයේ කි.මී. 24+000 සිට කි.මී. 34+950 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 10.95 |
| බී 283 මැදවච්චිය - කැබතිගොල්ලෑව මාර්ගයේ කි.මී. 0+000 සිට කි.මී. 12+600 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 12.60 |
| බී. 283 මැදවච්චිය - කැබතිගොල්ලෑව මාර්ගයේ කි.මී.12+600 සිට කි.මී.25+400 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 12.80 |
| බී 211 කැබතිගොල්ලෑව - පදවිය මාර්ගයේ කි.මී.0+000 සිට කි.මී. 15+500 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 15.50 |
| බී. 211 කැබිතිගොල්ලෑව - පදවිය මාර්ගයේ කි.මී. 15+500 සිට කි.මී.31+35 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 15.85 |
| ඒ 014 මැදවච්චිය - මන්නාරම - තලෙයිමන්නාරම මාර්ගයේ කි.මී.47+100 සිට කි.මී. 62+100 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 15.10 |
| ඒ 014 මැදවච්චිය - මන්නාරම - තලෙයිමන්නාරම මාර්ගයේ කි.මී.62+100 සිට කි.මී. 76+500 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 14.40 |
| ඒ බී 019 යාපනය - පන්නායි කයිට්ස් මාර්ගයේ කි.මී.0+000 සිට කි.මී.10+000 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 10.00 |
| ඒ බී 019 යාපනය - පන්නායි කයිට්ස් මාර්ගයේ කි.මී.10+000 සිට කි.මී.20+27දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 10.27 |
| ඒ 09 නුවර - යාපනය මාර්ගයේ කි.මී.141+100 සිට කි.මී. 150+400 දක්වා ප්‍රතිසංස්කරණය කිරීම/ වැඩිදියුණු කිරීම | 09.3 |

ඒ 09 මහනුවර- යාපනය මාර්ගයේ මාර්ග කි.මී.141+100 – 150+400 දක්වා වන කොටස පුනරුත්ථාපනය / වැඩිදියුණු කිරීම 99% ක ප්‍රගතියක් 2018 වර්ෂයේ සිව්වන කාර්තුව අවසාන වන විට වාර්තා කොට තිබුණි. එය 2017 වර්ෂය අවසානය වන විට 47% විය. සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක ඉක්මවා ගිය 100% ට වැඩි භෞතික ප්‍රගතියක් පෙන්නුම් කොට ඇත. 2017 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 83% වූ අතර 2018 වර්ෂයේදී එය 86% කි. බිල්පත් නිරවුල් කිරීමේ කටයුතු සඳහා වර්ෂය තුල ලබා දුන් මූලික අයවැය ප්‍රතිපාදනය රු.මි.828 දක්වා සංශෝධනය වූ අතර 2018 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 100% ට වඩා වැඩි මූල්‍ය ප්‍රගතියක් වාර්තා කිරීමට ව්‍යාපෘතියට හැකියාව ලැබී ඇත. වර්ෂය ආරම්භයේදී අපේක්ෂා කල පමණට වඩා 50% කට වැඩි වියදම් ප්‍රමාණයක් වර්ෂය තුල වාර්තා වීම ඊට හේතු වී ඇත. තවද, මෙම ව්‍යාපෘතියේ 2015 වර්ෂයේදී වැඩ නිම කල කොන්ත්‍රාත් පැකේජයන්හි බිල්පත් නිරවුල් කිරීම් කටයුතු මෙම වර්ෂයේදීද ක්‍රියාත්මක විය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-30** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 230.0 | 828.0 | 708.5 |
| | **එකතුව** | **230.0** | **828.0** | **708.5** |

## 4.9 අධිවේගී මාර්ග සබඳතා වැඩි දියුණු කිරීමේ සැලසුම් ව්‍යාපෘතිය

දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතියේ අංගයක් වන අධිවේගී මාර්ග සබඳතා වැඩිදියුණු කිරීමේ සැලසුම මඟින් මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීමේ සූදානම සහතික කිරීම මෙමඟින් සිදුවේ.ව්‍යාපෘති කාලය 2014 සිට 2019 දක්වා වූ කාලයයි. උක්ත ව්‍යාපෘතියේ විෂය පථයේ ප්‍රධාන ඉලක්කයන් වනුයේ,

- සංවර්ධන අවශ්‍යතා සඳහා අධිවේගී මාර්ග හා සම්බන්ධවන ජාතික මාර්ග හඳුනා ගැනීම
- අනාගත ව්‍යාපෘතීන්හි ශක්‍යතා අධ්‍යනය, විස්තරාත්මක ඉංජිනේරුමය කටයුතු, ඉඩම් අත්පත්කර ගැනීම්, නැවත පදිංචිකිරීම හා සිවිල්වැඩ වල ප්‍රසම්පාදන කටයුතු ආදිය සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම.
- ජාතික මාර්ග වල කි.මී. 250 ක පමණ ශක්‍යතා අධ්‍යන සිදුකිරීම.
- ජාතික මාර්ගවල කි.මී. 200 ක පමණ විස්තරාත්මක ඉංජිනේරු කටයුතු සිදුකිරීම.
- සැලසුම් ප්‍රමිති හා ඉදිකිරීම් තාක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබාදීම.
- සැලසුම්කරණ තාක්ෂණය, නිර්මාණ කටයුතු සඳහා සැලසුම් ප්‍රමිතීන් හා ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ඉහත සඳහන් කාර්යයන් සිදුකිරීම සඳහා ඇ.එ.ජ.ඩො.මි. 5 ක මුදලක් ශ්‍රී ලංකා රජය වෙත අනුමතව ඇත. මෙම ව්‍යාපෘතිය තුළින් දක්ෂිණ ප්‍රදේශයන්හි අධිවේගී මාර්ග ජාලය හා දේශීය මාර්ග ජාලය අතර මනා සම්බන්ධතාවයක් වර්ධනය වීම අපේක්ෂිත අතර එහි බලපෑම් ලෙස උක්ත ප්‍රදේශයන්හි කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් ඇතිවීම අපේක්ෂිතය.

මෙම ව්‍යාපෘතිය යටතේ 2016 හා 2017 වර්ෂයන්හි පහත දැක්වෙන ක්‍රියාකාරකම්හි නිරත විය.

1. අධිවේගී මාර්ග ජාලයේ උපදේශනය හා සම්බන්ධිත ජාතික මාර්ග ජාලයේ ශක්‍යතා අධයනය හා විස්තරාත්මක ඉංජිනේරු නිර්මාණය සඳහා උපදේශන සේවා සැපයීම.
2. ඒකපුද්ගල උපදේශන සේවාවන් (SHETC ICS-001) ප්‍රවාහන සැලසුම්කරු(අන්තර්ජාතික)
3. ඒකපුද්ගල උපදේශන සේවාවන් (SHETC ICS-002) මහාමාර්ග ඉංජිනේරු (අන්තර්ජාතික)

4. ඒකපුද්ගල උපදේශන සේවාවන් (SHETC ICS-003) පාලම් හා නිර්මාණ ඉංජිනේරු (අන්තර්ජාතික)
5. ඒකපුද්ගල උපදේශන සේවාවන් (CEP ICS 004 ) මහාමාර්ග ඉංජිනේරු (අන්තර්ජාතික)
6. ඒකපුද්ගල උපදේශන සේවාවන් ( ICS 006) පාලම් හා නිර්මාණ ඉංජිනේරු (අන්තර්ජාතික)
7. ඒකපුද්ගල උපදේශන සේවාවන් ( ICS 007) රථවාහන ගමනාගමන සැලසුම්කරණය සහ ඇස්තමේන්තු විශ්ලේෂණය
8. ඒකපුද්ගල උපදේශන සේවාවන් ( ICS 008) ප්‍රවාහන සැලසුම්කරණ උපදේශනය (අන්තර්ජාතික)

ක්‍රියාකාරකම් අංක 01-05 දක්වා 2016 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද අතර ක්‍රියාකාරකම් අංක 06 හි 2016 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කළද , විෂය පථය වෙනස් වීමක් හේතුකොට ගෙන අපේක්ෂිත ඉලක්කයන් කරා ළඟා වීමට නොහැකි වී ඇත.නමුත් අදාල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක තත්වයේ පැවතිණි. මීට අදාල විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන අතර භෞතික ප්‍රගතිය55% කි. 2017 වර්ෂය අවසානය වන විට ක්‍රියාකාරකම් අංක 07 හි භෞතික ප්‍රගතිය20% ක් වූ අතර 2018 වර්ෂය අවසානයේදී එය සම්පූර්ණ කරන ලදී. ක්‍රියාකාරකම් අංක 06 හා 08, 90% ක භෞතික ප්‍රගතියකින් 2018 වර්ෂය තුල ක්‍රියාත්මක වෙමින් පැවති අතර ඉහත එක් එක් ක්‍රියාකාරකම්හි ඉලක්ක අත්පත් කරගැනීම් හි ප්‍රගතිය පහත රූපසටහනෙහි දැක්වේ.

**රූපසටහන 4.9.1 සංශෝධිත අයවැයට අනුව 2018 වර්ෂයේ භෞතික ඉලක්ක අත්පත් කරගැනීම්හි ප්‍රගතිය**




2018 හා 2017 වර්ෂයන් සඳහා ඉහත ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 61% හා 25% විය. තවද 2018 වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට මූලික අයවැය ප්‍රතිපාදනය සංශෝධනය වුවද අපේක්ෂා කල පරිදි වියදම් වාර්තා වී නොතිබුණි.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-42** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 23.0 | 99.5 | 60.38 |
| | **එකතුව** | **23.0** | **99.5** | **60.38** |

## 4.10 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල)

ජාතික මහාමාර්ගයන්හි ආසන්න වශයෙන් කි.මි. 37 ක් ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම සහ පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලම නැවත ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වන අතර අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 40 ක ණය මුදලක් ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණ වනුයේ මාර්ගවල ධාරිතාවය වැඩිදියුණු කිරීම තුලින් වාහනවල මෙහෙයුම් පිරිවැය අවම කිරීම හා මහජනතාවට සේවා සැපයීම තුලින් එම ප්‍රදේශ සංවර්ධනය කිරීමයි. එමඟින් රටේ සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා දායකත්වය ලබාදීම ද මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිතය.මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා පහත දැක්වෙන පරිදි කොන්ත්‍රාත්තු 04 ප්‍රදානය කරනු ලැබ ඇති අතර 2015 දී සියලුම වැඩ කටයුතු අවසන් කොට ඇත. 2017 වර්ෂයේ දී, ණය මුදලෙහි ඉතුරුම් භාවිතා කරමින් ඒ005 පේරාදෙණිය බදුල්ල චෙන්කලඩි මාර්ගයේ කි.මී.2.63 ක ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය ඇරඹුණි.2017 වර්ෂය සඳහා මෙම මාර්ග කොටසේ භෞතික ප්‍රගතිය 5% වූ අතර එය 2018 වර්ෂ අවසානයේදී 35% විය.

**වගු අංක 4.10.1 මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග සහ පාලම්**

| ව්‍යාපෘති විස්තරය | දිග (කි.මී.) | 2017/12/31 වන විට භෞතික ප්‍රගතිය | 2018/12/31 වන විට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| රක්වාන - මාදම්පේ මාර්ග කොටස | 14.0 | | |
| ඇහැලියගොඩ - දෙහිඕවිට මාර්ග කොටස | 17.0 | | |
| | | සම්පූර්ණ කොට ඇත | |
| ඇතුල්කෝට්ටේ - කොහුවල මාර්ග කොටස | 6 .0 | | |
| පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ අංක 3/2 පාලම නැවත ඉදිකිරීම | මීටර 120.4 | | |
| පේරාදෙණිය බදුල්ල චෙන්කලඩි මාර්ගය | 2.63 | 4.8% | 3.5% |

2018 වර්ෂයේදී සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතියේ තත්‍ය ප්‍රගතිය 55% වූ අතර එය 2017 වර්ෂයේදී 7% විය. තවද , 2017 වර්ෂයේදී උක්ත ව්‍යාපෘතිය 59% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත්කරගත්ත ද 2018 වර්ෂය තුල කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය තරමක් අඩුවීම හේතුවෙන් වර්ෂ අවසානය වන විට මූල්‍ය ප්‍රගතියක් 52% ක් විය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-31** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 25.0 | 25.0 | 20.5 |
| | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 250.0 | 250.0 | 124.8 |
| | **එකතුව** | **275.0** | **275.0** | **145.3** |

මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ කරන ලද හා ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ගයන්හි රූපසටහන් අංක 4.10.1 හා 4.10.2 යටතේ පහත දැක්වේ.



ඇහැළියගොඩ - දෙහිඕවිට මාර්ග කොටස



පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ 0+390 හි වම් ඉවුර සැකසීම

## 4.11 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මහාමාර්ග සංවර්ධනය කිරීම සඳහා අරමුදල් සැපයීම පිණිස ඇ.ඩො.මි.50 ක මුදලක් අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID) වෙතින් ශ්‍රී ලංකා රජය වෙත ලැබී ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ගජාලය වැඩිදියුණු කිරීම දැක්විය හැකිය.මේ මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශයන්හි මාර්ග තදබදය

අවම කිරීම තුලින් ජනතාව මාර්ගයන්හි ගතකරන කාලය අවම කොට එම කාලය ජාතික ආර්ථික වර්ධනය සඳහා දායක කර ගත හැකි වනු ඇත.

මෙහි නාවල- නුගේගොඩ මාර්ගයේ පිහිටි නාවල පාලම පුළුල් කිරීම කොන්ත්‍රාත් පැකේජ I යටතේ ක්‍රියාත්මක කළ අතර 2015 වර්ෂයේ මැයි මස එහි වැඩකටයුතු අවසන් කොට ඇත.

පහත සඳහන් වගුවේ සඳහන් අංක 01 සිට 05 දක්වා මාර්ගවල සංවර්ධන කටයුතු 2016 වර්ෂයේදී නිම කරන ලදි. කොන්ත්‍රාත් පැකේජ අංක 08, 10 හා අදියර II හි අංක 12, 13 මාර්ගයන්හි ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2017 වර්ෂයේදී මෙන්ම 2018 වර්ෂයේදීද සිදුකෙරෙමින් පැවතිණි. ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතුවල සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ සිවිල් වැඩ නියමිත පරිදි ආරම්භ කිරීමට නොහැකි විය.

**වගු අංක 4.13.1 කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ තෝරාගන්නා ලද මාර්ග**

| අයිතම අංක | මාර්ගයේ නම | දුර (කි.මී) |
|---|---|---|
| 01 | ශ්‍රී ජයවර්ධනපුර රෝහල සඳහා ප්‍රවේශ මාර්ගය | 1.4 |
| 02 | දෙමටගොඩ-වැල්ලම්පිටිය මාර්ගය | 1.9 |
| 03 | වැලිකඩ-කොහිලවත්ත මාර්ගය | 6.0 |
| 04 | කොළොන්නාව- යක්බැද්ද මාර්ගය | 2.4 |
| 05 | මට්ටක්කුලිය මැද මාර්ගය | 1.0 |
| 06 | කොට්ටාව-තලගල මාර්ගය | 14.4 |
| 07 | කොට්ටේ-බෝපේ මාර්ගය | 11.3 |
| 08 | මොරටුව-පිළියන්දල මාර්ගය | 2.62 |
| 09 | නාවින්න-බොරලැස්ගමුව මාර්ගය | 2.41 |
| 10 | පිළියන්දල-මහරගම මාර්ගය | 5.38 |
| 11 | ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය | 7.7 |
| 12 | වල්ගම-දියගම මාර්ගය | 7.06 |
| 13 | පැලවත්ත ප්‍රවේශ මාර්ගය | 0.83 |

2018 වර්ෂ අවසානය වන විට අයිතම අංක 07 යටතේ දැක්වෙන මාර්ගයේ පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය 46% වූ අතර එය 2017 වර්ෂාවසානයේදී 14% ක මට්ටමක පැවතුණි. එසේම අංක 06 සඳහා 2017 හා 2018 වර්ෂයන්හි පිළිවෙලින් 12% හා 26% ක භෞතික ප්‍රගතියක් ලබා කර ගෙන තිබුණි.

2018 වර්ෂයේදී හඳුනාගන්නා ලද ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පළමු අදියර සඳහා 23% ක භෞතික ප්‍රගතියක් සිව්වන කාර්තුව අවසානය වන විට වාර්තා කොට තිබුණි. 2018/12/31 වන විට එක් එක් මාර්ගයන්හි ඉලක්ක අත්පත් කරගැනීම් හි ප්‍රගතිය ප්‍රස්ථාර 4.13.1 යටතේ දැක්වේ. ඒ අනුව 2018 වර්ෂ අවසානය වන විට සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අයිතම අංක 06 සඳහා 27% , අයිතම

අංක 07 සඳහා 58% හා අදියර II හි අයිතම අංක 11 සඳහා 51% කද වූ අගයන් තත්‍ය ප්‍රගතිය ලෙස වාර්තා කොට ඇත.

උක්ත ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී 97% ක මූල්‍ය ප්‍රගතියක්ද 2017 වර්ෂයේදී 97% මූල්‍ය ප්‍රගතියක්ද අත්පත් කරගෙන තිබුණි.

**ප්‍රස්ථාර 4.11.1 – 2018 වර්ෂයේ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අයිතම අංක 06,07 හා අදියර II හි අයිතම අංක 11 සඳහා භෞතික ඉලක්ක අත්පත් කරගැනීමේ ප්‍රගතිය**




**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-32** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 1,285.0 | 1,317.0 | 1,253.1 |
| | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම | 500.0 | 750.0 | 750.0 |
| | **එකතුව** | **1,785.0** | **2,067.3** | **2,003.1** |

කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන කෝට්ටේ - බෝපේ මාර්ගයේ ඉදිකිරීම්හි රූපසටහන පහත දැක්වේ.




**පාදම සකස් කිරීම (11+090)** **ගල් අතුරා පිරවීම ( 2+130)**

## 4.12 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර I

චීන සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 300 ක මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදී ඇත. මේ යටතේ මාර්ග දුර කි.මී.248.96 ක් පළමු වන අදියර යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරා ගෙන ඇත. ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය-III යටතේ පළමු අදියරේදී කොන්ත්‍රාත් පැකේජ 12 ක් යටතේ මාර්ග සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ.මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ශ්‍රී ලංකාව තුල ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමයි.

මෙම ව්‍යාපෘතිය යටතේ, මාර්ග පැකේජ 11 ක් සහ පාලම් පැකේජ 3 ක් 2017 වර්ෂය අවසාන වන විට නිම කරන ලදී. 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්කය වසර අවසාන වනවිට මාර්ග පැකේජ 5 ක් සම්පූර්ණ කිරීම වන අතර ඉන් 4 ක් සම්පූර්ණ කළ ද එක් පැකේජයක භෞතික ප්‍රගතිය 78% විය. 2018 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය වන විට කොන්ත්‍රාත් පැකේජ 13 හැර අනෙකුත් සියළුම පැකේජයන් සම්පූර්ණ කරන ලදී. ඒ අනුව ව්‍යාපෘතියේ මූලික කොන්ත්‍රාත් පැකේජයන්හි සමස්ත ප්‍රගතිය 99% ක් වූ අතර ණය මුදලේ ඉතුරුම් යොදාගනිමින් මාර්ග කිහිපයක් වැඩි දියුණු කිරීමට තොරා ගනු ලැබුණි. (වගු අංක 4.12.1)

2018 වර්ෂය තුල දී එසේ තෝරා ගත් මාර්ග 03 ක් 2018 වර්ෂය තුළදී සැලසුම් කල පරිදි සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව කොන්ත්‍රාත් පැකේජ 08 යටතේ මාර්ග කි.මී. 16.6 ක වැඩිදියුණු කිරීම් පමණක් සම්පූර්ණ කරන ලදී.

වගු අංක **4.12.1** මූලික කොන්ත්‍රාත් පැකේජයන්හි ඉතුරුම් භාවිතා කරමින් පුනරුත්ථාපනය කරන ලද මාර්ග

| මාර්ගයේ නම/පාලමේ අංකය | මාර්ගය (කි.මී)/ පාලමේ දිග (මී) | දිස්ත්‍රික්කය/ ස්ථානය | 2018/12/31 වන විට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර I හි ඉතුරුම් භාවිතා කරමින් බිංගිරිය ප්‍රදේශයේ මාර්ග කොටස් 04 ක් ඉදිකිරීම<br>• හම්මන්නපාහුව - බාරම්පොළ මාර්ගය<br>• කහදෙනිගම - කොස්හේන මාර්ගය<br>• පලුගමුව - බිබිලදෙනිය මාර්ගය<br>දෙමතලාව - පන්සල හන්දිය මාර්ගය | 16.60 km | කුරුණෑගල | 100% |
| කො.පැ 04 ඉතුරුම් ,VO-17 බලගොල්ල ජුම්මා පල්ලිය වටරවුම් මාර්ගය | 4.6 km | | 85%% |
| කො.පැ 10 ඉතුරුම්, VO - 8 මිනිගමුව - සිවුරුපිටිය මාර්ගය | 5.5 km | | 80%% |
| කො.පැ 7 , VO - 09 ගඩලාදෙණිය - පරනපට්ටිය මාර්ගය | 3.5 km | මහනුවර | 23% |

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය - 2018 (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය(රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-39** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 4,642.0 | 3,465.0 | 3,420.0 |
| | එකතුව | **4,642.0** | **3,465.0** | **3,420.0** |

උක්ත ව්‍යාපෘතිය 2018 වර්ෂයේදී 99% ක් වූ මූල්‍ය ප්‍රගතියක් වාර්තා කල අතර එය 2017 වර්ෂයේදී 96% ක් විය. ව්‍යාපෘතියේ මාර්ග පුනරුත්ථාපන කටයුතු වර්ෂාරම්භයේදී අපේක්ෂා කල පරිදි සම්පූර්ණ කිරීමට නොහැකි වූ බැවින් වර්ෂය සඳහා වෙන් කරන ලද මූලික අයවැය ප්‍රතිපාදනයෙන් රු.මි.1.2 ක ප්‍රමාණයක් වෙනත් ව්‍යාපෘති සඳහා මාරු කරන ලදී. කොන්ත්‍රාත් පැකේජ 08 යටතේ ණය මුදලේ ඉතුරුම් භාවිතා කරමින් වැඩිදියුණු කරන ලද බිංගිරිය ප්‍රදේශයේ මාර්ග පහත රූපසටහනේ දැක්වේ.





**හමන්නාපාහුව - බාරම්පොල මාර්ගය**

**පලුගමුව - බිබිලදෙනිය - තල්ගහපොත්ත මාර්ගය**

2018 වර්ෂයේ අවසානය වන විට එක් එක් මාර්ග ව්‍යාපෘතින්හි භෞතික ප්‍රගතිය ඇමුණුම 10 යටතේ දැක්වේ.

## 4.13 දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය

අධිවේගී මාර්ගජාලය හා සම්බන්ධිත ජාතික මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 70 ක ණය අරමුදල් සපයා ඇත. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන නිමැවුම් වන්නේ දකුණු කලාපයේ අධිවේගී මාර්ග හා සම්බන්ධිත ප්‍රධාන ජාතික මාර්ග කි.මී. 31.2 ක ප්‍රමාණයේ ධාරිතාවය වැඩිදියුණු කිරීම හා අධිවේගී මාර්ග සබඳතා වැඩිදියුණු කිරීම සැලසුම් කිරීමේ සහ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාවය වර්ධනය කිරීම ය.

මෙයට අමතරව ජාතික මහමාර්ග වැඩිදියුණු කිරීම යටතේ දකුණු අධිවේගී මාර්ගයෙහි අන්තර් හුවමාරු ස්ථාන 3 ක් හා සම්බන්ධිත ප්‍රමුඛ ජාතික මහා මාර්ගයන් 5 ක කොටස් 6 ක් වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කොට ඇත. මෙම ප්‍රමුඛ ජාතික මහා මාර්ගයන් තෝරා ගන්නා ලද්දේ වර්තමාන මාර්ග තත්වය සහ ධාරිතාවය , ප්‍රවාහනය සඳහා පවතින ඉල්ලුම, සහ වැඩි දියුණු කිරීම සඳහා වන සූදානම යන කරුණු මත වේ.

රත්මලාන - මිරිහාන හා මොරටුව - පිළියන්දල (කොන්ත්‍රාත් පැකේජ 1) යන මාර්ගයන් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම 2015 අප්‍රේල් මාසයේ දී ආරම්භ කරන ලද අතර 2017 වර්ෂයේදී අවසන් කරන ලදී. කැස්බෑව - පොකුණුවිට හා කිරුළපන - ගොඩගම (කොන්ත්‍රෙත් පැකේජ II) යන මාර්ගයන් මෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගය - මාදුරුගොඩ (කොන්ත්‍රාත් පැකේජ III) 2016 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර කොන්ත්‍රෙත් පැකේජ II සඳහා 80% ද, කොන්ත්‍රෙත් පැකේජ III සඳහා 100% ද භෞතික ප්‍රගතියක් 2018 වර්ෂාවසානය වන විට වාර්තා කොට තිබුණි. කොන්ත්‍රෙත් පැකේජ IV යටතේ ක්‍රියාත්මක වන අඹතලේ සිට සිනෙක් හන්දිය දක්වා වූ මාර්ගය 2017 ජූලි මාසයේදී ආරම්භ කරන ලද අතර 2018.12.31 වන විට එහි සමස්ථ භෞතික ප්‍රගතිය 66% විය.

මෙම ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරා ගෙන ඇති මාර්ග ව්‍යාපෘති පිළිබඳ තොරතුරු වගු අංක 4.13.1 යටතේ දැක්වේ.

**4.13.1 දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කරනු ලබන මාර්ග**

| කොන්ත්‍රාත් පැකේජය | ව්‍යාපෘතියේ විස්තරය | දුර (කි.මී) | භෞතික ප්‍රගතිය 2018/12/31 දිනට |
|---|---|---|---|
| CP 01 | රත්මලාන-මිරිහාන දක්වා වන බී 389 මාර්ගයේ කි.මී.5+700 සිට කි.මී.7+840 දක්වා | 2.14 | 100% |
| | මොරටුව සිට පිළියන්දල දක්වා වන බී 295 මාර්ගයේ කි.මී.2+620 සිට කි.මී.5+120 දක්වා | 2.55 | |
| CP 02 | කැස්බෑව සිට පොකුණුවිට දක්වා වන බී 084 මාර්ගයේ කි.මී.13+800- කි.මී.28+180 දක්වා | 14.40 | 80% |
| | කිරුළපන- ගොඩගම දක්වා වන ඒ 004 මාර්ගයේ කි.මී.0+130-1+000 හා කි.මී.15+360- කි.මී.16+280 වන කොටස් | 1.79 | |
| CP 03 | දක්ෂිණ අධිවේගී මාර්ගයේ සිට මතුගම දක්වා වන බී 157 මාර්ගයේ කි.මී.42+372- කි.මී.30+000 දක්වා | 10.37 | 100% |
| CP 04 | කොළඹ ජාත්‍යන්තර නාවුක හා ඉංජිනේරු විද්‍යාලය (CINEC)අසල සිට අඹතලේ මංසන්ධිය දක්වා | 1.88 | 66% |

ඉහත සඳහන් මාර්ග කොටස් අතරින් කොන්ත්‍රාත් පැකේජ 01 (CP 01) 2017 වර්ෂයේදී සම්පූර්ණයෙන් නිමකොට ඇති අතර කොන්ත්‍රාත් පැකේජ 03, ඉලක්කගත ප්‍රමාණයට (35%) වඩා වැඩි භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත. කොන්ත්‍රාත් පැකේජ 02 හි භෞතික ප්‍රගතිය 25%ක් ලෙස වන අතර එය ඉලක්කයට වඩා අඩු අගයක් ගනී. 2017- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඉලක්කයට අනුව ඉන් 63% ප්‍රගතියක් ළඟාකරගෙන ඇත. කොන්ත්‍රාත් පැකේජ 04 හි කොන්ත්‍රාත්තුව 2017 වර්ෂය තුල දී පිරිනමා ඇත. 2018 වර්ෂයේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැසැමට අනුව කොන්ත්‍රාත් පැකේජ අංක 02 100% ට වැඩි ඉලක්ක අත්පත් කරගැනීමක්ද, කොන්ත්‍රාත් පැකේජ අංක 03 100% ට වැඩි භෞතික ප්රගතිය අත්පත්කරගැනීමක්ද වාර්තා කොට ඇත. තවද කොන්රතාත් පැකේජ අංක 04 ,95% ක භෞතික ප්‍රගතියක් වර්ෂාරම්භයේදී ඉලක්ක ගත කරන ලද නමුත් එහි තත්‍ය ප්‍රගතිය 66% වූ අතර සමස්ථයක් ලෙස 70% ක ඉලක්ක කරා ළඟා වීමකි.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය(රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-43** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 1,639.05 | 2.429.05 | 2,073.37 |
| | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 400.0 | 400.0 | 400.0 |
| | **එකතුව** | **1,769.05** | **2,829.05** | **2,473.37** |

2018 හා 2017 වර්ෂයන්හි මූල්‍ය ප්‍රගතිය පිළිවලින් 87% හා 81% විය.ව්‍යාපෘතියේ මූලික අවශ්‍යතාවය මත 2018 වර්ෂය සඳහා වූ මූලික අයවැය ප්‍රතිපාදනය රු.මි.2,829 දක්වා වර්ධනය කරන ලදී. බී 157 මාර්ගයේ මතුගම සිට දක්ෂිණ අධිවේගී මාර්ගයේ කි.මී.42+372-32+000 දක්වා මාර්ගයේ සම්පූර්ණ කරන ලද මාර්ග කොටස පහත රූපසටහනින් නිරූපණය වේ.



**කැස්බෑව - පොකුණුවිට මාර්ගය**



**දක්ෂිණ අධිවේගී මාර්ගය- මාදුරුගොඩ මාර්ගය**

## 4.14 ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන - අදියර I

ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන තුළින් ග්‍රාමීය ප්‍රජාවන් අතර සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර ප්‍රවේශ අවස්ථා දියුණු කිරීමේ අරමුණින් දකුණ, සබරගමුව, මධ්‍යම, උතුරුමැද, වයඹ සහ බස්නාහිර යන පළාත් 6 ක තෝරාගත් ග්‍රාමීය පළාත් හා ජාතික මාර්ග වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සිදු කරනු ලැබේ. තෝරා ගනුලැබූ උක්ත මාර්ගයන්හි ප්‍රවාහන කාර්යක්ෂමතාවය ඉහළයාම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵලය වන අතර ඒ තුළින් ප්‍රදේශ අතර පවතින සම්බන්ධතා පුළුල් වීම සඳහා දීර්ඝකාලීනව බලපානු ඇත.

ඒ අනුව ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) මාර්ගෝපදේශනය සහ ආරක්ෂණ ප්‍රතිපත්ති වලට අනුකූලව පිළිවෙලින් වසර පහක සහ හතක කාලයක් පුරා පළාත් පාලන ආයතන වලට අයත් (පළාත් සභා හා ප්‍රාදේශීය සභා) ග්‍රාමීය මාර්ග කි.මී. 3131 ක් සහ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ජාතික මාර්ග කි.මී. 265 ක් පමණ නිර්මාණය, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කටයුතු මෙන්ම ඊට අදාල ප්‍රසම්පාදන කටයුතු ද සිදුකිරීමට අදහස් කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික මාර්ග හා පළාත් මාර්ග දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 800ක් ලබාදීමට එකඟ වී ඇති අතර ශ්‍රී ලංකා රජය විසින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 106 ක් මූල්‍යනය කරනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය 2015 මැයි මස ආරම්භ කළ අතර 2024 මාර්තු මාසයේදී නිම කිරීමට අපේක්ෂිත අතර ග්‍රාමීය මාර්ගයන්හි සිවිල් වැඩ කටයුතු 2019 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිත වේ. කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කටයුතු ඉතිරි වර්ෂ තුන තුල සිදු කිරීමට නියමිතය.ජාතික මාර්ගයන්හි මාර්ග කළමණාකරණ ක්‍රියාවලිය 2024 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

### 4.16.1 2018 වර්ෂයේ ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් මාර්ග

| පළාත | දිස්ත්‍රික්කය | මාර්ග ගණන | දුර (කි.මී) |
|---|---|---|---|
| දකුණ | ගාල්ල | 66 | 197 |
| | මාතර | 67 | 218 |
| | හම්බන්තොට | 51 | 167 |
| සබරගමුව | රත්නපුර | 38 | 255 |
| | කෑගල්ල | 63 | 217 |
| උතුරු මැද | අනුරාධපුර | 60 | 330 |
| | පොළොන්නරුව | 55 | 170 |
| මධ්‍යම | නුවර | 50 | 221 |
| | මාතලේ | 51 | 194 |
| | නුවරඑළිය | 43 | 180 |
| වයඹ | පුත්තලම | 38 | 220 |
| | කුරුණෑගල | 76 | 485 |
| බස්නාහිර | කළුතර | 83 | 276 |
| **එකතුව** | | **741** | **3130** |

2018 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට මෙම ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය 82% වන විට මෙම මාර්ග පැකේජයන් පලාත් වශයෙන් වාර්තා කර ඇති ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කල හැක.

**වගු අංක 4.14.2 එක් එක් මාර්ග පැකේජයන්හි පලාත්බද භෞතික ප්‍රගතිය**

| පළාත | 2017.12.31 වන විට භෞතික ප්‍රගතිය | 2018.12.31 වන විට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| දකුණු පළාත | 90% | 96% |
| බස්නාහිර පළාත | 84% | 91% |
| සබරගමුව පළාත | 56% | 69% |
| උතුරු මැද පළාත | 47% | 97% |
| වයඹ පළාත | 32% | 59% |
| කළුතර දිස්ත්‍රික්කය (බස්නාහිර පළාත) | 34% | 46% |

ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන 2015 වර්ෂයේ ආරම්භ වුවද 2015 හා 2016 වර්ෂයන්හි භෞතික ප්‍රගතතිය පිළිවෙලින් 3% හා 27% විය. ඒ අනුව 2017 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය 62% කි. 2018 වර්ෂය අවසානය වන විට එය 82% වූ අතර වර්ෂය තුල 20% ක භෞතික ප්‍රගතියක් වාර්තා කොට තිබුණි.

2017- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් පරිදි 2017 වසර සඳහා භෞතික ඉලක්කය 47% ක් වුව ද තත්‍ය ප්‍රගතිය 32% කි. ඒ අනුව, ඉලක්කය ළගාකරගැනීමේ ප්‍රතිශතය 68% කි. සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 2018 වර්ෂය සඳහා භෞතික ඉලක්කය 28% වූ අතර එය වර්ෂයේ තුන්වන කාර්තුව අවසානය වන විට ළඟා කර ගත් අතර වර්ෂාවසානයේදී 71% විය.

**වගු අංක 4.14.3 ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා තෝරාගත් ජාතික මාර්ග**

| අනු අං. | මාර්ගය. | දුර ( කි.මී | ආවරණය වන දිස්ත්‍රික්කය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | මරදන්කඩවල- හබරන- (ඒ 011) | 25.0 | පොළොන්නරුව අනුරාධපුරය | කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. |
| 02 | ගාල්ල දිස්ත්‍රික්කය - පැකේජ 1 ( කරාපිටිය - නාගොඩ මාර්ගය :B 248, B 454 උඩුගම බාර් හන්දිය - තවලම මාර්ගය: B 129, B429, B 156) | 51.7 | ගාල්ල | තාක්ෂණික ප්‍රසම්පාදන ඇගැයීම් වාර්තාව සැකසීම හා මූල්‍ය ප්‍රසම්පාදනය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය අපේක්ෂාවෙන් සිටී |
| 03 | තලාව , කැකිරාව - ගනේවල්පොල- ගලෙන්බිදුණු වැව - දාච්චිහල්මිල්ලෑ | 90.0 | අනුරාධපුරය | නිර්මාණ ක්‍රියාකාරකම් හා මූලික වැඩ නිම කිරීමට ආසන්නය. |
| 03 | පැල්මඩුල්ල- ඇඹිලිපිටිය- පදනංගල මාර්ගය (ඒ 018) | 66.0 | රත්නපුර, හම්බන්තොට | නිර්මාණ ක්‍රියාකාරකම් සම්පූර්ණ කොට ඇත. |
| 05 | මහනුවර - යාපනය මාර්ගය (අඹේපුස්ස - කඩුගන්නාව මාර්ග කොටස | 40.0 | කෑගල්ල , මහනුවර | මූලික මිණුම් කටයුතු හා නිර්මාණ ක්‍රියාකාරකම් සිදුකරමින් පවතී. |
| | එකතුව | 272.7 | | |





**කුඹල්ගොඩ - සීලරතන මාවත** **පහලමාරගහවැව - කටුපතුවැව මාවත**

## 4.15. දෙවන ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන (I Road 2)

මෙම ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රදේශයන්හි මාර්ග ජාලයෙහි ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම තුලින් ග්‍රාමීය ප්‍රජාවන් අතර සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර ප්‍රවේශ අවස්ථා දියුණු කිරීම අපේක්ෂා කෙරේ. ග්‍රාමීය මාර්ග කි.මී. 3,400 ක ප්‍රමාණයක් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සහ උතුර, නැගෙනහිර, ඌව සහ බස්නාහිර යන පළාත් වලට අයත් කි.මී. 340 ක ජාතික මහාමාර්ගයන් ප්‍රතිසංස්කරණය හා නඩත්තුව සහ ආරක්ෂණ විධි, මාර්ග ආරක්ෂාව, නඩත්තුව, පර්යේෂණ ධාරිතාවය සහ මාර්ග සැලසුම් කිරීම හා ඉදිකිරීම යනාදිය සම්බන්ධයෙන් මාර්ග හා සම්බන්ධිත ආයතනයන්හි ධාරිතා වර්ධනය මේ යටතේ සිදු කිරීමට නියමිතය.මෙම ව්‍යාපෘති කාලසීමාව 2018 - 2027 **වේ.** ප්‍රතිසංස්කරණ හා වැඩිදියුණු කිරීමේ කටයුතු ඒ ඒ කොන්ත්‍රාත්තුවේ මුල් වර්ෂ දෙක අවසාන වන විට සම්පූර්ණ කිරීමට නියමිත අතර සහ ඉන්පසුව පිළිවෙලින් ග්‍රාමීය හා ජාතික මහාමාර්ගයන් හි වර්ෂ 3 සහ 5 ක කාලයක් කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කිරීමේ කාල පරිච්ජේදය ක් වේ.

**වගු අංක 4.15.1.- දෙවන ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන යටතේ තෝරාගත් මාර්ග**

| පළාත | දිස්ත්‍රික්කය | ජාතික මාර්ග (කි.මී.) | ජාතික මාර්ග ගණන | ග්‍රාමීය මාර්ග (කි.මී.) | ග්‍රාමීය මාර්ග ගණන | මාර්ග ගණන (එකතුව) | මුලු දුර (කි.මී.) |
|---|---|---|---|---|---|---|---|
| උතුරු පළාත | යාපනය | 114.89 | 1 | 260.24 | 127 | 128 | 1057.77 |
| | කිලිනොච්චිය | | - | 181.78 | 47 | 47 | |
| | මන්නාරම | | 1 | 137.74 | 67 | 68 | |
| | වවුනියාව | | 2 | 221.78 | 62 | 64 | |
| | මුලතිව් | | - | 141.34 | 36 | 36 | |
| නැගෙන | මඩකලපුව | 155.76 | 1 | 184.99 | 123 | 124 | 845.83 |

| පළාත | දිස්ත්‍රික්කය | ජාතික මාර්ග (කි.මි.) | ජාතික මාර්ග ගණන | ග්‍රාමීය මාර්ග (කි.මී.) | ග්‍රාමීය මාර්ග ගණන | මාර්ග ගණන (එකතුව) | මුලු දුර (කි.මී.) |
|---|---|---|---|---|---|---|---|
| හිර | අම්පාර | | 14 | 319.45 | 144 | 158 | |
| | ත්‍රිකුණාමලය | | 1 | 185.63 | 123 | 124 | |
| ඌව | බදුල්ල | 72.9 | 6 | 494.53 | 147 | 153 | 1044.51 |
| | මොනරාගල | | 1 | 477.08 | 95 | 96 | |
| බස්නාහිර | කොළඹ | - | - | 247.21 | 149 | 149 | 799.98 |
| | ගම්පහ | | | 307.37 | 183 | 183 | |
| | කලුතර | | | 245.4 | 102 | 102 | |
| එකතුව | | **343.55** | **27** | **3,404.54** | **1405** | **1432** | **3,748.09** |

මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින්, ණය ගිවිසුම 2017 වසරේ දී අත්සන් කළ අතර ඌව පළාත සඳහා සිවිල් වැඩ කොන්ත්‍රාත්තු සඳහා මිල ගණන් කැඳවා ඇත.

2018 දෙසැම්බර් මස අවසානය වන විට ව්‍යාපෘති ප්‍රගතිය පහත පරිදි වේ.

- ඌව පළාතේ ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලැබූ අතර භෞතික ප්‍රගතිය 6.8% කින් යුක්තව ක්‍රියාත්මක වෙමින් පවතී.
- නැගෙනහිර, උතුර හා බස්නාහිර පළාතේ සිවිල් වැඩ සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

2017 වර්ෂය සඳහා තත්‍ය මූල්‍ය ප්‍රගතිය 98% වූ අතර එය 2016 වර්ෂය සඳහා 99% කි. 2018 වර්ෂයේදී එය 84% වූ අතර එම අගය පෙර වර්ෂ 02 ට වඩා අඩු අගයක පැවතිණි. 2018 වර්ෂය සඳහා වූ මූලික අයවැය ප්‍රතිපාදනය වර්ෂය තුල කිහිපවරක් සංශෝධනය වුවද සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂා කල පරිදි මූල්‍ය ඉලක්කයන් ළඟා කරගෙන නොමැත. ව්‍යාපෘතියේ සමස්ත වියදම මූලික අයවැය ප්‍රතිපාදනය ඉක්මවා ගොස් ඇති අතර තත්‍ය මූල්‍ය ප්‍රගතිය 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව 100% ඉක්මවා ගිය ප්‍රගතියකි. තවද උක්ත ව්‍යාපෘතියේ අදියරයන් 02 අතුරින් අදියර I හි වියදම අදියර II ට වඩා ඉහළ අගයක් ගෙන ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-44** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 13.484.0 | 16,559.0 | 13,933.1 |
| | එකතුව | **13,484.0** | **16,559.0** | **13,933.1** |

## 4.16 රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය

දේශීය වාණිජ බැංකු මගින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත් කළමණාකරණය සඳහා මෙම ව්‍යාපෘතිය ස්ථාපිත කරන ලදී.මාර්ග සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ උපදෙස් මත සිදුකෙරෙන ඉහත මාර්ග ව්‍යාපෘතිය සඳහා මේ වසරේදී කොන්ත්‍රාත්තු 64ක් ප්‍රදානය කර ඇත. එම සියළුම කොන්ත්‍රාත්තු දේශීය කොන්ත්‍රාත්කරුවන් සඳහා ලබාදී ඇත. ඒ අතුරින් මාර්ග ව්‍යාපෘති 59ක ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර ඉන් කොන්ත්‍රාත් පැකේජ 8ක කටයුතු 2017 වර්ෂය තුල සම්පූර්ණ කරන ලදි. එමෙන් ම, 2017 වසර අග වන විට 98% කට වඩා වැඩි භෞතික ප්‍රගතියක් සහිතව සම්පූර්ණ කිරීමට ආසන්න මට්ටමේ ව්‍යාපෘති 2 ක් පැවති අතර එය ද ඇතුලත් ව ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග ව්‍යාපෘති ගණන 5 ක් වේ. 2018 වර්ෂය අවසානය වන විට කොන්ත්‍රාත් පැකේජ 62 ක කටයුතු සම්පූර්ණ කර අති අතර ව්‍යාපෘති 02 ක් පමණක් ක්‍රියාත්මක තත්වයේ පැවතුණු අතර එම ව්‍යාපෘති 02 හි ප්‍රගතිය පහත දැක්වේ.

| අයිතම අංකය | මාර්ගයේ නම | මාර්ග දුර (කි.මී) | දිස්ත්‍රික්කය/ ස්ථානය | 2018/12/31 ට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | කොළඹ- මහනුවර මාර්ගය (-කඩවත - නිට්ටඹුව මාර්ගය) | 23.00 | ගම්පහ | 81% |
| 02 | ලුණුගම්වෙහෙර - කතරගම මාර්ගය | 13.82 | මොණරාගල | 98% |

සම්පූර්ණ කරන ලද හා ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය ඇමුණුම 11 යටතේ දැක්වේ.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | මූලික අයවැය ප්‍රතිපාදනය | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-51** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 24,000.0 | 35,200.0 | 35,194.0 |
| | **එකතුව** | **24,000.0** | **35,200.0** | **35,194.0** |

උක්ත ව්‍යාපෘතියේ 2018 හා 2017 වර්ෂයන්හි සමස්ථ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 99% හා 100% විය.



ලුණුගම්වෙහෙර - කතරගම මාර්ගයේ කි.මී.12+766 හි නිම කරන ලද පාලම



ලුණුගම්වෙහෙර - කතරගම මාර්ගය

## 4.17 ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය

2018.08.15 දිනැති 18/1682/805/051 කැබිනට් තීරණයට අනුව 2018 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කරන ලදී. ඒ අනුව පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශය මඟින් සිවිල් වැඩ ක්‍රියාත්මක කරනු ලබන අතර වත්කම් කළමණාකරණ ක්‍රියාවලිය ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව නව විෂයපථය යටතේ ක්‍රියාත්මක කරනු ලබන සංශෝධිත ක්‍රියාකාරකම් පහත දැක්වේ.

**සංරචක 1:**

වත්කම් කළමනාකරණය සඳහා ආයතනය ශක්තිමත් කිරීම සහ ධාරිතාව ගොඩනැගීම

- මාර්ග සංවර්ධන අධිකාරියේ වත්කම් කළමනාකරණ ඒකකයක් ස්ථාපනය කිරීම.
- සියලුම මාර්ග වත්කම් කළමනාකරණ මොඩියුල භාවිතට ගනිමින් ජාලකරණය සම්පූර්ණයෙන්ම විමර්ෂණය කිරීම, බාහිර දත්ත රැස්කිරීම සහ එම පද්ධතිය කළමනාකරණය කිරීම සඳහා දැනට පවතින වෙබ් අඩවි පදනම් කරගෙන බහුපරිශීලක වත්කම් මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යය මණ්ඩලය යොමු කිරීම.
- මාර්ග ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන් සැකසීම
- මාර්ග ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන් සංවර්ධනය කිරීම
- සුදුසු තීරණ ගැනීම, කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ කළමනාකරණ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම
- මාර්ග ආරක්ෂාව ඉහළ දැමීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් සහ පිරිවිතර සංවර්ධනය කිරීම

**සංරචක2:**

- මාර්ග වත්කම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම.

මේ යටතේ, ප්‍රතිව්‍යුහගත ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා දත්ත පදනම් කරගත් කළමනාකරණ කොන්ත්‍රාත්තුව මඟින් අවශ්‍ය මූල්‍යනය සිදුනොකිරීමට යෝජනා විය.

ප්‍රතිසංස්කරණය හා නඩත්තුව පදනම් කරගත් කොන්ත්‍රාත් ක්‍රමය භාවිතයෙන්, මාර්ග වත්කම් කළමනාකරණ ප්‍රතිපත්ති යටතේ පැලියගොඩ- පුත්තලම මාර්ගයේ (ඒ003) ජා-ඇල සිට හලාවත නගරය අවසානය දක්වා වූ මාර්ග කොටස නිමැවුම් සහ කාර්යසාධනය පදනම් කරගත් ආකෘතියක් යටතේ සිදුකෙරේ.

මෙම ප්‍රතිව්‍යුහගත ව්‍යාපෘතිය යටතේ, ඉහත ක්‍රියාකාරකම සඳහා අත්පත් කරගත් ප්‍රගතිය පහත පරිදි දැක්විය හැක.

1. මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම.
   මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය මඟින් 2018.10.26 දින ව්‍යාපෘති සඳහා අවශ්‍ය සේවක ප්‍රමාණය අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවන ලදී.
2. සංකල්පමය නිර්මාණ සහ මාර්ග වත්කම් ප්‍රතිපත්ති සකස් කිරීම.
   සංකල්පමය නිර්මාණ සකස් කිරීම 2017 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද නමුත් මාර්ග වත්කම් ප්‍රතිපත්ති සකස් කිරීම 2017 වර්ෂයේදී 90% ක ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර 2018 වර්ෂයේදී එහි ඉතිරි කොටස නිමාවට පත්විය.
3. මාර්ග භාවිතා කරන්නන්ගේ තෘප්තිමත්බව විමර්ෂණය කිරීම.
   මෙම ක්‍රියාකාරකම 2017 හා 2018 වර්ෂ වලදී පිළිවෙලින් 95% හා 100% ප්‍රගතියක් අත්කරගනිමින් සම්පූර්ණ කරන ලදී.
4. ඒ003 මාර්ගයේ අනතුරු බහුල ස්ථාන වැඩිදියුණු කිරීම සඳහා සිදුකරනු ලබන ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2017 වර්ෂයේදී නිම කරන ලදී.

තවද, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන්ව තිබූ පහත සඳහන් ක්‍රියාකාරකම් 2018 වර්ෂයේදී ක්‍රියාත්මක නොකෙරුණු බැවින් ප්‍රතිවයුහගත ව්‍යාපෘතිය සඳහා එම ක්‍රියාකාරකම් 02 අන්තර්ගත නොකෙරිණි.

i. නිමැවුම් සහ කාර්යසාධනය මත පදනම් වූ නඩත්තු කොන්ත්‍රාත්තුව
ii. ප්‍රධාන මාර්ගවල සහ අනතුරු බහුල ප්‍රදේශයන්හි ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය 2018 (රු.මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-48** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 550.00 | 92.00 | 31.2 |
| | **එකතුව** | **550.00** | **92.00** | **31.2** |

මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ දී 80% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා වූ අතර 2018 දී එම අගය 34% දක්වා අඩු වී ඇත. මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී හඳුනාගනු ලැබූ නමුදු ඒ සඳහා අයවැය ප්‍රතිපාදන ලැබී ඇත්තේ 2016 වර්ෂයේ අගෝස්තු මාසයේදීය. එසේම 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් වන පරිදි සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් 2017 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද අතර 2018 වර්ෂයේදී ඒවා වෙනස් විය.2018 වර්ෂයේදී ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත වූ බැවින් ඇතැම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට නොහැකිවිය. එමනිසා 2018 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රගතිය වඩා අඩු අගයක් ගෙන ඇත. එසේම ව්‍යාපෘතිය සඳහා වෙන් කර තිබූ අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය මු.රෙ 66 ට අනුව වෙනත් ව්‍යාපෘති සඳහා මාරුකරන ලදී.

### 4.18 ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අදියර II (PRP3- අදියර II)

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන නගර යාකරන මාර්ග වැඩිදියුණුකිරීම සඳහා චීන සංවර්ධන බැංකුව විසින් ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක ණය මුදලක් ලබාදී ඇත.මෙහි ව්‍යාපෘති කාලය මාස 18 වන අතර මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.16,000 කි.මෙම ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කිරීම සඳහා මුළු දුර කි.මී.128.85 ක් වන පරිදි මාර්ග 20 ක් හඳුනා ගනු ලැබූ අතර මේ අතුරින් මාර්ග පැකේජ 13 ක් මහනුවර දිස්ත්‍රික්කය තුල ද ඉතිරි මාර්ග පැකේජ කෑගල්ල දිස්ත්‍රික්කය තුල ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී.

2016 වර්ෂය තුල තෝරාගත් සියලුම මාර්ග (20) සඳහා වූ සිවිල් වැඩ ආරම්භ කළ අතර කොන්ත්‍රාත් පැකේජ 34 හි එක් මාර්ග කොටසක් පමණක් 2017 වර්ෂයේ දී ආරම්භ විය. එක් එක් මාර්ග කොටසෙහි ප්‍රගතිය අනුව, ව්‍යාපෘතිය 2017 වසර අවසාන වන විට සතුටුදායක මට්ටමක් ළගාකරගෙන ඇත.ඒ අනුව, කොන්ත්‍රාත් පැකේජ 42 හැරුනු විට අනිත් සියලු මාර්ග කොටස් 50% වඩා භෞතික ප්‍රගතියක් ළගා කරගෙන ඇත. එයිනුත්, ව්‍යාපෘති 11 ක් 80% වැඩි භෞතික ප්‍රගතියක් ළගා කරගෙන ඇත.

තව ද 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව, කොන්ත්‍රාත් පැකේජ 5 ක් ඉලක්කගත ප්‍රමාණයට වඩා වැඩි භෞතික ප්‍රගතියක් ළගාකරගෙන ඇත. පිළිවෙලින්, තවත් ව්‍යාපෘති 6 ක් 5 ක් සහ 3 ක් 90%, 80% සහ 70% ඉක්මවා යන භෞතික ප්‍රගතියක් 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ළගාකරගෙන ඇත.

2018 වර්ෂයේ දී සියළු මාර්ග පැකේජයන්හි ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වූ අතර 2018 වර්ෂය සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම සැසඳීමේ දී 100% ක භෞතික ඉලක්ක සපුරා ගැනීමේ

ප්‍රගතියක් වාර්තා විය. ප්‍රතිසංස්කරණ කටයුතු සහ වැඩිදියුණු කිරීම් කටයුතු නිම කරන ලද එක් එක් මාර්ග පැකේජයන්හි භෞතික ප්‍රගතීන් ඇමුණුම 12 මගින් දක්වා ඇත.

ඉහත ප්‍රතිසංස්කරණ කටයුතු සහ වැඩිදියුණු කිරීම් කටයුතු නිම කරන ලද මාර්ග 20ට අමතර ව පැකේජ අංක 24 සහ පැකේජ අංක 28 හි ඉතුරුම් උපයෝගී කර ගනිමින් නව පැකේජ 2ක ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම් කටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ වූ අතර එම මාර්ග පැකේජයන් පහත පරිදි දැක්විය හැකිය. මෙම නව පැකේජයන් 2න් පළමුවැන්න 2018 පළමු කාර්තුවේ දී ආරම්භ කළ අතර දෙවැන්න 2018 දෙවන කාර්තුවේ පළමු මාසයේ දී ආරම්භ කරන ලදී.

| මාර්ගය | දුර ප්‍රමාණය (කි.මී.) | පිහිටි දිස්ත්‍රික්කය | 31/12/2018 වන විය අත්කර ගත් භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| හීදෙණිය -මැදවල මාර්ගය (සී 24 වී ០) | 3.3 | මහනුවර | 57% |
| පුස්සැල්ලාගම – උල්පොත මාර්ගය (සී 28 වී ០) | 2.9 | මහනුවර | 65% |

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සහ වැඩිදියුණු කිරීම් කටයුතු නිම කරන ලද මාර්ග කොටස් කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.



හීන් නාරංදෙණිය මංසන්ධිය සිට උඩිවිට ඇල්පිටිය මාර්ගය දක්වා සහ ඇල්පිටිය ගහ සිට-වැලිගම මංසන්ධිය දක්වා වූ මාර්ග කොටස



එරමුදුලියද්ද - කොළුගල - තිස්මැද මාර්ගය

ඉහත ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂය තුල 82% ක මූල්‍ය ප්‍රගතියක් හා 2017 වර්ෂය අවසාන වන විට 83% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත. මේ අනුව 2018 වර්ෂයේ දී මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය 2017 වසර සමඟ සමගාමීව සිදු ව ඇති අතර එම අගය 2017ට සාපේක්ෂව 1%කින් සුළු පසුබෑමකට ලක්ව ඇත. එනමුත් මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ දී වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණය සමඟ සැලකූ කල වසර අවසානයේ දී අත්කර ගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 100% ඉක්මවූ ප්‍රමාණයක් ලෙස දැක්විය හැකිය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය 2018 (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-46** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 2,120.0 | 4,470.0 | 3,654.2 |
| | **එකතුව** | **2,120.0** | **4,470.0** | **3,654.2** |

## 4.19 බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය- අදියර III

බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ මූලික සැලසුම වූයේ කිරුළපන හන්දියේ සිට මැලිබන් හන්දිය දක්වා වූ මාර්ගය දීර්ඝ කිරීමයි. නමුත් එම සැලසුම කැබිනට් පත්‍රිකාවක් මඟින් දුටුගැමුණු වීදිය දක්වා සීමා විය.ඒ අනුව ව්‍යාපෘතියේ මුළු දුර කි.මී.0.86 කි. යෝජිත මාර්ගය මංතීරු 3කින් යුක්ත ව ද්විත්ව මහාමාර්ගයක් ලෙස ඉදි කිරීමට නියමිත අතර මෙම මාර්ගයට යටින් කිරුලපන මංසන්ධියේ දී උමං මාර්ගයක් ද මාර්ගයට ඉහළින් බලපොකුණ මාර්ගය වෙත ප්‍රවේශ විය හැකි පරිදි ගුවන් මාර්ගයක් ද ඉදි කිරීමට සැලසුම් කර ඇත.මෙම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු 2016.12.07 දින ලබා දුන් අධිකරණ නියෝගයක් හේතුවෙන් තාවකාලිකව නවතා දැමීමට සිදු වූ අතර 2018.05.23 වන දින එහි කටයුතු නැවතත් ආරම්භ කිරීම සඳහා අධිකරණ අනුමැතිය ලැබුණි. මේ අනුව කිරුළපන හන්දියේ සිට දුටුගැමුණු වීදිය දක්වා වූ මාර්ග කොටසෙහි ඉඩම් අත් පත් කර ගැනීමේ කටයුතු නැවතත් ආරම්භ විය. 2018 වසර අවසානයේ දී උක්ත ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 50%ක භෞතික ප්‍රගතියක් අත් කරගැනීමට සමත් ව ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය 2018 (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-04-10** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 150.0 | 105.0 | 10.8 |
| | **එකතුව** | **150.0** | **105.0** | **10.8** |

2017 වර්ෂයේ දී 62% ක් ලෙස වාර්තා වූ මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය 2018 වර්ෂයේ දී 10% දක්වා අඩු වූ අතර ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නැවතත් ආරම්භ කිරීම සඳහා අධිකරණ අනුමැතිය වසරේ මැද භාගයේ දී ලැබීම මීට බලපෑ ප්‍රධානතම සාධකය ලෙස පෙන්වාදිය හැකිය.

## 4.20 බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතිය මගින් බස්නාහිර පළාතේ, විශේෂයෙන්ම කොළඹ හා කළුතර දිස්ත්‍රික්කවල තොරාගත් මාර්ග කිහිපයක් වැඩිදියුණු කිරීම සඳහා ඔපෙක් සංවර්ධනය සඳහා වූ අරමුදල මගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 17.00 ක ණය මුදලක් ලබාදී ඇත.ඒ අනුව ජාතික මාර්ග කි.මී.25.81 ක් සංවර්ධනය කරනු ලබයි. බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත මාර්ග කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම කරනු ලැබේ.

**වගු අංක 4.20.1 බස්නාහිර පළාත් ජාතික මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ තොරා ගත් මාර්ග**

| අනු අංකය | මාර්ග කොටස | දුර (කි.මී) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| **01** | කඩුවෙල - අතුරුගිරිය මාර්ගය(කි.මී.0+0009+500) | 9.50 | ඉදි කිරීම්/ සිවිල් වැඩ - 11% |
| | | | |
| **02** | වල්ගම- අතුරුගිරිය මාර්ගය (කි.මී.0+000– 1+210) | 1.21 | |
| **03** | වාද්දුව - මෙරොන්තුඩුව මාර්ගය(කි.මී.1+000-5+300) | 5.30 | ඉදි කිරීම්/ සිවිල් වැඩ - 50% |
| **04** | බෙල්ලන - මාරගල්ල මාර්ගය (කි.මී.0+000– 9+800) | 9.80 | |

ඉහත වගුවෙහි අංක 01 සහ 02 යටතේ ඇති මාර්ගයන් හි සිවිල් වැඩ 2018 වසරේ දී ආරම්භ වූ අතර දෙසැම්බර් මස අවසන් වන විට 11%ක භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට සමත් ව ඇත. උක්ත මාර්ගයන් 2 හි භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය 2018 වසර සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීමේ දී 44% ලෙස ගණනය කළ හැකි අතර මාර්ග අංක 03 සහ 04 හි සිවිල් වැඩ 2017 වර්ෂයේ ඔක්තොම්බර් මස 05 වන දින ආරම්භ විය. මේ අනුව එම මාර්ග 2හි භෞතික ප්‍රගතිය 2017 අවසානයේ දී 2% වූ අතර 2018 වසර අවසානයේ දී 50% දක්වා ඉදි කිරීම් කටයුතු නිම කර ගැනීමට සමත් ව ඇත.

මෙම මාර්ග 2019 වර්ෂයේ 3 වන කාර්තුවේ දී නිම කිරීමට සැලසුම් කර ඇති අතර 2018 වර්ෂය තුළ දී අත්කර ගනු ලැබූ භෞතික ප්‍රගතිය 48% ලෙස ද 2018 වසර සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේ දී අත් කර ගනු ලැබූ භෞතික ප්‍රගතිය 87% ලෙස ද දැක්විය හැකිය. තව ද උක්ත මාර්ගයන් 4 හි ම සිවිල් වැඩ 2017 දී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණ ද ඉඩම් අත් පත් කර ගැනීමේ

ක්‍රියාවලියෙහි සිදු වූ ප්‍රමාදයන් නිසා ඉදි කිරීම් කටයුතු නියමිත කාලයන්හි දී ඇරඹීමට නොහැකි වූ අතර ඉලක්කය සපුරාගැනීමට අපොහොසත් වූ අතර අංක 01 සහ 02 යටතේ ඇති මාර්ගයන්හි ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලියෙහි භෞතික ප්‍රගතිය 75%ට වැඩි වූ අතර අංක 3හි සහ 4හි මාර්ගයන්හි ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලියෙහි භෞතික ප්‍රගතිය පිළිවෙලින් 26% සහ 35% ලෙස දැක්විය හැකිය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය 2018 (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| 117-02-04-40 | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 450.0 | 1082.7 | 882.49 |
| | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 200.0 | 140.0 | 140.0 |
| | **එකතුව** | **650.0** | **1,222.7** | **1,022.49** |

මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේ දී 7% ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. ඉලක්කගත ආකාරයට සිවිල් වැඩ ආරම්භ කළ නොහැකි වූ බැවින් එය මූල්‍ය ප්‍රගතිය කෙරෙහි ද බලපා ඇත. මීට බලපෑ ආසන්නතම හේතුව ලෙස ද ඉඩම් අත් පත් කර ගැනීමේ ක්‍රියාවලියෙහි සිදු වූ ප්‍රමාදයන් දැක්විය හැකි අතර එය සමස්ත මූල්‍ය ප්‍රගතිය කෙරෙහි ද සෘජුව බලපෑ අතර ඉන් මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමේ ක්‍රියාවලිය ද පසුබෑමට ලක්විය.

2018 වර්ෂයේ දී ඉහත ව්‍යාපෘතිය මගින් අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය 84% වූ අතර අයවැය මගින් වසර ආරම්භයේ දී වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන ප්‍රමාණය 50%න් සංශෝධනයට ලක් විය. මේ අනුව මෙම ව්‍යාපෘතිය මගින් අත්කර ගත් මූල්‍ය ප්‍රගතිය 2017 වසර සමඟ සැසඳීමේ දී වඩාත් වර්ධිත වූ බව නිරීක්ෂණය විය.

### 4.21 මධ්‍යම හා ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මධ්‍යම හා ඌව පළාත් වල මාර්ග කි.මී. 64.31 ක් පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා චීන අපනයන - ආනයන බැංකුව (හුනාන් ශාඛාව) සහ මහජන බැංකුව මඟින් ශ්‍රී ලංකා රජය වෙත ණය මුදලක් ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ ක්‍රියාත්මක වන අතර ඒ සඳහා ගතවන කාලසීමාව, මාර්ග ඉදිකිරීම් පැකේජය (සී 1) සඳහා මාස 24කුත් පාලම් ඉදිකිරීමේ පැකේජය (සී 2) සඳහා මාස 18 කුත් ලෙස දැක්විය හැක. 2018 වසරේ ජූනි මාසයේදී ව්‍යාපෘතියේ ණය ගිවිසුම අත්සන් කර ති අතර මෙහි

සිවිල් වැඩකටයුතු මෙතෙක් ආරම්භ වී නොමැත. ව්‍යාපෘතියේ නිර්මාණ කටයුතු 1% ක ප්‍රගතියක් සහිතව ක්‍රියාත්මක වෙමින් පවතී.

**වගු අංක 4.21.1 - ව්‍යාපෘතිය යටතේ පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමට තොරා ගනු ලැබූ මධ්‍යම හා ඌව පළාත් වල මාර්ග හා පාලම් පිළිබඳ විස්තර**

| කොන්ත්‍රාත් අංක | මාර්ග/පාලම් පැකේජය | දුර (කි.මී.)/පාලම් සංඛ්‍යාව |
|---|---|---|
| **සී 1** | මහනුවර – කිරිමැටිය මාර්ගය | කි.මී.7.64 |
| | අම්පිටිය – ගුරුදෙනිය (පිච්චමල්වත්ත) මාර්ගය | කි.මී.2.25 |
| | නුවරඑළිය – රාගල – උඩපුස්සැල්ලාව මාර්ගය | කි.මී.27.00 |
| | වැලිමඩ – කර්ක්ලස් මාර්ගය | කි.මී.17.83 |
| | අවිස්සාවේල්ල – හැටන් – නුවරඑළිය මාර්ගයd | කි.මී.9.59 |
| සී 2 | තැන්නකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගයේ පාලම් අංක 24/3 සහ 42/1 නැවත ඉදිකිරීම | 02 |
| | මහනුවර - කිරිමැටිය මාර්ගයේ පාලම් අංක 3/2 නැවත ඉදිකිරීම | 01 |
| | නුවරඑළිය - රාගල - උඩුපුස්සැල්ලාව මාර්ගයේ පාලම් අංක 23/3, 27/2, 30/4, 31/5, 34/8, 37/1 සහ 38/5 නැවත ඉදිකිරීම | 07 |
| | වැලිමඩ - කර්ක්ලස් මාර්ගයේ පාලම් අංක 1/1, 2/5 සහ 7/7 නැවත ඉදිකිරීම | 03 |

මධ්‍යම හා ඌව පළාත් වල මාර්ග හා පාලම් *පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමේ* ව්‍යාපෘතියට අයත් මාර්ග හා පාලම් ලැයිස්තුව **ඇමුණුම 13** යටතේ දැක්වේ.

## 4.22 ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය

මාර්ග, දුම්රිය සහ වරාය වැනි ප්‍රමුඛ ප්‍රවාහන අංශවල ආරම්භක කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍යාධාර මත මෙම ව්‍යාපෘතිය සිදු කරනු ලබයි. මේ යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි.

- ශක්‍යතා අධ්‍යනය, සවිස්තරාත්මක සැලසුම් සහ ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම සහ
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආරම්භක අදියර තුළ ක්‍රියාත්මක කිරීමේ සහය ලබාදීම

මෙම ව්‍යාපෘතිය යටතේ දැනට ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් 03 පහතින් දක්වා ඇත.

**වගුඅංක 4.22.1 2018.12.31 දිනට ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය**

| අයිතම අංකය | ව්‍යාපෘතියේ නම / මාර්ග සංවර්ධන අධිකාරී අංශය | ආරම්භ කළ දිනය | අවසන් කළ දිනය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **1** | කුළුණු මත ඉදිවන වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතියේ විස්තරාත්මක නිර්මාණය සඳහා වන උපදේශන සේවා සැපයීම. | 20-02-2017 | 19-02-2018 | 100% |
| **2** | පැලියගොඩ - රාජගිරිය දක්වා කුළුණු මත ඉදිවන අධිවේගී මාර්ගයේ මූල්‍ය උපදේශනය සඳහා වන උපදේශන සේවය (ඒකපුද්ගල) ( ICS 01) | 16-10-2017 | 10-02-19 | 80% |
| **3** | පැලියගොඩ - රාජගිරිය දක්වා කුළුණු මත ඉදිවන අධිවේගී මාර්ගයේ භූවමාරු උපදේශනය සඳහා වන උපදේශන සේවය ( ඒකපුද්ගල) (ICS 03) | 10-10-2017 | 10-02-19 | 90% |

උක්ත අයිතම අංක 01 යටතේ දැක්වෙන්නා වූ ක්‍රියාකාරකම 2017 අවසානයේ දී 72% ක ප්‍රමාණයක් නිම වූ අතර 2018 වර්ෂයේ දී 100% දක්වා නිම කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව 2018 වසර තුළ දී නිම කිරීමට නියමිත ව තිබූ 28% ක ප්‍රමාණය සැලසුම් කළ පරිදි සාර්ථක ව නිම කිරීමට හැකි වූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳීමේ දී එය 100% භෞතික ඉලක්ක සපුරා ගැනීමක් ලෙස දැක්විය හැකිය. අයිතම අංක 2 සහ 3 2017 දී සම ප්‍රගතීන් අත්කර ගත් අතර 2018 වර්ෂයේ දී නිම කිරීමට අපේක්ෂිත ව පැවතිය ද එම අයිතමයනට අයත් වූ ක්‍රියාකාරකම් 100% දක්වා නිම කර ගැනීමට නොහැකි විය. මේ අනුව අයිතම අංක 2 සහ 3 යටතට ගැනෙන ක්‍රියාකාරකම්හි භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතීන් පිලිවෙළින් 60% සහ 80% ලෙස දැක්විය හැකිය. එක් එක් ක්‍රියාකාරකම්හි භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතීන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේ දී අත් කර ගනු ලැබූ ප්‍රගතීන් පහත පරිදි දැක්විය හැකිය.



සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2018 වර්ෂයේ දී උක්ත ව්‍යාපෘතිය මගින් අත් කර ගනු ලැබූ සමස්ත භෞතික ප්‍රගතිය 75% වූ අතර 2017 අවසානයේ දී එය 53% ලෙස වාර්තා විය. මේ අනුව මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයට සාපේක්ෂ ව 2018 වර්ෂයේ දී වඩාත් වර්ධිත වූ සමස්ත මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමත් ව ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය 2018 (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| 117-02-04-47 | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 45.0 | 279.0 | 208.0 |
| | **එකතුව** | **45.0** | **279.0** | **208.0** |

## 4.23 පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය

90 දශකය අගභාගය පමණ වනවිට සමුද්‍රීය මාර්ගය ඉදිකිරීම, කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රථවාහන තදබදය අවම කිරීම සඳහා වඩාත් සුදුසු විකල්පයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව 1998 දී ආරම්භ කරන ලද සමුද්‍රීය මාර්ගය ඉදිකිරීම් කටයුතු විවිධ අදියරයන් යටතේ රත්මුතු හෝටලය සිට දෙහිවල දක්වා ක්‍රියාත්මක කරන ලදී. (කි.මී. 0+520 - කි.මී. 8+420)

යෝජිත වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ කිරීම හා ප්‍රවේශවීමට හැකිවන අයුරින් සමුද්‍රීය මාර්ගය ගාලුමුවදොර දක්වා දීර්ඝ කිරීමට යෝජනා වී ඇත. කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ රථවාහන ධාරිතාවය සීඝ්‍රයෙන් ඉහලයාම නිසා වර්තමානයේදී දවසේ ඕනෑම කාලසීමාවක් තුලදී කොළඹ සිට දෙහිවල දක්වා රථවාහන තදබදයක් ඇතිවනබව වාර්තා වී ඇත.මේ සඳහා ප්‍රධාන හේතුවක් වන්නේ විකල්ප මාර්ගයක් නොමැති වීමයි. මේ හේතුවෙන් උක්ත සමුද්‍රීය මාර්ගය පානදුර දක්වා දීර්ඝ කිරීමට යෝජනා වී ඇත.

2018 දෙසැම්බර් මස අවසානය වනවිට දෙහිවල සිට පානදුර දක්වා වන අදියර සඳහා ශක්‍යතා අධ්‍යනය සහ ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතින අතර භූමි විමර්ෂණ කටයුතු සම්පූර්ණ කර ඇති අතර බම්බලපිටිය සිට කොල්ලුපිටිය පදික මංතීරුව දක්වා වන කොටසෙහි වැඩකටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. මේ යටතේ ක්‍රියාත්මක වන එක් එක් ක්‍රියාකාරකම්හි භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතීන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේ දී අත් කර ගනු ලැබූ ප්‍රගතීන් 2017 වර්ෂයට සාපේක්ෂ ව 2018 වර්ෂයේ දී වඩාත් වර්ධිත වූ බව දැක්විය හැකිය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය 2018 (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| 117-02-04-49 | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 100.0 | 200.0 | 76.2 |
| | **එකතුව** | **100.0** | **200.0** | **76.2** |

2018 වර්ෂය අවසන් වන විට මෙම ව්‍යාපෘතිය මගින් අත් ක ගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 50%ට වඩා අඩු වූ අගයක් වූ අතර ඒ සඳහා බලපෑ ප්‍රධානතම හේතුව ලෙස මේ යටතේ ක්‍රියාත්මක වන බොහෝ ක්‍රියාකාරකම් ඒවායෙහි පූර්ව අවධීන්හි පැවතීම දැක්විය හැකිය. තව ද 2017 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය 10% ක මූල්‍ය ප්‍රගතියක් පමණක් වාර්තා විය.

## 5.0 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම

### 5.1 මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම

ප්‍රධාන මාර්ග සහ කුඩා මාර්ග කොටස් සමග සම්බන්ධ කරනු ලබන අවධානයට ලක්විය යුතු එහෙත් විදේශාධාර මත ක්‍රියාත්මක කළ නොහැකි සහ අබලන් කුඩා පාලම්, මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කිරීම හා නැවත ඉදිකිරීම සිදුකරනු ලැබේ. 2018 වර්ෂය තුල වැඩිදියුණු කරන ලද මාර්ග ප්‍රමාණය කි.මී 364.78 ක් වන අතර වර්ෂය අවසානය වන විට කි.මී.337.32 ක වැඩිදියුණුකිරීම් සිදු කරමින් පැවතිනි. තවද, 2018 වර්ෂය තුල ඉලක්කගත මාර්ග වැඩිදියුණුකිරීම් ප්‍රමාණය කි.මී.825.87 වූ අතර වර්ෂය අවසානය වන විට එම මාර්ග දුර ප්‍රමාණයෙන් 44% ක වැඩිදියුණු කිරීම් නිම කොට ඇත. 2017 වර්ෂයට සාපෙක්ෂව 2018 වර්ෂයේ ඉලක්ක අත්පත්කරගැනීම් පිළිබඳ ප්‍රගතිය පහත පරිදි දැක්වේ.







මාර්ගවලට අමතරව 2017 වර්ෂයේදී පාලම් 12 ක් ද ප්‍රතිසංස්කරණය සඳහා හඳුනාගනු ලැබූ අතර එයින් පාලම් 02 ක වැඩකටයුතු අවසන් කොට ඇත. උක්ත සඳහන් පාලම් 12න් 7ක් බස්නාහිර පළාතට අයත් වන අතර 5ක් දකුණු පළාතෙහි පිහිටා ඇත. 2018 වර්ෂය තුල පාලම් 08 ක් ප්‍රතිසංස්කරණය සඳහා හඳුනාගනු ලැබූ අතර වර්ෂය අවසාන වන විට එයින් පාලම් 06 ක වැඩකටයුතු නිම කොට තිබුණි. ඒ අතුරින් පාලම් 05 ක් බස්නාහිර පළාත තුල මෙන්ම අනෙකුත් පාලම් දකුණු පලාත තුල ද පිහිටා තිබුණි.

2018 දෙසැම්බර් මාසය දක්වා ඒ ඒ දිස්ත්‍රික්කවල ප්‍රතිසංස්කරණය කිරීම හා නැවත ඉදිකිරීම සිදුකරනු ලැබූ මාර්ගයන්හි භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

වගු අංක 5.1.1 2018 වර්ෂයේ මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ භෞතික ප්‍රගතිය

| දිස්ත්‍රික්කයේ නම | 2018.12.31 ට භෞතික ඉලක්ක (%) | 2018 12.31 ට භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | 100 | 52 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 100 | 82 |
| කළුතර දිස්ත්‍රික්කය | 100 | 76 |
| නුවර දිස්ත්‍රික්කය | 100 | 63 |
| මාතලේ දිස්ත්‍රික්කය | 100 | 29 |
| නුවර-එළිය දිස්ත්‍රික්කය | 100 | 40 |
| මාතර දිස්ත්‍රික්කය | 100 | 81 |
| ගාල්ල දිස්ත්‍රික්කය | 100 | 65 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 100 | 91 |
| යාපනය දිස්ත්‍රික්කය | 100 | 100 |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 100 | 77 |
| මන්නාරම දිස්ත්‍රික්කය | 100 | 100 |
| වව්නියා දිස්ත්‍රික්කය | 100 | 100 |
| මුලතිව් දිස්ත්‍රික්කය | 100 | 51 |
| මඩකලපුව දිස්ත්‍රික්කය | 100 | 97 |
| අම්පාර දිස්ත්‍රික්කය | 100 | 23 |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 100 | 84 |
| කුරුණැගල දිස්ත්‍රික්කය | 100 | 42 |
| පුත්තලම දිස්ත්‍රික්කය | 100 | 86 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | 100 | 47 |
| පොලොන්නරුව දිස්ත්‍රික්කය | 100 | 100 |
| බදුල්ල දිස්ත්‍රික්කය | 100 | 7 |
| මොණරාගල දිස්ත්‍රික්කය | 100 | 29 |
| කෑගල්ල දිස්ත්‍රික්කය | 100 | 10 |
| රත්නපුර දිස්ත්‍රික්කය | 100 | 24 |

2017 වර්ෂය අවසන් වන විට මෙම දිස්ත්‍රික්ක 25 අතරින් දිස්ත්‍රික්ක කිසිවක 100% ක භෞතික ප්‍රගතියක් දක්නට නොමැති වුවද 2018 වර්ෂය අවසන් වන විට දිස්ත්‍රික්ක 04 ක 100% ක භෞතික ප්‍රගතියක් වාර්තා කොට තිබුණි. එම දිස්ත්‍රික්ක 04 අතුරින් දිස්ත්‍රික්ක 03 ක් උතුරු පළාතට අයත් වන අතර ඒවා නම් යාපනය, මන්නාරම හා වවුනියාව යන දිස්ත්‍රික්ක වන අතර ඊට අමතර වශයෙන් පොලොන්නරුව දිස්ත්‍රික්කයද මීට

ඇතුලත් වේ.2017 වර්ෂය තුල වැඩිම භෞතික ප්‍රගතියක් වාර්තා කොට ඇත්තේ නුවර හා ගාල්ල දිස්ත්‍රික්ක සඳහාය.

2017.12.31 වන විට දිස්ත්‍රික්ක 14 ක් 90% ඉක්මවූ භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබූ අතර 2018 වර්ෂාවසානය වන විට එය එක් දිස්ත්‍රික්කයක් සඳහා පමණක් විය. 2017 වසරේ සිව්වන කාර්තුව අවසානයේදී කොළඹ, කළුතර, මාතලේ,අම්පාර, යාපනය, වවුනියා, මොණරාගල සහ රත්නපුරය යන දිස්ත්‍රික්ක 75%-100% අතර භෞතික ප්‍රගතියක් වාර්තා කොට ඇති අතර 2018 වර්ෂයේදී පුත්තලම, ත්‍රිකුණාමලය, ගම්පහ, මාතර, කිළිනොච්චිය හා කළුතර යන දිස්ත්‍රික්ක 75%-100% අතර භෞතික ප්‍රගතියක් වාර්තා කොට තිබුණි.

2017 වර්ෂාවසානයේදී මුළු දිස්ත්‍රික්ක 25 අතුරින් 75% ට අඩු භෞතික ප්‍රගතියක් වාර්තා කොට තිබුණේ එක් දිස්ත්‍රික්කයක් පමණක් වූ අතර 2018 වර්ෂාවසානයේදී දිස්ත්‍රික්ක 13 ක් 75% ට අඩු භෞතික ප්‍රගතියක් වාර්තා කොට තිබුණි. ඒ අතුරින් දිස්ත්‍රික්ක 04 ක භෞතික ප්‍රගතිය 25% ක අගයක් විය.

2018 වර්ෂය අවසානයේදී බදුල්ල දිස්ත්‍රික්කය 7% ක් වූ අවම භෞතික ප්‍රගතිය ළඟා කර ගෙන තිබුණු අතර 2017 වර්ෂය අවසානයේදී නුවරඑළිය දිස්ත්‍රික්කය අවම භෞතික ප්‍රගතියක් වාර්තා කොට තිබුණි.

මහාමාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය වාර්ෂික ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වුවද සෑම වර්ෂයකම භෞතික හා මූල්‍ය ඉලක්කයන් , ප්‍රතිපාදන ඉල්ලීම් හා අයවැය ප්‍රතිපාදනයන්ට අනුව ස්ථාපිත කරනු ලැබේ.

**වගු අංක 5.1.2 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| දිස්ත්‍රික්කයේ නම | 2017.12.31 ට භෞතික ඉලක්ක (%) | 2017 12.31 ට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | 100 | 83 |
| ගම්පහ දිස්ත්‍රික්කය | 100 | 95 |
| කළුතර දිස්ත්‍රික්කය | 100 | 82 |
| නුවර දිස්ත්‍රික්කය | 100 | 98 |
| මාතලේ දිස්ත්‍රික්කය | 100 | 80 |
| නුවර-එළිය දිස්ත්‍රික්කය | 100 | 52 |
| මාතර දිස්ත්‍රික්කය | 100 | 92 |
| ගාල්ල දිස්ත්‍රික්කය | 100 | 98 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 100 | 95 |
| යාපනය දිස්ත්‍රික්කය | 100 | 85 |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 100 | 95 |
| මන්නාරම දිස්ත්‍රික්කය | 100 | 93 |
| වව්නියා දිස්ත්‍රික්කය | 100 | 85 |

| දිස්ත්‍රික්කයේ නම | 2017.12.31 ට භෞතික ඉලක්ක (%) | 2017 12.31 ට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| මුලතිව් දිස්ත්‍රික්කය | 100 | 93 |
| මඩකලපුව දිස්ත්‍රික්කය | 100 | 95 |
| අම්පාර දිස්ත්‍රික්කය | 100 | 88 |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 100 | 92 |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | 100 | 95 |
| පුත්තලම දිස්ත්‍රික්කය | 100 | 90 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | 100 | 95 |
| පොලොන්නරුව දිස්ත්‍රික්කය | 100 | 95 |
| බදුල්ල දිස්ත්‍රික්කය | 100 | 93 |
| මොණරාගල දිස්ත්‍රික්කය | 100 | 90 |
| කෑගල්ල දිස්ත්‍රික්කය | 100 | 92 |
| රත්නපුර දිස්ත්‍රික්කය | 100 | 90 |

මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා 2018 වසරට සාපේක්ෂ ව 2017 වසරේදී අත් කර ගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

**වගු අංක 5.1.3 2018 හා 2017 වර්ෂයන්හි ලබාගෙන ඇති සමස්ත මූල්‍ය ප්‍රගතිය**

| වර්ෂය | අයවැය ප්‍රතිපාදනය(රු.මි.) | වියදම(රු.මි.) | මූල්‍ය කාර්යසාධනය (%) |
|---|---|---|---|
| **2018** | 10,865.0 | 7,559.0 | 70% |
| **2017** | 10,734.4 | 9,211.5 | 86% |

මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදනය වූ රු.මි.10,865, 2017 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වූ රු.මි.10,734.40 ට වඩා 1% පමණ වූ සුළු වැඩිවීමක් දක්නට ලැබුණි. 2018 වර්ෂයේදී නුවර, හම්බන්තොට, කුරුණෑගල, බදුල්ල යන දිස්ත්‍රික්ක හා උතුරු හා උතුරු මැද යන පළාත්වල සියළු දිස්ත්‍රික්කයන්හි හැර අනෙකුත් සියළු දිස්ත්‍රික්ක වල මූලික අයවැය ප්‍රතිපාදනය සංශෝධනය වී තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ පළාතභාර අධ්‍යක්ෂකවරුන්ගේ අතිරේක ප්‍රතිපාදන ඉල්ලීම මත බස්නාහිර පළාත, මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කය. දකුණු පළාතේ මාතර හා ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි මූලික අයවැය ප්‍රතිපාදනය වර්ෂය තුල ඉහළ නංවන ලදී. 2018 වර්ෂයේදී දිස්ත්‍රික්ක 05 ක් 100% ට වැඩි මූල්‍ය කාර්යසාධනයක්ද , දිස්ත්‍රික්ක 03 ක 100% ක මූල්‍ය කාර්යසාධනයක්ද වාර්තා කොට

ඇත. මීට අමතර වශයෙන් තවත් දිස්ත්‍රික්ක 04 ක් 80% ට වැඩි මූල්‍ය ප්‍රගතියක් කරා ළඟා වී ඇත. 2018 වර්ෂාවසානය වන විට මන්නාරම දිස්ත්‍රික්කය අවම මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇති අතර තවත් ව්‍යාපෘති 05 ක් 20% ට අඩු මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත. 2018 වසර අවසානයේ එක් එක් දිස්ත්‍රික්ක සඳහා වාර්තා වූ මූල්‍ය කාර්යසාධනය පහත වගුවේ දැක්වේ.

**වගු අංක 5.1.4 2017.12.31 දිනට අයවැය ප්‍රතිපාදනය**

| අයවැය ශීර්ෂය | දිස්ත්‍රික්කය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 117-02-05-01-2104-11 | කොළඹ දිස්ත්‍රික්කය | 800.0 | 944.0 | 283.7 | 30% |
| 117-02-05-02-2104-11 | ගම්පහ දිස්ත්‍රික්කය | 600.0 | 705.0 | 368.5 | 52% |
| 117-02-05-03-2104-11 | කළුතර දිස්ත්‍රික්කය | 500.0 | 568.0 | 104.7 | 18% |
| 117-02-05-04-2104-11 | නුවර දිස්ත්‍රික්කය | 450 | 450.0 | 378.4 | 84% |
| 117-02-05-05-2104-11 | මාතලේ දිස්ත්‍රික්කය | 300 | 331.0 | 50.05 | 15% |
| 117-02-05-06-2104-11 | නුවර-එළිය දිස්ත්‍රික්කය | 200 | 237.0 | 44.99 | 19% |
| 117-02-05-07-2104-11 | මාතර දිස්ත්‍රික්කය | 300 | 345.0 | 229.54 | 67% |
| 117-02-05-08-2104-11 | ගාල්ල දිස්ත්‍රික්කය | 250 | 269.0 | 51.43 | 19% |
| 117-02-05-09-2104-11 | හම්බන්තොට දිස්ත්‍රික්කය | 300 | 300.0 | 278.28 | 93% |
| 117-02-05-10-2104-11 | යාපනය දිස්ත්‍රික්කය | 150 | 150.0 | 81.73 | 54% |
| 117-02-05-11-2104-11 | කිලිනොච්චි දිස්ත්‍රික්කය | 150 | 150.0 | 154.1 | 103% |
| 117-02-05-12-2104-11 | මන්නාරම දිස්ත්‍රික්කය | 175 | 175.0 | 0.65 | 0% |
| 117-02-05-13-2104-11 | වව්නියා දිස්ත්‍රික්කය | 175 | 175.0 | 117.21 | 67% |
| 117-02-05-14-2104-11 | මුලතිව් දිස්ත්‍රික්කය | 175 | 175.0 | 239.2 | 137% |
| 117-02-05-15-2104-11 | මඩකලපුව දිස්ත්‍රික්කය | 100 | 100.0 | 117.57 | 118% |
| 117-02-05-16-2104-11 | අම්පාර දිස්ත්‍රික්කය | 125 | 125.0 | 104.95 | 84% |
| 117-02-05-17-2104-11 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 75 | 75.0 | 61.75 | 82% |
| 117-02-05-18-2104-12 | කුරුණෑගල දිස්ත්‍රික්කය | 300 | 300.0 | 412.0 | 137% |
| 117-02-05-19-2104-13 | පුත්තලම දිස්ත්‍රික්කය | 300 | 347.0 | 183.3 | 53% |
| 117-02-05-20-2104- | අනුරාධපුර | 300 | 300.0 | 313.3 | 104% |

| අයවැය ශීර්ෂය | දිස්ත්‍රික්කය | මූලික අයවැය ප්‍රතිපාදනය (රු.මි) | සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2018.12.31 දිනට වියදම | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 14 | දිස්ත්‍රික්කය | | | | |
| 117-02-05-21-2104-15 | පොලොන්නරුව දිස්ත්‍රික්කය | 400 | 400.0 | 180.81 | 45% |
| 117-02-05-22-2104-16 | බදුල්ල දිස්ත්‍රික්කය | 200 | 200.0 | 146.87 | 73% |
| 117-02-05-23-2104-17 | මොණරාගල දිස්ත්‍රික්කය | 150 | 30.96 | 30.96 | 100% |
| 117-02-05-24-2104-18 | කෑගල්ල දිස්ත්‍රික්කය | 200 | 134.19 | 134.19 | 100% |
| 117-02-05-25-2104-19 | රත්නපුර දිස්ත්‍රික්කය | 150 | 200.85 | 200.85 | 100% |
| 117-02-05-26-2104-20 | බදු | 800 | 800.0 | 589.7 | 74% |
| 117-02-05-29-2104-21 | ජාතික ඉතිරිකිරීම් බැංකු ආධාර ව්‍යාපෘති | 2700 | 2700.0 | 2700.0 | 100% |
| **එකතුව** | | **10737.40** | **9525.0** | **10,865.0** | **7,559** |

2017.12.31 දිනට එක් එක් දිස්ත්‍රික්ක අත්පත් කරගත් මූල්‍ය කාර්යසාධනය පහත වගුවේ සැකෙවින් දක්වා ඇත.

**වගු අංක 5.1.5 2017.12.31 දිනට අයවැය ප්‍රතිපාදනය**

| අයවැය ශීර්ෂය | දිස්ත්‍රික්කය | සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2017.12.31 ට වියදම | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 117-02-05-01-2104-11 | කොළඹ දිස්ත්‍රික්කය | 598.03 | 434.26 | 73 |
| 117-02-05-02-2104-11 | ගම්පහ දිස්ත්‍රික්කය | 446.12 | 321.43 | 72 |
| 117-02-05-03-2104-11 | කළුතර දිස්ත්‍රික්කය | 317.52 | 234.49 | 74 |
| 117-02-05-04-2104-11 | නුවර දිස්ත්‍රික්කය | 356.37 | 356.37 | 100 |
| 117-02-05-05-2104-11 | මාතලේ දිස්ත්‍රික්කය | 92.79 | 46.44 | 50 |
| 117-02-05-06-2104-11 | නුවර-එළිය දිස්ත්‍රික්කය | 85.54 | 33.32 | 39 |
| 117-02-05-07-2104-11 | මාතර දිස්ත්‍රික්කය | 296.40 | 241.63 | 82 |
| 117-02-05-08-2104-11 | ගාල්ල දිස්ත්‍රික්කය | 160.38 | 128.28 | 80 |
| 117-02-05-09-2104-11 | හම්බන්තොට දිස්ත්‍රික්කය | 277.52 | 277.52 | 100 |
| 117-02-05-10-2104-11 | යාපනය දිස්ත්‍රික්කය | 188.70 | 188.70 | 100 |
| 117-02-05-11-2104-11 | කිලිනොච්චි දිස්ත්‍රික්ක | 136.21 | 136.21 | 100 |

| අයවැය ශේෂය | දිස්ත්‍රික්කය | සංශෝධිත අයවැය ප්‍රතිපාදනය (රු.මි) | 2017.12.31 ට වියදම | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 117-02-05-12-2104-11 | මන්නාරම දිස්ත්‍රික්කය | 150.00 | 121.52 | 81 |
| 117-02-05-13-2104-11 | වව්නියා දිස්ත්‍රික්කය | 276.49 | 276.49 | 100 |
| 117-02-05-14-2104-11 | මුලතිව් දිස්ත්‍රික්කය | 252.25 | 252.25 | 100 |
| 117-02-05-15-2104-11 | මඩකලපුව දිස්ත්‍රික්කය | 93.60 | 93.60 | 100 |
| 117-02-05-16-2104-11 | අම්පාර දිස්ත්‍රික්කය | 164.42 | 164.42 | 100 |
| 117-02-05-17-2104-11 | ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | 109.28 | 109.28 | 100 |
| 117-02-05-18-2104-12 | කුරුණෑගල දිස්ත්‍රික්කය | 369.01 | 369.01 | 100 |
| 117-02-05-19-2104-13 | පුත්තලම දිස්ත්‍රික්කය | 296.00 | 238.78 | 81 |
| 117-02-05-20-2104-14 | අනුරාධපුර දිස්ත්‍රික්කය | 387.10 | 387.10 | 100 |
| 117-02-05-21-2104-15 | පොලොන්නරුව දිස්ත්‍රික්කය | 279.19 | 279.19 | 100 |
| 117-02-05-22-2104-16 | බදුල්ල දිස්ත්‍රික්කය | 180.83 | 180.83 | 100 |
| 117-02-05-23-2104-17 | මොණරාගල දිස්ත්‍රික්කය | 84.03 | 50.84 | 61 |
| 117-02-05-24-2104-18 | කෑගල්ල දිස්ත්‍රික්කය | 175.00 | 135.51 | 77 |
| 117-02-05-25-2104-19 | රත්නපුර දිස්ත්‍රික්කය | 150.00 | 139.39 | 93 |
| 117-02-05-26-2104-20 | බදු | 714.57 | 714.57 | 100 |
| 117-02-05-29-2104-21 | ජාතික ඉතිරිකිරීම් බැංකු ආධාර ව්‍යාපෘති | 4100.00 | 3300.0 | 80 |
| **එකතුව** | | **10,737.40** | **9,211.50** | **70** |

ඉහත වගුවෙහි දැක්වෙන පරිදි 2017 වර්ෂය තුළදී දිස්ත්‍රික්ක 25 අතුරින් 100%ක් වූ මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇති අතර අවම මූල්‍ය ප්‍රගතිය වාර්තා කොට ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙනි. 2017 සහ 2018 වර්ෂයන්හිද උක්ත වැඩසටහන සඳහා පළාත් මට්ටමින් වාර්තා වූ මූල්‍ය ප්‍රගතිය වගු අංක 5.1.6 පරිදි දැක්විය හැකිය.

**වගු අංක 5.1.6 2017 හා 2018 වර්ෂයන්හි පළාත් වශයෙන් මූල්‍ය ප්‍රගතිය**

| පළාත | 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| බස්නාහිර | 73% | 34% |
| මධ්‍යම | 82% | 46% |
| දකුණ | 88% | 61% |
| උතුරු පළාත | 97% | 72% |
| නැගෙනහිර | 100% | 95% |
| වයඹ | 91% | 92% |
| උතුරු මැද | 100% | 71% |
| ඌව | 87% | 77% |
| සබරගමුව | 85% | 100% |

වාර්ෂික ප්‍රමුඛ ඉල්ලීම් අනුව අයවැය ප්‍රතිපාදන ලබාදෙන බැවින් පළාත් අතර සමස්ත අගයන් සන්සන්දනය කිරීමට නොහැකි නමුත් ලබාගත් මූල්‍ය ප්‍රගතීන් ඉහත පරිදි දැක්විය හැකිය.

2017 වර්ෂයේදී පළාත් 02 ක් පමණක් ( නැගෙනහිර සහ උතුරු මැද) 100% මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර 2018 වර්ෂයේදී සබරගමුව පළාතෙහි පමණක් 100% ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත. 2017 වර්ෂයට වඩා 2018 වර්ෂයේදී උතුරු මැද පළාතෙහි හැර අනෙකුත් සියළුම පළාත්වල අවම මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත. 2017 හා 2018 යන වර්ෂයන් දෙක තුලම අවම මූල්‍ය ප්‍රගතියක් වාර්තා කොට ඇත්තේ බස්නාහිර පළාතෙනි. ඒ අනුව 2017 හා 2018 වර්ෂයන් සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සියළු දිස්ත්‍රික්කයන්හි මූල්‍ය ප්‍රගතිය මධ්‍යස්ථ අගයක් ලබා ගෙන ඇති බව නිගමනය කළ හැකිය.

## 6.0 පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම

රටේ මාර්ග ජාලයේ වැදගත් අංගයක් ලෙස සහ මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා මාර්ග සංවර්ධනයට සමගාමීව වාර්ෂිකව පාලම් 100 – 150 ක ප්‍රමාණයක් නැවත ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සිදුකළ යුතුව ඇත. (පවතින පාරු පාලම් හා පටු මෙන්ම දුබල පාලම් වෙනුවට ස්ථිර පාලම් සකස් කිරීම සිදු කළයුතුව ඇත.) තව ද පවතින මාර්ග තදබදය අවම කිරීම, ගමනාගමනයේ දී සිදුවන ප්‍රමාදය අඩු කිරීම, මාර්ග අනතුරු අවම කිරීම, වාහන නඩත්තු පිරිවැය අවම කිරීම සහ ආරක්ෂිත සහ කාර්යක්ෂම ප්‍රවාහන ජාලයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රධාන මංසන්ධිවල ගුවන් පාලම් ඉදිකිරීම ද කළ යුතු ව ඇත.මේ යටතේ මහාමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2018 වසරේදී ද පහසු ,ඉක්මන් හා ආරක්ෂාකාරි ගමනාගමන අවශ්‍යතා හඳුනාගනිමින් නව පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම , කුඩා හා දුර්වල පාලම් ප්‍රතිසංස්කරණය කිරිම හා වැඩිදියුණු කිරීම සහ නැවත ඉදිකිරිම මෙන්ම නව පාලම් ඉදිකිරීම යන කාර්යයන් ව්‍යාපෘති රාශියක් හරහා සිදුකරමින් පවතී.

ජාතික මහමාර්ග ජාලය තුළ පාලම් 4662 පමණ ප්‍රමාණයක් පවතින අතර එම පාලම් ඒවායේ දිග ප්‍රමාණ අනුව පහත පරිදි වර්ගීකරණය කර දැක්විය හැකිය.




**6.0 - ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි පාලම් පිළිබඳ සාරාංශ ගත තොරතුරු**

ජාතික මහාමාර්ග ජාලයේ ඉදිකරන ලද පාලම් අතරින් ඉහළම ප්‍රතිශතයකට අයත් ප්‍රමාණය පාලම් දිග මීටර 10ට අඩු වර්ගීකරණ කාණ්ඩය යටතට ගැනෙන අතර අවම ප්‍රමාණය මීටර 30ත් මීටර 50ත් අතර කාණ්ඩයට සහ මීටර 10ත් 30ත් අතර කාණ්ඩයට අයත් වේ. තව ද උක්ත වර්ගීකරණය යටතට ගැනෙන පාලම් සියල්ල ජාතික මහාමාර්ග ජාලය තුළ ස්ථාන ගත ව ඇති පාලම් වන බැවින් අධිවේගී මාර්ගයන්හි පිහිටි පාලම් මේ යටතට ඇතුළත් නොවේ.

## 6.1 ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත්/ අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය

මෙම වැඩ සටහන යටතේ 2017 වසර තුළ පාලම් 86 සවිබල ගැන්වීම් කටයුතු සිදු කරනු ලැබූ අතර 2018 දී එසේ සවිබල ගැන්වීම් කටයුතු සිදු කරනු ලැබූ පාලම් ගණන 53කි. මෙම 53 අතරින් පාලම් 10 ක ප්‍රතිසංස්කරණ කටයුතු 2018 දී නිම කරන ලදී. 2017 වර්ෂයේදී පාලම් 37ක සවිබල ගැන්වීම් කටයුතු නිම කරන ලද අතර පාලම් 13ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයේ ද තවත් පාලම් 47ක සවිබල ගැන්වීම් කටයුතු ප්‍රසම්පාදන අදියරේ ද පැවතුණි. 2018 වර්ෂයේ දී පාලම් ව්‍යාපෘති 12ක සවිබල ගැන්වීම් කටයුතු ආරම්භ කරන ලද අතර එම සියල්ලම වසර අවසානය වන විට ද ප්‍රසම්පාදන අදියරෙහි පැවතුණි. සමස්ත පාලම් ප්‍රමාණය වන පාලම් 53න් 31ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවතුණි.

**වගු අංක 6.1.1 2018 වර්ෂය තුළ ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති සඳහා භෞතික ප්‍රගතිය**

| පළාත | නිම කරන ලද ප්‍රමාණය | ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රමාණය | ප්‍රසම්පාදන අදියරෙහි පවත්න ප්‍රමාණය | එකතුව |
|---|---|---|---|---|
| බස්නාහිර | 02 | 04 | 04 | 10 |
| මධ්‍යම | - | 08 | 05 | 13 |
| දකුණ | 01 | 01 | - | 02 |
| උතුර | - | - | - | - |
| නැගෙනහිර | - | - | 01 | 01 |
| නැගෙනහිර(අක්කරෙපත්තුව) | - | 1 | - | 01 |
| වයඹ | 03 | 04 | - | 07 |
| උතුරු මැද | 01 | 06 | 02 | 09 |
| ඌව | 01 | 01 | - | 02 |
| සබරගමුව | 02 | 06 | - | 08 |
| ***එකතුව*** | **10** | **31** | **12** | **53** |

මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය 82%ක් වූ අතර 2018 දී එම අගය 61% දක්වා අඩු වී ඇත. මේ අනුව 2018 වසර සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරකමෙහි දක්වන ලද මූල්‍ය ඉලක්ක 2017 වසර සමඟ සැසඳූ කල කුඩා ප්‍රමාණයක අඩු වීමක් වාර්තා විය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය 2018 (රු.මි.) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-08** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 350.0 | 400.0 | 243.68 |
| | **එකතුව** | **350.0** | **400.0** | **243.68** |

## 6.2 පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම

මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශයේ ප්‍රධාන වගකීම් වනුයේ ග්‍රාමීය ප්‍රදේශයන්හි අඩු පිරිවැය පාලම් ඉදිකිරීම සහ ගංවතුර අලාභ හානි වැනි හදිසි තත්ත්ව යටතේ තාවකාලික පාලම් ඉක්මනින් ඉදිකිරීම ආදිය වේ. මේ යටතේ ග්‍රාමීය ප්‍රදේශයන්හි ඉදිකරනු ලබන පාලම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඉවත් කරන ලද පැරණි යකඩ පාලම් කොටස් යොදා ගනු ලැබේ.

2017 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ පාලම් 76ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට සැලසුම් කළ ද ප්‍රතිපාදන ඌනතා නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධන වීම හේතුවෙන් උක්ත අගය උච්චාවචනයට ලක්විය. 2017 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් වන විට මෙවැනි පාලම් 12 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර පාලම් 35 ක ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. මීට අමතර ව 2017 වර්ෂයේදී පාලම් 8ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලැබූ අතර ඉන් 03ක කටයුතු මෙම වසර තුළ දීම නිම කිරීමට හැකිවී ඇත. 2018 වර්ෂය තුළ දී පාලම් 14ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කරන ලද අතර 07ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. මීට අමතරව පාලම් 21ක ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයෙහි පවතින අතර ඉන් 6ක ප්‍රතිසංස්කරණ කටයුතු වර්ෂය තුළදී නිම කිරීමට නියමිත වුවද එම කටයුතු සැලසුම් කළ ආකාරයෙන් සිදු කිරීමට නොහැකි ව ඇත. උක්ත කටයුතුවලට අමතර ව හදිසි අලුත්වැඩියා කිරීම් කටයුතු සහ පාලම් කොටස් ප්‍රවාහනය සඳහා තාවකාලිකව ඉදි කරන ලද යකඩ පාලම් දියත් කිරීම සහ ප්‍රතිදියත් කිරීම් කටයුතු 100% භෞතික ප්‍රගතියක් සහිත ව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක විය.

මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු **ඇමුණුම 13** හි සඳහන්ව ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදානය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-14** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 300.0 | 343.0 | 221.2 |
| | **එකතුව** | **300.0** | **343.0** | **221.2** |

2018 වර්ෂය තුල මෙම ව්‍යාපෘතිය 65% ක මූල්‍ය ප්‍රගතියක් ලබා කරගෙන ඇති අතර 2017 වර්ෂයේදී එය 52% දක්වා අඩු වී ඇත. මේ අනුව 2018 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම සිව්වන කාර්තුව අවසානයේදී අපේක්ෂිත මට්ටමට පැමිණ තිබිණි.

## 6.3 ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II

මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය යුරෝ මිලියන 45 ක් වන අතර මේ සඳහා බ්‍රිතාන්‍ය HSBC බැංකුව විසින් අරමුදල් සපයන ලදී. මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාලය 2013-2017 දක්වා වේ.මෙම ව්‍යාපෘතිය යටතේ පාලම් 80 ක් ඉදිකිරීම බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. 2017 වර්ෂයේදී පාලම් 10ක ඉදිකිරීම් කටයුතු නිම වූ අතර තවත් පාලම් 16ක ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

මෙම ව්‍යාපෘතිය සඳහා තොරා ගනු ලැබූ පාලම් අතරින් කිහිපයක් ලැයිස්තු ගත අනිකුත් පාලම් 66ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තාවකාලිකව යොදා ගනු ලැබූ අතර ඉදිකිරීම් අවසානයේ එම තාවකාලිකව යොදා ගත් පාලම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදෙනු ලැබිණි. උක්ත පාලම් අතරින් පාලම් 65ක ඉදිකිරීම් කටයුතු මේ වන විට නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේදී වාර්තා වූ සමස්ත භෞතික ප්‍රගතිය 97% ක වූ අතර වර්ෂය තුළ ප්‍රගතිය 5%ක් ලෙස දැකිවිය හැකිය.

2018 වර්ෂයේදී පාලම් 11ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කරන ලද අතර තවත් පාලම් 06ක ප්‍රතිසංස්කරණ කටයුතු මේ වසරේ දි ඇරඹි අතර වසර අවසන් වන විටද එම ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක තත්ත්වයෙහි පැවතිණි. මේ වන විට පාලම් 76ක ප්‍රතිසංස්කරණ කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් නිම කරන ලද අතර උක්ත ව්‍යාපෘතිය 2018 වර්ෂය අවසානයේදී 99% ක භෞතික ප්‍රගතියක් අත් කර ගැනීමට සමත් ව ඇත.මේවන විට අවසන් කොට ඇති පාලම් පිළිබඳ විස්තර ඇමුණුම 14 යටතේ දැක්වේ. 2018වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය මගින් අත් කර ගත් මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු. මි.) |
|---|---|---|---|---|
| **117-02-06-16** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 125.0 | 346.0 | 346.0 |
| | **එකතුව** | **125.0** | **346.0** | **346.0** |

2017 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියෙහි වාර්තා ගත මූල්‍ය ප්‍රගතිය 96% ක් වූ අතර 2018සඳහා උක්ත අගය 100% ලෙස වාර්තා විය. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කරගැනීම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදුව ඇති ලෙස දැක්විය හැකිය.



මාර්ගයේ කැළණි ගඟ හරහා ඉදි කරන ලද පාලම



සල් ගස් හන්දිය ගං ඉවුරු මාර්ගය සමඟ සම්බන්ධිතව ගල් ඔය හරහා ඉදි කරන ලද පාලම

## 6.4 ජාතික මහාමාර්ගයන්හි පිහිටි පාලම් 25 ක් නැවත ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ "ඒ" හා "බී"ශ්‍රේණිවලට අයත් ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ඉදිකරනු ලැබේ.අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල විසින් සපයන අතර කුවේට් ඩිනාර් මිලියන 10 ක (රු.මි.4,460) මූල්‍යාධාර යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. පැකේජ 3ක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පැකේජ I යටතේ , පාලම් 08 ක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කොට ඇත. කොන්ත්‍රාත් පැකේජ I සඳහා ඉදිකිරීම් කටයුතු 2015දී ආරම්භ වූ අතර එම කටයුතු 2019 දී නිම කිරීමට නියමිතය.

2015 වර්ෂයේදී මූලික සැලසුම් වැඩ පමණක් ක්‍රියාත්මක විය. 2017 වර්ෂයේ දී ද 2016 වර්ෂයේ මෙන් ඉදිකිරීම් කටයුතු සිදු විය. 2016 වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය 28% ක් වූ අතර 2017 වසර තුළ එම අගය 12% ක් විය. මේ අනුව 2017 වසර අවසානයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා වාර්තා වූ සමස්ත භෞතික ප්‍රගතිය 40% ක් ලෙස දැක්විය හැකිය. 2018 වසර අවසන් වන විට මෙම ව්‍යාපෘතිය මඟින් අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය 67% ලෙස වාර්තා විය. මේ අනුව උක්ත ව්‍යාපෘතිය 2018 වසර තුළ දී 27%ක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට සමත් ව ඇත.

කොන්ත්‍රාත් පැකේජ 1 යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන පාලම් සඳහා 2018 වසර අවසාන වන විට වාර්තා වූ භෞතික ප්‍රගතිය පහත පරිදි දැකිවිය හැකිය.

**වගු අංක 6.4.1 කොන්ත්‍රාත් පැකේජ 1 යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට තොරාගනු ලැබූ පාලම්වල භෞතික ප්‍රගතිය**

| අයිතම අංක | පාලමේ නම සහ අංකය | දිග ප්‍රමාණය(මීටර්) | 2016.12.31 සඳහා සමස්ත භෞතික ප්‍රගතිය (%) | 2017.12.31 සඳහා සමස්ත භෞතික ප්‍රගතිය (%) | 2018.12.31 සඳහා සමස්ත භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| **1** | පාලම්අංක.1/1 කඩුවෙල - බියගම මාර්ගය (ඒබී 004) **(බී1)** | 92.76 | 31% | 40% | 75% |
| **2** | පාලම්අංක: 14/3 ගලගෙදර - හොරණ මාර්ගය (බී123) **(බී 2)** | 11.5 | 29% | 40% | 56% |
| **3** | පාලම්අංක 014/8 ගලගෙදර - හොරණ මාර්ගය (බී123) **(බී3)** | 11.5 | 34% | 51% | 95% |
| **4** | පාලම්අංක. 11/4 කෑගල්ල -බුලත්කොහුපිටිය මාර්ගය (ඒඒ021) (බී4) | 31.6 | 12% | 27% | 63% |
| **5** | පාලම්අංක 32/1 වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගය (බී445) **(බී5)** | 19.3 | 26% | 45% | 60% |
| **6** | පාලම්අංක.2/2 තංගල්ල - වීරකැටිය මාර්ගය (බී410) **(බී 6)** | 6.92 | 0% නිර්මාණ විචලනය විම හේතුවෙනි.) | 63% | 99% |
| **7** | පාලම්අංක. 2/3 තංගල්ල - වීරකැටිය මාර්ගය (බී 410) **(බී 7)** | 13.9 | | 4% | 46% |
| **8** | පාලම්අංක 10/2 අම්පිලන්තුරායි - වේරමුනායි මාර්ගය (බී 018) **(බී 8)** | 50.4 | 35% | 41% | 46% |

කොන්ත්‍රාත් පැකේජ II හා IIIයටතේ පිළිවෙලින් පාලම් 17 ක් ඉදිකිරීමට නියමිතය. කොන්ත්‍රාත් පැකේජ II හි උපදේශන සේවා සඳහා ප්‍රසම්පාදන ලියවිලි සැකසීම නිම ව ඇති අතර ප්‍රසම්පාදන කටයුතු සඳහා ටෙන්ඩර බෙදා දීමේ කටයුතු 2017 දෙසැම්බර 22 දී ආරම්භ විය. 2018 සැප්තැම්බර් මාසය වන විට උක්ත

පැකේජයෙහි උපදේශන කටයුතු සඳහා වන කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති අතර පැකේජ III හි සැලසුම් නිර්මාණ කටයුතු හා ප්‍රසම්පාදන වැඩකටයුතු 2018 වර්ෂය අවසාන වන විට ද සිදු කරමින් පැවතිණි.

**වගු අංක 6.4.2 2017වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සංශෝධිත සමස්ත ප්‍රගතිය හා 2018වර්ෂයේ ළඟාකරගත් ප්‍රගතිය**

| | භෞතික ඉලක්ක % | | | | භෞතික ප්‍රගතිය% | | | | ඉලක්ක සපුරා ගැනීම (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2018 | Q1 | Q2 | Q3 | Q4 | Q1 | Q2 | Q3 | Q4 | සමස්ත අගය |
| | 40 | 18 | - | - | 7 | 10 | 7 | 3 | 47 |
| 2017 | Q1 | Q2 | Q3 | Q4 | Q1 | Q2 | Q3 | Q4 | සමස්ත අගය |
| | 23 | 17 | 18 | 8 | 5 | 5 | 2 | 0.1 | 18 |

මෙම ව්‍යාපෘතිය යටතේ පැකේජ II හා II යටතේ ප්‍රතිසංස්කරණය සඳහා තෝරා ගත් පාලම් ලැයිස්තුව **ඇමුණුම 15** යටතේ දැක්වේ.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-17** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම | 25.0 | 25.0 | 13.38 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 550.0 | 320.0 | 265.83 |
| | **එකතුව** | **575.0** | **345.0** | **279.21** |

2018 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතියෙහි මූල්‍ය ප්‍රගතිය 81% වූ අතර 2017 දී එම අගය 89% ලෙස වාර්තා විය.

## 6.5 පාලම් 46 ක් නැවත ඉදිකිරීම

පාලම් 46 ක් නැවත ඉදිකිරීම සඳහා ප්‍රංශ රජය විසින් යුරෝ මිලියන 22.05 ක ණය මුදලක් ඉතා පැරණි හා පටු පාලම් 45 ක් නැවත ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය වෙත ලබාදී ඇත. 2013 මැයි මාසයේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර පාලම් 50 ක නැවත ඉදිකිරීම් කටයුතු මෙමඟින් සිදු කෙරේ. 2016 වර්ෂය අවසාන වන විට ඒ අතරින් පාලම් 44 ක කටයුතු අවසන් කොට ඇති අතර තොරා ගනු ලැබූ අනික් පාලම් 06 හි ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේදී ඉතා සාර්ථක ලෙස නිමාවට පත් විය. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා 100% ක භෞතික ප්‍රගතියක් 2017 අවසාන වන විට වාර්තා ව ඇත.

2018 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කෙරුණු සමස්ත අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය ම භාවිතයට ගැනීමට හැකි වූ අතර අත් කර ගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය 100% විය. නමුත් 2017 වසර අවසාන දී 97%ක මූල්‍ය ප්‍රගතියක් පමණක් උක්ත ඉදිකිරීම් කටයුතු සඳහා වාර්තා විය. මේ අනුව මූල්‍ය ප්රගතියෙහි 3% කින් වර්ධනය වූ අතර සමස්ත මූල්‍ය කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතිනි.

තව ද 2018 වර්ෂය සඳහා වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය පූර්ව වර්ෂයන්හී දී ප්‍රතිපාදන හිඟ වීම නිසා පූර්ණය කිරීමට නොහැකිව ශේෂ වූ බිල්පත් පියවීමට ද යෙද වීමට සිදු වීම නිසා වරින් වර ඉහළ නැංවීමට සිදු විය. උක්ත ව්‍යාපෘතියෙහි ඉදි කිරීම් කටයුතු සියල්ල 2017 වර්ෂයේදී නිම කිරීම හේතුවෙන් 2018 සඳහා පිළියෙළ කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි හෝ සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි හෝ භෞතික ඉලක්ක ඇතුළත් කර නොමැත.තව ද මෙම ව්‍යාපෘතිය 2017 වසර සඳහා සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුගත ව භෞතික ඉලක්ක සපුරා ගැනීම 100%ක් ලෙස දැක්විය හැකිය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-18** | 2105 ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම | 3.0 | 12.0 | 11.7 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 15.0 | 107.0 | 107.0 |
| | එකතුව | **18.0** | **119.0** | **118.5** |



**බඩල්කුඹුර - බුත්තල - සෙල්ලකතරගම මාර්ගයේ ඉදි කරන ලද නො. 8/2 පාලම**



**පේරාදෙණිය බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ ඉදි කරන ලද නො.194/1 පාලම**

## 6.6 ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ වැඩ විෂය පථය වනුයේ ඉහළ ප්‍රමුඛතාවක් ඇති ජාතික මාර්ගයන්හි පාලම් ඉදිකිරීම සහ පවතින පාලම් වෙනුවට නව පාලම් ඉදිකිරීම වැනි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමයි. උක්ත වැඩිදියුණු කරනු ලබන පාලම් ඒ සහ බී වර්ගයනට අයත් මාර්ගයන්හි පිහිටන පාලම් වන බැවින් මෙම ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ගමනාගමනය සඳහා ගත වන කාලය අවම වීම, වාහන නඩත්තු කිරීම සඳහා දැරීමට සිදු වන පිරිවැය අවම වීම මෙන් ම රථවාහන සඳහා වන මධ්‍යස්ත වේගය වැඩිවීම හේතුවෙන් සමස්ත දිවයිනටම ප්‍රතිලාභ අත් වනු ඇත.

ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සපයනුයේ ජපාන අන්තර්ජාතික සහයෝගිතා ආයතනය මඟින් වන අතර ඇස්තමේන්තුගත සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය ජපාන යෙන් මිලියන 12,381 කි. මේ සඳහා පාලම් 37 ක් මූලිකව තෝරා ගෙන ඇති අතර ඉදිකිරීම් කටයුතු 2015 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලදී. ඒ අතරින් දකුණු පළාතට අයත් පාලම් 10 ක් කොන්ත්‍රාත් පැකේජ I යටතේ ඉදිකරනු ලැබේ. 2017 අවසානයේදී කොන්ත්‍රාත් පැකේජ 1 සඳහා වාර්තා වූ භෞතික ප්‍රගතිය 97% වූ අතර 2016 දී එම අගය 73% ලෙස වාර්තා විය.

මේ අනුව පැකේජය මගින් 2017 වසර තුළදී 25%ක භෞතික ප්‍රගතියක් පෙන් වූ අතර වාර්තා ගත කාර්ය සාධනය 100% ලෙස දැක්විය හැකිය. ( වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක සපුරා ගැනීම 100% විය.) උක්ත සඳහන් පාලම් 10න් පොල්වත්ත සහ කොලේදණ්ඩ යන පාලම් 2හි ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂයේදී නිම වූ අතර තවත් පාලම් 7ක ඉදිකිරීම් කටයුතු 2017 දී නිමාවට පත්විය. 2018 දී කොන්ත්‍රාත් පැකේජ 01ක යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ පාලම් සියල්ලෙහි ඉදි කිරීම් කටයුතු නිමාවට පත් වූ අතර 100%ක භෞතික ප්‍රගතියක් වාර්තා කිරීමට සමත්විය.

කොන්ත්‍රාත් පැකේජ 2 යටතේ උතුරු පළාත තුළ පිහිටා ඇති පාලම් 08ක් ඉදිකිරීම් කටයුතු සඳහා තොරාගෙන ඇති අතර මෙහි ඉදිකිරීම් කටයුතු 2016 දී ආරම්භ විය. උක්ත පැකේජය මගින් 2017 වර්ෂයේදී අත් කර ගත් භෞතික ප්‍රගතිය 43% වූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහිලා ඉලක්ක සපුරා ගැනීම 70% ලෙස වාර්තා විය. 2018 වසර ඔක්තෝම්බර් මාසය වන විට උක්ත පැකේජය මගින් 100%ක භෞතික ප්‍රගතියක් පෙන් වූ අතර පාලම් සියල්ලෙහිම ඉදි කිරීම් කටයුතු ඉලක්ක කර ගත් පරිදි නිම කිරීමට හැකි විය. 2018 වර්ෂය තුළ දී 57% ක භෞතික ප්‍රගතියක් ළඟා කර ගැනීමට මෙම පැකේජයට හැකි වූ අතර සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳු විට 100% භෞතික ඉලක්ක සපුරා ගැනීමක් වාර්තා කර ගැනීමට සමත් විය. කොන්ත්‍රාත් පැකේජ 1 හා II යටතේ තෝරා ගත් පාලම් පිළිබඳ තොරතුරු **ඇමුණුම 16** යටතේ දැක්වේග

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-19** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 100.0 | 100.0 | 76.35 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 1,600.0 | 2,147.0 | 2,135.88 |
| | **එකතුව** | **1,700.0** | **2,247.0** | **2,212.23** |

මෙම ව්‍යාපෘතිය 2017 දී ද 96% ක මූල්‍ය ප්‍රගතියක් ළගා කර ගෙන ඇති අතර 2018 දී එම අගය 98% ලෙස වර්ධනය කර ගැනීමට සමත් ව ඇත. 2018 වර්ෂයේ දී මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම 100% ඉක්ම වූ අතර මේ අනුව මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම ආසන්න වර්ෂයන් දෙකෙහිදීම එක ම ආකාරයකින් සිදු ව ඇත.



**බී 403 මාර්ගයේ ඉදි කරන ලද නො. 21/1 අංක දරණ පාලම**



**ඒ 032 මාර්ගයේ ඉදි කරන ලද නො. 39/2 අංක දරණ පාලම**

## 6.7 දෙවන නව කැළණි පාලම ඉදිකිරිම

මෙම ව්‍යාපෘතිය සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය විසින් ජපන් යෙන් මිලියන 35,020 ක ණය අරමුදල් සපයනු ලැබේ.මෙම ව්‍යාපෘතියේ මුලික ඉදිකිරීම් කටයුතු 2014 ජනවාරි මාසයේදි ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් වන විට නිම කිරීමට අපේක්ෂිතය. උක්ත ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ පවතින කැළණි පාලම තුල නිර්මාණය වන මාර්ග තදබදය විසිරුවා හරිමින් සහ අවම කරමින්, ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා කොළඹ - කටුනායක මාර්ගය, බේස්ලයින් මාර්ගය හා වරාය පිවිසුම් මාර්ග හරහා කොළඹ නගරයට සම්බන්ධ වීමට හැකි ප්‍රවාහන මාර්ග ජාලයක් ඇති කිරීමයි.

කොළඹ- කටුනායක අධිවේගී මාර්ගය මහජනයා සඳහා විවෘත කිරීමත් සමග කොළඹ නගරයට ළඟාවන වාහන ප්‍රමාණය සැලකිය යුතු මට්ටමේ ඉහළ යාමක් දක්නට ලැබුණි.මේ නිසා උක්ත ඉල්ලුමට මුහුණදීම

සඳහා නව කැළණි පාලම මංතීරු 6 කින්, අන්තර්හුවමාරු මධ්‍යස්ථාන හා වරාය ප්‍රවේශ මාර්ගයට සම්බන්ධ වන ලෙස උස්කොට තනන ලද මාර්ගයකින් සමන්විත ව ඉදිකිරීමට නියමිතය.

මෙම පාලම ඉදිකිරීමට යෝජිත භූමිය අසල පිහිටි ශ්‍රී ලංකා ප්‍රතීතන බලශක්ති අධිකාරියේ නව ගොඩනැගිල්ලෙහි නැවත ඉදිකිරීම් හා ප්‍රතිස්ථාපන කටයුතු මේ වන විට ඔරුගොඩවත්ත ප්‍රදේශයේ සිදු කරමින් පවතින අතර අත්කර ගෙන ඇති භෞතික ප්‍රගතිය 30%කි. එමෙන්ම මෙම කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉලක්ක සපුරා ගැනීම 70%ක් ලෙස ද දැක්විය හැකිය. තවද මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතන ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම හා ප්‍රතිස්ථානගත කටයුතු 2017 සැප්තැම්බර් වන විට නිම වූ අතර එය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වෙත බාර දී ඇත.

සිවිල් වැඩ සඳහා වූ උපදේශන කොන්ත්‍රාත් කටයුතු ඔරියන්ටල් උපදේශන සමාගම සහ බටහිර අන්තර්ජාතික සමාගම වෙත ප්‍රධානය කර ඇති අතර නිර්මාණ කටයුතු, ටෙන්ඩර සහායක කටයුතු සහ ඉදිකිරීම් සඳහා අධීක්ෂණ කටයුතු සඳහා 2015 සිය 2019 දෙසැම්බර් දක්වා වූ කාල සීමාව වෙන් කර ඇත. ඉන් නිර්මාණ කටයුතු සහ ටෙන්ඩර සහායක කටයුතු මේ න විට ද නිම වී ඇති අතර සිවිල් වැඩ සඳහා වන කොන්ත්‍රාත් පැකේජ 1 සහ 11 සඳහා පිළිවෙළින් දෙසැම්බර් සහ සැප්තැම්බර් යන මාසයන්හි කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් නිවාස අහිමිවන ජනතාව සඳහා සාලමුල්ල ලක්සඳ සෙවණ නිවාස සංකීර්ණය ඉදිකෙරුණු අතර මූලික ප්‍රතිස්ථාපන කටයුතු 2017 අප්‍රේල් මස දී නිමාවට පත් විය. මෙම ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු මේ වන විට නිම කර ඇති අතර අංක 44 හි කටයුතු සිදු වෙමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය මගින් අත් කර ගනු ලැබූ සමස්ත භෞතික ප්‍රගතිය 2017 සඳහා 98% ක් වශයෙන් ද 2016 සඳහා 57% වශයෙන් ද දැකිවිය හැකිය. කොන්ත්‍රාත් පැකේජ 1 සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය 2017 දෙසැම්බර් මස සිදු වූ නිසා ඉලක්ක සපුරා ගැනීම ශූන්‍ය වූ අතර පැකේජ 11 සඳහා එය 15% විය. 2018 වසර අවසන් වන විට කොන්ත්‍රාත් පැකේජ 1 සඳහා සමස්ත භෞතික ප්‍රගතිය 10% ලෙස ද කොන්ත්‍රාත් පැකේජ 11 සඳහා භෞතික ප්‍රගතිය 31% ලෙස ද වාර්තා විය.




**6.7.1 ප්‍රස්ථාරය - සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳූ කල කොන්ත්‍රාත් පැකේජ 1 සහ කොන්ත්‍රාත් පැකේජ 11 සඳහා භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය**

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-21** | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 150.0 | 150.0 | 70.58 |
| | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 10,000.0 | 9,010.0 | 8454.81 |
| | **එකතුව** | **10,150.0** | **9,160.0** | **8525.39** |

2017 වර්ෂ අවසානයේදී මෙම ව්‍යාපෘතිය සඳහා 92% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇති අතර එය 2018 වර්ෂයේදී 93% කි. ඒ අනුව 2018 වර්ෂයේදී 2017 වර්ෂයට වඩා මුදල් උපයෝජනය කර ගැනීමට මෙම ව්‍යාපෘතියට හැකි ව ඇත.

## 6.8 පාලම් නඩත්තු ඒකක ක්‍රමවේදයක් (BMS) හා පාලම් තක්සේරු ඒකකයක් (BMA) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය

පැවති ක්‍රමවේදයේ පැවති දුර්වලතාවයන් හේතුවෙන් නව පාලම් නඩත්තු ඒකක ක්‍රමවේදයක් (BMS) හා පාලම් නඩත්තු කිරීමේ ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ජපාන රජය වෙත ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව ජපාන රජය විසින් ජපාන ජාත්‍යන්තර සහයෝගීතාවය මගින් ඒ සඳහා තාක්ෂණික සහාය ලබාදීමට එකඟතාවය පළ කරන ලදී. මෙය 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ව්‍යාපෘති කාලය වසර 03 කි. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ පාලම් වල ඉදිකිරීම් කළමණාකරණය වේ.

මෙම ඒකකය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.ෙ

| ක්‍රියාකාරකම | 2017.12.31 වන විට භෞතික ප්‍රගතිය | 2018.12.31 වන විට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| තෝරාගත් නියැදි පළාත් වල පාලම් අධීක්ෂණය කිරිම | 2017 දී නිම කොට ඇත | |
| අනිකුත් පළාත් වල පාලම් අධීක්ෂණය කිරිම | 50% ක් නිම කොට ඇත. | 100% නිම කොට ඇත. |
| පාලම් නඩත්තු සහ අධීක්ෂණය කිරීමේ පෙරහුරු අත්පොතක් පිළියෙල කිරිම | 2017 දී නිම කොට ඇත | |
| පාලම් පිළිබඳ තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ ක්‍රියාවලිය | ආසන්න වශයෙන් 60% නිම කොට ඇත | ආසන්න වශයෙන් 95% නිම කොට ඇත |

තෝරාගත් නියැදි පළාත් වල පාලම් අධීක්ෂණය කිරිමේ කටයුතු ජපාන ජාත්‍යන්තර සයෝගතා ආයතනය මගින් සිදු කරනු ලැබූ අතර අනිකුත් පළාත් වල පාලම් අධීක්ෂණය කිරිම් කටයුතු මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉංජිනේරුවරුන් යටතේ සිදු කෙරුණි. තෝරාගත් නියැදි පළාත් වල පාලම් අධීක්ෂණය කිරිමේ කටයුතු 2016 අවසන් වන විට 95% දක්වා නිම වී තිබූ අතර එම සමස්ත ක්‍රියාවලිය ම 2017 දී නිමාවට පත්විය. මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ඉංජිනේරුවරුන් යටතේ සිදු කෙරුණු පාලම් අධීක්ෂණය කිරිමේ කටයුතු 2018 දී නිමාවට පත්විය.

සකසමින් පවතින පාලම් පිළිබඳ තොරතුරු පද්ධතියට පාලම් 3000ක පමණ දත්ත ඇතුළත් කර ඇති අතර එය වාර්තාගත මුළු පාලම් ප්‍රමාණයෙන් 60% ක ප්‍රමාණයක් පමණක් විය. 2018 දී මෙම දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය 95% දක්වා නිම කිරීමට සමත් ව ඇත. පාලම් නඩත්තු සහ අධීක්ෂණය කිරීමේ පෙරහුරු අත්පොතක් පිළියෙල කිරිම 2017 දී නිම කරන ලද අතර 2016 දී ආකෘති පිළියෙළ කිරීම පමණක් සිදු කෙරිණි. මේ අනුව 2016 සහ 2017 වර්ෂ සඳහා වාර්තා ගත භෞතික ප්‍රගතීන් වූයේ පිළිවෙළින් 33% සහ 50% කි. 2017 වසර අවසානයේ වාර්තා වූ සමස්ත භෞතික ප්‍රගතිය 98% වූ අතර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය 2017 සහ 2018 වර්ෂ සඳහා පිළිවෙළින් 97% සහ 100% ලෙස දැක්විය හැකිය. මේ වන විට ජපාන අරමුදල් යටතේ සිදු කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කර ඇති අතර තවදුරටත් ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින් වාර්ෂික වැඩසටහනක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ පාලම් නිර්මාණ අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව උක්ත වැඩසටහන සඳහා 2018 වසර අවසානයේ අත් කර ගනු ලැබූ ප්‍රගතිය 100% ලෙස දැක්විය හැකිය.

මෙම වැඩසටහන යටතේ සිදු කරන ලද පලම් අධික්ෂණ කටයුතු පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.




**6.8.1 ප්‍රස්ථාරය - 2018 වර්ෂයේ දී සිදු කරනු ලැබූ පාලම් අධීක්ෂණ ක්‍රියාකාරකම්හි ඉලක්ක සපුරා ගැනීම් පිළිබඳ තොරතුරු**

2017හා 2018වර්ෂයන්හි සමස්ත මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 73% හා 82 % කි. මෙම ව්‍යාපෘතිය සඳහා ආරම්භයේදී වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදනය වසර අවසාන වන විට දෙගුණ කිරීමට සිදු වූ අතර පූර්ව වර්ෂයන්හි දී පූර්ණය කිරීමට නොහැකි වූ බිල්පත් ගෙවීම් කටයුතු සඳහා උක්ත ප්‍රතිපාදන වැය විය.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-18** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 8.0 | 15.0 | 12.27 |
| | **එකතුව** | **8.0** | **15.0** | **12.27** |

## 6.9 සාමාවච්චතිව්- මුනෙයිච්නෙයි මාර්ගයේ පයිප්ප පාලමක් ඉදිකිරීම (තට්ටුතුරෛයි පාලම)

මෙම පාලම සඳහා සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල විසින් අරමුදල් සපයනු ලැබූ අතර 2015 වර්ෂයේදී ආරම්භ කොට 2016 වර්ෂයේ ජූලි මාසය වන විට සියළු ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් නිම කොට ඇත.

2015 වර්ෂයේදී මෙහි ඉදිකිරීම් කටයුතු 47% ක සමස්ත භෞතික ප්‍රගතියක් අත්පත් කර ගත් අතර ඉතිරි 53% ක භෞතික ප්‍රගතිය 2016 වර්ෂයේ මුල් මාස හත ඇතුලත ලබා කර ගැනිමට මෙම ව්‍යාපෘතියට හැකියාව ලැබී ඇත.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මි) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-23** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 5.0 | 5.0 | 2.73 |
| | **එකතුව** | **5.0** | **5.0** | **2.73** |

2016 වර්ෂයේදී ඉහත ව්‍යාපෘතිය නිම කළ අතර, 2017 වසර සඳහා මෙන් ම 2018 වසර සඳහා ද බිල්පත් ගවීමේ කටයුතු සිදු කිරීමට නියමිතව පැවතුණි. 2017 වසර සඳහා උක්ත ව්‍යාපෘතිය මගින් අත්කර ගත් මූල්‍ය ප්‍රතිය 89% වූ අතර 2018 දී එම අගය 55% ක් ලෙස වාර්තා විය.



**තට්ටුතුරෛයි පාලම**

## 6.10 පැලියගොඩ- පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය සඳහා ඔස්ට්‍රියා ජාත්‍යන්තර රයිෆිෂන් බැංකුව මගින් යුරෝ මිලියන 8.7 ක ණය මුදලක් පැලියගොඩ- පුත්තලම මාර්ගයේ පැවති 38/3 දරණ පැරණි පටු පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීමට ලබා දී ඇත.මෙම පාලමේ දිග මීටර් 105 වන අතර පරාසයන් 03 ක් හා මංතීරු 4 ක් යටතේ ඉදිකිරීමට අපේක්ෂා කෙරේ. 2016 වර්ෂයේ ජූලි මාසයේ දී සිවිල් වැඩ ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතිය 2019 ජනවාරි 24 වැනි දින නිම කිරීමට අපේක්ෂා කරනු ලැබේ. තවද අවුරුද්දක ණය අනුමත කාලසීමාව 2019 වර්ෂයේ සිට 2020 දක්වා ලබාදීමට නියමිතය.

2017 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන විට සිවිල් වැඩ ප්‍රගතිය 65% ක් වූ මෙම ව්‍යාපෘතියෙහි 2017 වර්ෂය තුලදී පූර්ණ කරන ලද භෞතික වැඩ ප්‍රමාණය 23% ක් ලෙස වාර්තා විය. මේ අනුව 2017 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක පූර්ණය කිරීමේ කාර්යසාධනය 38%කි. 2018 දී සංශෝධිත භෞතික ඉලක්කය 35% වූ අතර ඉලක්ක සපුරා ගැනීම 100% ලෙස වාර්තා විය. මේ අනුව 2018 අවසානයේ දී අත් කර ගනු ලැබූ භෞතික ප්‍රගතිය 100% ලෙස සඳහන් කළ හැකිය.

උක්ත ව්‍යාපෘතිය සඳහා 2017 දී වාර්තා වූ මූල්‍ය කාර්යසාධනය 46% වූ අතර 2018 සඳහා වූ සංශෝධිත අයවැය යටතේ එහි ප්‍රගතිය 99% ලෙස දැකිවිණි.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-20** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 375.0 | 437.0 | 435.0 |
| | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 5.0 | 0.0 | 0.0 |
| | එකතුව | **380.0** | **437.0** | **435.0** |

## 6.11 රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල යන ප්‍රදේශවල ගුවන් පාලම් 03 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය

රාජගිරිය, පොල්ගහවෙල හා ගනේමුල්ල යන ප්‍රදේශවල පවතින අධික රථවාහන තදබදය හේතුවෙන් ගමන් කාලය හා වාහන මෙහෙයුම් පිරිවැය වැඩිවීම තුලින් ආර්ථිකයට සිදු වන අලාභය අවම කරලීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙහි සම්පූර්ණ ව්‍යාපෘති කාලය මාස 32 ක් (2016-2018) වන අතර ස්පාඤ්ඤ රජය විසින් අරමුදල් සපයන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ගුවන් පාලම පිළිබඳ විස්තර පහත දැක්වේ.

**වගු අංක 6.11.1 ඉදිකරනු ලබන ගුවන් පාලම් පිළිබඳ විස්තර**

| ගුවන් පාලම | යකඩ ව්‍යුවහයේ දිග (මී) | සම්පූර්ණ දුර(මී) | මංතීරු ගණන | ව්‍යාපෘති කාලය (මාස) |
|---|---|---|---|---|
| රාජගිරිය | 363 | 533.2 | 4 | 32 |
| පොල්ගහවෙල | 233 | 353.0 | 2 | 16 |
| ගනේමුල්ල | 204 | 275.3 | 2 | 14 |

**රාජගිරිය ගුවන් පාලම-**

රාජගිරිය ගුවන් පාලම රාජගිරිය මංසන්ධියේ ඉදිකරනු ලබන අතර. එමගින් කොල්ලුපිටිය- ශ්‍රී ජයවර්ධනපුර මාර්ගය (ඒ000) , වැලිකඩ - නාවල මාර්ගය(බී 470) බොරැල්ල- රාජගිරිය මාර්ගය (බී 062) යන මාර්ගයන්හි මාර්ග තදබදය අවම කිරීමෙහිලා මහත් පිටුවහලක් වනු ඇත.මෙම ගුවන් පාලම අදියර 2 ක් යටතේ, අදියර 1 - දකුණු ගුවන් පාලම හා අදියර 2- උතුරු ගුවන් පාලම ලෙස ඉදිකිරීම් සිදු කිරීමට නියමිතය. මෙම එක් එක් අදියර සඳහා ව්‍යාපෘති කාලය මාස 16 කි. තවද මෙම ගුවන් පාලම මංතීරු 4 කින් යුත් බහු ආරුක්කු පරාසයන් සහිත යකඩ හා කොන්ක්‍රීට් සංයුක්ත ගුවන් පාලමක් ලෙස ඉදිකිරීමට නියමිතය.

**පොල්ගහවෙල ගුවන් පාලම**

පොල්ගහවෙල ගුවන් පාලම පොල්ගහවෙල දුම්රිය ස්ථානය අසල මංතීරු 2 කින් යුතුව බහු පරාසයන් සහිත යකඩ පාලමක් ලෙස දිග මීටර් 353 කින් යුතුව ඉදිකිරීමට යෝජිතය.මේ මගින් පොල්ගහවෙල- කුරුණෑගල මාර්ගයේ (ඒ 19) මාර්ග තදබදය ඉවත් කරනු ඇත.මෙම ව්‍යාපෘතිවේ ව්‍යාපෘති කාලය මාස 16 කි.

**ගනේමුල්ල ගුවන් පාලම**

ගනේමුල්ල ගුවන් පාලම, ගනේමුල්ල දුම්රිය මාර්ගය අසල ඉදිකිරීමට යෝජිත අතර එය මංතීරු 2 කින් යුතුව බහු පරාසයන් සහිත යකඩ පාලමක් ලෙස මීටර් 275.32 ක දිගකින් යුතුව ඉදිකරනු ලැබේ. මෙම ගුවන් පාලම මගින් බියන්විල- ගනේමුල්ල මාර්ගය (බී 58) හා කිරිදිවිට- ගනේමුල්ල මාර්ගය (බී 226) යන මාර්ගයන්හි මාර්ග තදබදය අවම කරලීමට හේතු වනු ඇත.

2018 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට එක් එක් ගුවන් පාලම් ඉදි කිරීමේ කටයුතු සඳහා අත් කර ගනු ලැබූ භෞතික ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

**වගු අංක 6.11.2 – 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| ගුවන් පාලම | සමස්ත භෞතික ප්‍රගතිය (%) | | |
|---|---|---|---|
| | 31/12/2016 | 31/12/2017 | 31/12/2018 |
| **රාජගිරිය ගුවන් පාලම** | අදියර I – 62%<br>අදියර II- 24% | අදියර I – 97%<br>අදියර II- 94% | ඉදි කිරීම් නිම කර ඇත. |
| **පොල්ගහවෙල ගුවන් පාලම** | 78% | 99% | |
| **ගනේමුල්ල ගුවන් පාලම** | 75% | 100% | |

රාජගිරිය ගුවන් පාලම් ව්‍යාපෘතිය සඳහා 2016 දී වාර්තා වූ සමස්ත භෞතික ප්‍රගතිය 43% වූ අතර අදියර දෙක සඳහා භෞතික ප්‍රගතීන් පිළිවෙළින් 62% හා - 24% ලෙස දැක්විය හැකිය. 2017 වර්ෂයේදී සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ඉලක්ක පිළිවෙළින් අදියර 1 සඳහා 37% සහ අදියර 2 සඳහා 55% ලෙස සැලසුම් කළ ද ඉලක්ක සපුරා ගැනීම පිළිවෙලින් අදියර 1 හා 2 සඳහා 100% සහ 100% ඉක්මවා ඇත. අදියර 1 සඳහා වාර්තා වූ භෞතික ප්‍රගතිය 37% වූ අතර අදියර 2 සඳහා එම අගය 70% විය.

2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව පොල්ගහවෙල ගුවන් පාලමෙහි ඉදිකිරීම් සඳහා 2017 සඳහා භෞතික ඉලක්කය 28% වූ අතර ඉලක්ක සපුරා ගැනීම 20% විය. මේ අනුව භෞතික කාර්යසාධනය 71% කි. 2016 වර්ෂය නිම වන විට ව්‍යාපෘතිය මගින් අත්කරගත් භෞතික ප්‍රගතිය 78% වූ අතර 2017 අවසානයේදී වාර්තා වූ අගය 99%ක් වූ අතර ගුවන්පාලම ඉදිකිරීමේ කටයුතු මේ වන විට නිම වී ඇත.

2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ගනේමුල්ල ගුවන් පාලම ඉදි කිරීමේ ඉලක්කගත භෞතික ප්‍රගතිය 23% වූ අතර වසර තුළ දී ව්‍යාපෘතිය 25% ක භෞතික ප්‍රගතියක් ළඟා කර ගැනීමට සමත් වී ඇත. මේ අනුව භෞතික ඉලක්ක සපුරා ගැනීම 100% ඉක්මවා ඇති අතර මෙම ගුවන්පාලමෙහි ද ඉදිකිරීම් කටයුතු 2017 දී නිමාවට පත්විය.

2017 වර්ෂය අවසාන වන විට අත් කර ගත් භෞතික ප්රගතිය 99% වූ අතර ව්යාපෘතිය 32% ක සමස්ත භෞතික ප්රගතියක් 2016 දී අත් කරගෙන ඇත. මේ අනුව 2017 අවසන් වන විට ගුවන් පාලම් සියල්ල ඉදි කර අවසන් වූ අතර එම එක් එක් ගුවන් පාලම ජනතා අයිතියට පත් කරන ලදී. 2018 වර්ෂයේ දී ව්යාපෘති භූමි තුළ නිම කිරීම සඳහා ශේෂ ව පැවති අතිරේක කටයුතු සිදු කිරීමට නියමිතව පැවතුණි. ගුවන් පාලම් 03හි ම ඉදි කිරීම් කටයුතු 2017 දී නිම වූ බැවින් උක්ත ඉදි කිරීම් සඳහා 2018 වාර්ෂික ක්රියාකාරී සැලැස්ම සැකසීමේ දී ඉලක්ක ඇතුළත් කළ නොමැති අතර රාජගිරිය ගුවන් පාලම ඉදි කිරීමේ ව්යාපෘතිය ශේෂ ව පැවති ක්රියාකාරකම් සඳහා 4%ක භෞතික ඉලක්ක අන්තර්ගත කර තිබිණි.

**මූල්‍ය ප්‍රගතිය - 2018.12.31**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-06-24** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 380.0 | 740.0 | 738.2 |
| | 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණුකිරීම් | 0.0 | 176.0 | 176.0 |
| | **එකතුව** | **380.0** | **916.0** | **914.2** |

ව්‍යාපෘතිය මගින් අත් කර ගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය 2017 දී 93% වූ අතර 2018 දී එම අගය 99% ලෙස වාර්තා විය. 2018 වර්ෂය සඳහා ආරම්භයේ දී වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය වරින් වර ඉහළ නැංවූ අතර පසු ගිය වර්ෂයන්හි පූර්ණය කර ගත නොහැකි වූ බිල්පත් පූර්ණය සඳහා උක්ත ප්‍රතිපාදන භාවිතයට ගන්නා ලදී.







**පොල්ගහවෙල ගුවන් පාලම** **ගනේමුල්ල ගුවන් පාලම** **රාජගිරිය ගුවන් පාලම**

# 7.0 ස්වභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම

## 7.1 ජාතික මහාමාර්ග ජාලයේ නායයෑමේ ව්‍යසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් සංවර්ධන සැලසුම්හි ප්‍රධානතම ඉලක්කයක් ලෙස සැලකිය හැකි ආරක්ෂකාරී මාර්ගජාලයක් ස්ථාපනය කිරීම උදෙසා නායයෑම් වැනි ස්වභාවික ව්‍යවසනයන්ගෙන් ජාතික මාර්ගජාලයට අයත් මාර්ග ආරක්ෂාකිරීම අපේක්ෂා කෙරේ. අධික වර්ෂාපතනය හේතුවෙන් නායයෑමේ අවධානමට ලක්වියහැකි කඳුකර සහ බෑවුම් ප්‍රදේශයන්හි නායයෑමේ අවස්ථාවන් අවම වන ලෙස මාර්ග කළමණාකරණය කිරීමේ ධාරිතාවයන් සවිමත් කිරීමද මෙහි දී සිදු කෙරේ.

මේ යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය සහ ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ නායයාමට ලක්වන බෑවුම් සහිත ස්ථාන කළමනාකරණයට සහ ආරක්ෂා කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ (තාක්ෂණික උපදෙස්) සැකසීමට සහ මාර්ග දෙපස බෑවුම් කළමනාකරණය සහ නායයෑම් පූර්ව දැනුම්දීමේ කාර්යයන්හි හැකියාවන් වර්ධනයට සාමූහිකව ප්‍රයත්න දරයි.

මෙම ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් සකසන ලද මාර්ගෝපදේශයන් දිස්ත්‍රික් පහත කඳුකර ප්‍රදේශයන්හි ජාතික මාර්ග ව්‍යාපෘති සඳහා භාවිතා කිරීමට නියමිතය.කෙසේවෙතත් මේ යටතේ ඔවුන්ගේ තාක්ෂණික ධාරිතාවය වර්ධනය කර ගැනීම, පිරිවැය සහ ධාරිතාවය සලකා බලමින් සැපයුම් ප්‍රශ්න නිරාකරණය කරගැනීම සඳහා මාර්ගස්ථ නායයෑම් ආපදා කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් සහිත ජාත්‍යන්තර උපදේශකයන්ගේ සහාය ලබාගැනීමට අපේක්ෂාවෙන් පසුවේ.

මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ජපාන යෙන් මිලියන 9,590 කි. ව්‍යාපෘතිය 2013 ජූලි 05 වන දින ආරම්භ කරන ලද අතර 2020 ජූලි මාසයේදී නිම කිරීමට නියමිතය. විශේෂයෙන්ම මේ ව්‍යාපෘතියේ ප්‍රධාන ඉලක්කය වනුයේ නායයෑම් වළක්වාගැනීම සඳහා යොදාගන්නා ජපන් ක්‍රම භාවිතය හඳුන්වාදීමය. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකර ප්‍රදේශය ආවරණය වන පරිදි මහනුවර, නුවරඑළිය, බදුල්ල, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල "ඒ"ශ්‍රේණියේ මාර්ග ආශ්‍රිතව නායයෑම් වළක්වාගැනීමේ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකෙරේ.

නායයෑමේ ව්‍යසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය පහත උපදේශන ක්‍රියාකාරකම් 06 සහ සිවිල් ඉදිකිරීම් කටයුතු වලින් සමන්විතය.සිවිල් වැඩ අදියර 1 රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව වෙත භාර දී ඇති අතර අදියර 11 හි සිවිල් වැඩ ආර් ආර් සොල්ටෙක් ඒකාබද්ධ සමාගම වෙත ප්‍රධානය කර ඇත. සිවිල් වැඩ යටතේ දිස්ත්‍රික්ක 05ක ප්‍රදේශ 16ක් ආවරණය වේ. සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා අත්කර ගනු ලැබූ භෞතික ප්‍රගතීන් පහත පරිදි දැක්විය හැකිය.

**කොන්ත්‍රාත් පැකේජ 1** - මේ යටතේ නුවරඑළිය, බදුල්ල, මහනුවර සහ කෑගල්ල යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රදේශ 10ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඉන් ප්‍රදේශ 07ක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මෙම පැකේජය සඳහා සිවිල් ඉදිකිරීම් කටයුතු 2017 මාර්තු මස ආරම්භ කළ අතර වසර අවසානයේදී අත් කර ගත් ප්‍රගතිය 3% විය. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අත්කරගත්

කාර්යසාධනය 33% වූ අතර 2017 සඳහා ඉලක්ක කළ ප්‍රමාණය 9% විය. 2018 වර්ෂය සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික ඉලක්ක සපුරා ගැනීම 100% ඉක්මවා ඇති අතර වසර අවසන් වන විට 90%ක ප්‍රගතියක් අත් කරගෙන ඇත.

**කොන්ත්‍රාත් පැකේජ 11 -** මේ යටතේ බදුල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රදේශ 06ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඉන් ප්‍රදේශ 05ක් බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මෙම පැකේජය සඳහා සිවිල් ඉදිකිරීම් කටයුතු 2017 මාර්තු මස ආරම්භ කළ අතර වසර අවසානයේදී අත් කර ගත් ප්‍රගතිය 38% විය. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අත්කරගත් කාර්යසාධනය 90% වූ අතර ඉලක්ක කළ ප්‍රමාණය 42% විය. 2018 වර්ෂයේ දී මෙම පැකේජය මගින් 97% භෞතික ඉලක්ක සපුරා ගැනීමක් වාර්තා කළ අතර අත් කර ගත් සමස්ත භෞතික ප්‍රගතිය 68% විය.

උපදේශන සේවා සඳහා අදල වන විෂයපථය එම එක් එක් ක්‍රියාකරකම සඳහා අත් කර ගනු ලැබූ භෞතික ප්‍රගතීන් පහත පරිදි වේ.

**වගු අංක 7.1.1 ස්වභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ දී උපදේශන සේවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

| ක්‍රියාකාරකම | භෞතික ප්‍රගතිය 31/12/2017(%) | භෞතික ප්‍රගතිය 31/12/2018(%) |
|---|---|---|
| පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපනය ස | නිම කර ඇත. | නිම කර ඇත. |
| ව්‍යවසන කළමනාකරණය පිළිබඳ ප්‍රසම්පාදන සහාය ලබා ගැනීම. | | |
| ව්‍යවසන කළමනාකරණය පිළිබඳ ඉදිකිරීම් සුපරීක්ෂණය | 75 | 83 |
| ධාරිතා සංවර්ධනය | 60 | 70 |
| නායයෑම් පිළිබඳ පරීක්ෂණය, මෙහෙයවීම සහ ඇගයීම. | නිම කර ඇත. | නිම කර ඇත. |
| ව්‍යවසන කළමනාකරණය පිළිබඳ විස්තරාත්මක ඇගයීම. | නිම කර ඇත. | නිම කර ඇත. |

ඌව, මධ්‍යම සහ සබරගමුව යන පලාත්වල ස්ථාන 30 ක ස්වයංක්‍රීය වැසිමාපක පද්ධති ස්ථාපනය කිරීම 2016 වර්ෂයේ තුන්වන කාර්තුව අවසන් වනවිට නිම කර ඇති අතර එහි මෘදුකාංග ස්ථාපනය සහ සංවර්ධන ක්‍රියාවලිය 2016 වර්ෂයේ සිව්වන කාර්තුවේදී ආරම්භ කර 2016 වසර අවසන් වනවිට සම්පූර්ණයෙන් නිමාවට පත්විය.

2017 වර්ෂයේදී ව්‍යවසන කළමනාකරණය පිළිබඳ ප්‍රසම්පාදන සහාය ලබා ගැනීම නිම වූ අතර 2016 දී එහි 95%ක් නිම වී තිබිණි. ව්‍යවසන කළමනාකරණය පිළිබඳ විස්තරාත්මක ඇගයීම් කටයුතු 2015 දී නිමාවට පත් වූ අතර ව්‍යවසන කළමනාකරණය පිළිබඳ ඉදිකිරීම් සුපරීක්ෂණය සහ ධාරිතා සංවර්ධන කටයුතු සඳහා

පිළිවෙලින් 75% ක සහ 60% ක භෞතික ප්‍රගතියක් 2017 වසර අවසානයේදී වාර්තා විය. 2017 වසර අවසානයේ දී උක්ත ව්‍යාපෘතිය මඟින් අත් කර ගත් භෞතික ප්‍රගතිය 28% වූ අතර 2018 දී එම අගය 84% ලෙස වාර්තා විය. සමස්ත භෞතික ප්‍රගතිය මෙලෙස දැක්විය හැකි වුව ද එම අගයයන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අන්තර්ගත කර ඇත්තේ ක්‍රියාකාරකම්වලට ඛණ්ඩනය කිරීමෙන් වන නිසා භෞතික ඉලක්ක පූර්ණය කිරීමේ කාර්යසාධනය ගණනය කළ නොහැක.

**2018/12/31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය ශීර්ෂය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| **117-02-07-13** | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 1,200.0 | 3082.0 | 3058.2 |
| | එකතුව | **1,200.0** | **3082.0** | **3058.2** |

මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රගතිය 2017 දී 87% ලෙස වාර්තා වූ අතර 2018 දී එම අගය 99% විය. මේ අනුව 2018 දී මෙම ව්‍යාපෘතිය සංශෝධිත අයවැය ප්‍රමාණය මුළුමනින්ම වැය කර ඇති බව පෙනේ.



ඒ 005 මාර්ගයේ බදුල්ල ප්‍රදේශයේ ඉදි කරන ලද නිර්මිතයක පැතිකඩ



ඒ 004 මාර්ගයේ වල්ලාපුතැන්න ප්‍රදේශයේ ඉදි කරන ලද නිර්මිතයක ඉදිරිපස පෙනුම

ජාතික මහාමාර්ග ජාලයේ නායයෑමේ ව්‍යවසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියේ පිළිබඳ පැතිකඩ පිළිබඳ තොරතුරු ඇමුණුම 18 යටතේ දැක්වේ.

## 8.0 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන

පසුගිය වසර කිහිපයක කාලය තුල ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය තුල ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන ඉතා වැදගත් අංගයක් බවට පත්ව ඇත. දිවයිනෙහි ග්‍රාමීය මාර්ග සංවර්ධන අවශ්‍යතා පිලිබඳ පූර්ව අවබෝධයකින් 2004 දී ආරම්භ වූ මෙම වැඩසයහන සඳහා නවීන ක්‍රමවේදයන් උපයෝගී කර ගන්නා ලදී. 2005 දී මේ යටතේ ග්‍රාමීය මාර්ගයන්හි කුඩා දුර ප්‍රමාණයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීම ආරම්භ කළ අතර එහිදී මෝටර් ග්‍රේඩර් කිරීම, බොරළු දමා තැලීම, ගල් අතුරා තාර දැමීම සහ කොන්ක්‍රීට් කිරීම සිදු කරන ලදී. 2009 දී මෙම වැඩසටහන පෙරනිමි අන්තර සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම දක්වා ව්‍යාප්ත වූ අතර එහිදී ගුණාත්මකබාවය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් තත්ත්ව පරීක්ෂණයකින් තොරාගත් කොන්ක්‍රීට් කුට්ටි යොදා ගන්නා ලදී.

ග්‍රාමීය අංශයේ ප්‍රවේශ අවශ්‍යතා වැඩිදියුණු කිරීමත්, එම අංශයේ සැලකිය යුතු සංවර්ධනයක් උදා කරගැනීම සහතික කිරීම සඳහාත් 'ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන' ලෙස නව්‍යකරණයට ලක් වූ මෙම නව වැඩසටහන යටතේ, ප්‍රමුඛ ග්‍රාමීය සංවර්ධන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් වඩාත් සංවිධානාත්මක ලෙස ග්‍රාමීය මාර්ග සංවර්ධනය සිදු කෙරේ. ග්‍රාමීය මාර්ග තෝරාගැනීමේ දී අතුරු මාර්ග බොහොමයකට සම්බන්ධ වන සහ පොදු ස්ථාන වැඩි ප්‍රමාණයකට ප්‍රවේශවිය හැකි මෙන් ම එතුලින් වැඩි පවුල් ඒකක ප්‍රමාණයක සුභසාධනය ඉහළ නැංවිය හැකි ග්‍රාමීය මාර්ග කෙරෙහි වැඩි අවධානය යොමු කෙරේ. අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඇති අනුමත ප්‍රජා පාදක සංවිධාන ඔස්සේ අදාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බැවින් සංවර්ධන ප්‍රතිලාභ මෙන් ම ඍජු මූල්‍ය ප්‍රතිලාභ ද ග්‍රාමීය ප්‍රජාව වෙත හිමිවේ. මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ;

- ඉහළ ග්‍රාමීය සංවර්ධනයකට ඉවහල් වනසේ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතා සහිත තෝරාගත් ග්‍රාමීය මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම.
- ග්‍රාමීය ජනතාවගේ එදිනෙදා ජන ජීවිතයට ඍජුවම බලපාන අති දුෂ්කර ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම.
- ග්‍රාමීය මට්ටමේ නව ව්‍යවසායකයින් බිහිකිරීම. (අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්, කොන්ක්‍රීට් කුට්ටි ගල් නිෂ්පාදකයින්)
- ග්‍රාමීය ප්‍රජා මූලික සමිති මගින් සංවර්ධන කටයුතු සිදුකිරීම තුලින් ග්‍රාමීය ශ්‍රමය සඳහා අවස්ථාව ලබාදීම.
- ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම.

මෙම වැඩසටහන යටතේ මෝටර් ග්‍රේඩර් කිරීම, බොරළු දමා තැලීම, ගල් අතුරා තාර දැමීම,කොන්ක්‍රීට් කිරීම, පෙරනිමි අන්තර සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සිදු කරන ලදී. මාර්ග සංවර්ධන කටයුතු වලට අමතර ව පැති කාණු සහ පැති බැමි ඉදිකිරීම, ගල් පුපුරවා ඉවත් කිරීම්, ග්‍රාමීය පාලම් ඉදි කිරීම සහ බොක්කු සහ පටුමාර්ග ඉදිකිරිම ද සිදු කරන ලදී.

### 8.1. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ භෞතික ප්‍රගතිය

2017 වර්ෂයේ ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන පහත සඳහන් කොටස් යටතේ සිදුකෙරේ.

I. කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරීම
II. කොන්ක්‍රීට් කිරීම
III. ගල් අතුරා තාර දැමීම
IV. පැති කාණු සහ පැති බැම් ඉදිකිරීම

මේ වැඩසටහන යටතේ 2017 වර්ෂය සඳහා ව්‍යාපෘති 3176කට අනුමැතිය ලැබුණු අතර ඉන් 1358ක් වසර තුළදී නිම කිරීමට හැකිවී ඇත.මේ යටතේ 2017 වසර සඳහා ඉලක්කගත කි.මී 328.3ක් පමණ වු ග්‍රාමීය මාර්ග අතුරින් ග්‍රාමීය මාර්ග කි.මී. 115.86 ක ප්‍රමාණයක සංවර්ධන කටයුතු 2017 දෙසැම්බර් මස අවසානය වන විට සිදුකර ඇත. මේ අනුව 2017 වර්ෂයේ දී මෙම වැඩසටහනෙහි භෞතික කාර්යසාධනය 50% වූ අතර 2016 වර්ෂයේ දී ඉලක්කගත කි.මී 157ක් පමණ වු ග්‍රාමීය මාර්ග අතුරින් ග්‍රාමීය මාර්ග කි.මී. 87.64 ක ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට හැකිවී ඇත.

2018 දී 2017 වර්ෂයේ දී ඉදි කරන ලද නිර්මිතයනට අතිරේක ව, බෝක්කු වැඩි ප්‍රමාණයක් ඉදි කරනු ලැබූ අතර 2018.12.31 වන විට ඉදි කරන ලද මුළු බෝක්කු ප්‍රමාණය 13 ලෙස වාර්තා විය. අනුමැතිය ලද සමස්ත ව්‍යාපෘති 2585න් 1333ක කටයුතු වසර අවසන් වන විට නිම කළ හැකි වූ අතර ඉලක්කගත මුළු දුර ප්‍රමාණය වූ කි. මී. 250න් කි.මී. 167.33ක ඉදි කිරීම් කටයුතු සම්පූර්ණ කර ගත හැකිවිය. මේ අනුව ගත්කල මෙම වැඩසටහන මගින් අත්කර ගත් භෞතික කාර්යසාධනය 67% ලෙස දැක්විය හැකි අතර එය 2017 වර්ෂය සඳහා වාර්තා වූ අගයට වඩා වැඩි අගයකි.

මෙම වැඩසටහන යටතේ ඉදිකරන ලද නිර්මිතයන් පහත පරිදි දැක්විය හැක.

**වගු අංක 8.1.1 ඉදිකරන ලද නිර්මිතයන්**

| | පැති කාණු (කි.මී.) | පැති බැම් (ව.මී.) | බෝක්කු |
|---|---|---|---|
| **2016** | **0.13** | 51.0 | - |
| **2017** | **0.43** | 114.0 | 1 |
| 2018 | 0.43 | 516.32 | 13 |

2018 වර්ෂයේ දී බෝක්කු ඉදි කිරීම සහ පැති බැම් ඉදි කිරීම 2017 වසර සමග සැසඳු කල වර්ධනයක් පෙන්වන අතර පැති කාණු ඉදි කරන ලද ප්‍රමාණයෙහි සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබුණි.

සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව මෙම වැඩසටහන 2018 සහ 2017 දී කාර්තුමය වශයෙන් සිදුකරන ලද ඉලක්ක සපුරාගැනීම පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.

**වගු අංක 8.1.2 – 2018 ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක සපුරාගැනීමෙහි ප්‍රගතිය**

| | 2017 | | | | | 2018 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | Q1 | Q2 | Q3 | Q4 | එකතුව | Q1 | Q2 | Q3 | Q4 | එකතුව |
| ඉලක්කය (%) | 8 | 12 | 34 | 46 | 100 | 10 | 20 | 30 | 40 | 100 |
| ප්‍රගතිය (%) | 8 | 1 | 5 | 36 | 50 | 40 | 9 | 1 | 17 | 67 |

මේ අනුව 2017 වසරේ දී වාර්තා වූ ඉහළ ම ඉලක්ක සපුරා ගැනීම (100%) පළමු කාර්තුව තුළ දී ද අවම ඉලක්ක සපුරා ගැනීම (8%) දෙවන කාර්තුව තුළදී ද වාර්තා විය. 2018 දී වූ ඉහළ ම ඉලක්ක සපුරා ගැනීම (40%) පළමු කාර්තුව තුළ දී ද අවම ඉලක්ක සපුරා ගැනීම (1%) තෙවන කාර්තුව තුළදී ද වාර්තා විය. මීට සමගාමී ව මෙම වැඩසටහන මගින් අත් කර ගත් භෞතික කාර්යසාධනය ඉලක්ක කරන ලද දුර අනුව සැසඳූ විට පහත පරිදි දැක්විය හැකිය.




**8.1 ප්‍රස්ථාරය - 2018 වර්ෂය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ භෞතික ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය**

### 8.2 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහනෙහි මූල්‍ය ප්‍රගතිය

2018 වර්ෂය සඳහා මෙම වැඩසටහන වෙත සැපයුණු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය වසර තුළ දී වාර 2ක දී වැඩි වූ අතර අයවැය යෝජන 2018 මගින මෙන් ම ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් අතිරේක ප්‍රතිපාදන ද මේ යටතෙහි ලා දැක්විය හැකිය. මේ අනුව සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 1600.3කින් වැඩි වූ අතර එය 50%ක වැඩි වීමක් ලෙස දැක්විය හැකිය.

ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව සිදු කරන ලද ගෙවීම් ප්‍රමාණය අනුව ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන මගින් අත්කර ගන්නා ලද සමස්ත මූල්‍ය ප්‍රගතිය 2018 සහ 2017 වර්ෂයන් සඳහා පිළිවෙළින් 64% සහ 46% ලෙස දැක්විය හැකිය. 2017 වර්ෂයේ දී උක්ත වැඩසටහන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණයට සාපේක්ෂව වාර්තාගත වැඩ ප්‍රමාණය සඳහා වන වියදම 69% ලෙස වාර්තා වූ අතර 2018 දී එම ප්‍රමාණය 84%කි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2017ට අනුව මූල්‍ය ඉලක්ක සපුරා ගැනීම කාර්තුමය වශයෙන් පිළිවෙළින් 91%, 13%, 17% සහ 69% ලෙස දැක්විය හැකි අතර 2018 සඳහා මෙම අගයන් පිළිවෙලින් 53% , 8% , 5% සහ 11% ලෙස දැක්විය හැකිය. මේ අනුව 2018 වර්ෂයේදී සමස්ත වැඩසටහන සඳහා වාර්තා වූ මූල්‍ය ප්‍රගතිය 18%න් වර්ධනය වීමක් සිදු වූ අතර 2018 වසර සඳහා මෙම වැඩසටහන සඳහා අත් කරගත් මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

**2018/12/31 ට මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | වැය විෂය/ අයිතම විස්තරය | අයවැය ප්‍රතිපාදනය (රු. මිලියන) | ප්‍රතිශෝධිත අයවැය (රු.මි.) | වියදම(රු.මි.) |
|---|---|---|---|---|
| 117-2-9-1 | 2506 යටිතල පහසුකම් සංවර්ධනය | 1,500.0 | 3,100.3 | 2,003.8 |
| | **එකතුව** | **1,500.0** | **3,100.3** | **2,003.8** |

## 9.0 ප්‍රගති සමාලෝචනය

පසුගිය දශකය සැලකිල්ලට ගත්විට, මහාමාර්ග අංශය සඳහා 2017 හා 2015 වර්ෂවලින් පසුව ඉහළම අයවැය ප්‍රතිපාදනයක් වෙන් කර ඇත්තේ 2018 වර්ෂය තුල දී බව සඳහන් කළහැක.

මහාමාර්ග අංශයේ ආයෝජන සහ වියදම් පිළිබඳව වැඩිදුර පැහැදිලි කිරීමක් ඇමුණුම් අංක 19 හි දක්වා ඇත.

වර්ෂ 2018 හීදී මහාමාර්ග අංශයේ සමස්ත ප්‍රගති සමාලෝචනය පිළිබඳව සලකා බැලීමේදී 2017හා 2018වසරවල මහාමාර්ග අංශය ලබාඇති මූල්‍යප්‍රගතිය පහත පරිදි සාරාංශ ගතකළ හැක.

## 9.1. මූල්‍ය ප්‍රගතිය

මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ මහාමාර්ග අංශය විසින් 2017වර්ෂයේ මෙන් ම 2018වර්ෂයේ ද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 06ක් වන අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන, මහාමාර්ග සංවර්ධන වැඩසටහන, මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන, පාලම් සහ ගුවන් පාලම් ඉදි කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන, ස්වාභාවික විපත්වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන හා ග්‍රාමීය මාර්ග සංවර්ධන කිරීමේ වැඩසටහන යන වැඩසටහන් සඳහා අමාත්‍යාංශ ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන වැය කරන ලදී.




**9.1. රූපසටහන සමස්ත මූල්‍ය ප්‍රගතිය -මහාමාර්ග අංශය**

මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේමහාමාර්ග අංශය සඳහා 2018 වර්ෂයේදී වෙන් කෙරුණු සමස්ත සංශෝධිත ප්‍රතිපාදනය රු. මිලියන 196,318.42 ක් වන අතර ඉන් 85% ක ප්‍රමාණයක් මහාමාර්ග අංශයේ උන්නතිය වෙනුවෙන් යොදවා ඇත. 2017 වර්ෂයේදී මහාමාර්ග අංශයෙන් වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය සංශෝධිත අයවැය ප්‍රතිපාදනයෙන් 93% ක් වන අතර වර්ෂයසඳහා වූ මුළු වියදමරු. මිලියන 192,039.10කි. මහාමාර්ග අංශය සඳහා 2018 වර්ෂයේ ආයෝජනය 2017 වර්ෂයට වඩා අඩු අගයක් වූ නමුත් එය 2016 වර්ෂයට වඩා වැඩි අගයක් ගෙන ඇත. වියදම ද ඒ

ආකාරයටම වේ.පසුගිය දශකයක කාලය සලකා බැලීමේ දී, 2017 වර්ෂය වැඩිම ප්‍රතිපාදන හා වියදම වාර්තා කර ඇත්තේ 2017 වර්ෂයේ දී ය.

නව කැළණි පාලමේ සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය, කුළුණු මතින් ඉදිවන වරාය පිවිසුම් මහාමාර්ග ව්‍යාපෘතිය, බේස්ලයින් මාර්ග දිගුව අදියර 3 සහ පානදුර දක්වා සමුද්‍රීය මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් සියල්ල ඒවායෙහි මූලික අවධීන්හි ක්‍රියාත්මක ව පැවතීම නිසා සැලකිය යුතු මූල්‍ය ප්‍රගතියක් එම ව්‍යාපෘති සඳහා වාර්තා නොවුණි.

රු. මිලියන 136,263 පමණ මහාභාණ්ඩාගාරයෙන් මහාමාර්ග අංශය සඳහා වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය පවතින අවශ්‍යතාවය මත වසර අවසාන වන විට 44% ක වර්ධනයකින් සංශෝධන වූ අතර මෙකී තත්ත්වය මත වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය පූර්වයේ වෙන් කෙරුණු අගය සමඟ සැසඳීමේ දී 100% අගය ඉක්ම වූ මූල්‍ය ප්‍රගති ප්‍රමාණයක් ලෙස දැක්විය හැකිය. රු.මි. 125,263.3 ක් පමණ වූ අයවැය ප්‍රතිපාදනයට අමතරව රු.බි.11 කප්‍රතිපාදනප්‍රමාණයක් අයවැය යෝජනාවක් ලෙස මහාමාර්ග අංශය වෙත ලබා දෙන ලදී. එමෙන් ම, වර්ෂය අතරතුර දී රු.බි. 30 ක පමණ අමතර ප්‍රතිපාදන සහ පරිපූරක අයවැය ප්‍රතිපාදන ලෙස තවත් රු.බි. 30 ක් අමාත්‍යාංශයේමහාමාර්ග අංශය වෙත වෙන් කරන ලදී. ඒ අනුව , වර්ෂය අවසාන වන විට මහාමාර්ග අංශය සඳහා වෙන් තරන ලද මුළු ප්‍රතිපාදනය රු.මි.196,318.38 ක් පමණ වේ.

**9.1.2. රූපසටහනමහාමාර්ග අංශය සඳහා වෙන් කරන ලද සංශෝධිත අයවැය ප්‍රතිපාදන සංයුතිය 2018**



2018 වර්ෂයෙහි වියදම 2017 වර්ෂයට වඩා පහළ අගයක් වුව ද , ව්‍යාපෘති ඉතා ඵලදායී ලෙස සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක වූ අතර වසර අවසාන වන විට අතැති බිල්පත් විශාල ලෙස වගකීමක්ව පැවතුනි. බිල්පත් පියවීම සඳහා ප්‍රමාණවත් අක්මුදල් වර්ෂ අවසානයේ දී නොලැබුණි.

පහත සඳහන් වගුවෙ හි 2018 දෙසැම්බර් 31 වනවිට වාර්තා වූ වැඩ වටිනාකම හා ගෙවීම ට ඇති බිල්පත් වටිනාකම දක්වා ඇත.

**වගුව 9.1.1. 2018 දෙසැම්බර් 31 වනවිට වාර්තා වූ වැඩ වටිනාකම හා ගෙවීම ට ඇති බිල්පත් වටිනාකම**

| අරමුදල් ප්‍රභවය | වාර්තා වූ වැඩ වටිනාකම රු. මි | ගෙවීම ට ඇති බිල්පත් වටිනාකම රු.මි. |
|---|---|---|
| දේශීය අරමුදල් ( 11/17) | 59,988.58 | 36,956.55 |
| විදේශීය අරමුදල් ( 12) | 71,266.13 | 49,943.77 |
| සම මූල්‍යයනය ( 14/18) | 218.35 | 269.70 |
| එකතුව | 131,473.05 | 87,170.02 |

### 9.1.1. මෙහෙයුම් ක්‍රියාකාරකම්

අමාත්‍යාංශ මෙහෙයුම් ක්‍රියාකාරකම් පහත දැක්වෙන ආකාරයට ප්‍රධාන අයිතම/වර්ග 03කට වෙන් කර දැක්විය හැකිය.

- අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් කටයුතු
- රාජ්‍ය අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් කටයුතු
- අමාත්‍යාංශ ආයතනික කටයුතු

2017සහ 2018 වර්ෂයන් සඳහා අමාත්‍යාංශ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය පහත පරිදි දැක්විය හැකිය.

**වගු අංක 9.1.2 - මෙහෙයුම් ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | අයිතමය/වර්ගය | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදන රු.මි | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| 117-1-1 | අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් ක්‍රියාකාරකම් | 70.94 | 66.97 | **94%** | 27.82 | 24.79 | **89%** |
| 117-1-11 | රාජ්‍ය අමාත්‍ය කාර්යාලීය මෙහෙයුම් ක්‍රියාකාරකම් | 27.17 | 26.42 | **97%** | 25.79 | 23.85 | **92%** |
| 117-1-2 | අමාත්‍යාංශ ආයතනික කටයුතු | 229.42 | 184.67 | **80%** | 220.63 | 188.31 | **85%** |
| | එකතුව | **327.53** | **278.06** | **85%** | **274.24** | **236.95** | **86%** |

මෙම ප්‍රතිපාදන අමාත්‍ය කාර්යාලය, රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශයෙහි ආයතනික හා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් වියදම් දැරීමට වෙන් කර ඇත.මෙම ප්‍රතිපාදන ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස ප්‍රධාන වර්ග දෙකකට බෙදා දැක්විය හැකි අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය , වැඩිදියුණු කිරීම හා මිලදී ගැනීම සදහා භාවිතා කරනු ලබයි. පුනරාවර්තන ප්‍රතිපාදන මගින් පුද්ගල පඩිනඩි, ගමන් වියදම්, සැපයුම් , නඩත්තු සේවා හා වර්ෂය තුල ඇතිවන අනෙකුත් පුනරාවර්තන වියදම් දරනු ලබයි.

මෙහෙයුම් කටයුතු සදහා වැඩිම ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලබන්නේ අමාත්‍යාංශ ආයතනික කටයුතු වෙනුවෙනි. 2018 වර්ෂය සදහා ලබාදෙන ලද ප්‍රතිපාදන ප්‍රමාණය 2017 වර්ෂයට වඩා අඩු අගයක් ගෙන ඇති නමුත් වියදම ප්‍රතිශතයක් ලෙස ගත් කල 2018 වර්ෂයේ දී වැඩි අගයක් ගෙන ඇත.එමෙන් ම, වියදම පෙර වර්ෂයට වඩා අඩු අගයක් ගෙන ඇත.

### 9.1.2. සංවර්ධන ක්‍රියාකාරකම්

සංවර්ධන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ආකාරයට ප්‍රධාන අයිතම/වර්ග 07කට වෙන්කර දැක්විය හැක. ඒවා නම්,

- අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන
- මහාමාර්ග සංවර්ධන වැඩසටහන
- මාර්ග පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරිමේ වැඩසටහන
- පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරිමේ වැඩසටහන
- ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන
- ආයතනික සහාය වැඩසටහන
- ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහන

**(අ) . අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන**

2018 වර්ෂයේදී අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 07ක් සඳහා අමාත්‍යාංශ අයවැය ප්‍රතිපාදන වෙන් කරනු ලැබූ අතර 2017 දී එම ගණන 09 කි. අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා 2018 සහ 2017 වර්ෂ අවසානයේදී අත්පත් කරගත් සමස්ත මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 78% සහ 96% කි. 2018 වර්ෂයේ දී ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ ප්‍රතිශතය 18% න් පහත වැටී ඇති අතර එයට ප්‍රධාන හේතුව ලෙස අක් මුදල් ප්‍රමාණවත් නොවීම හා ලැබීමේ ප්‍රමාදය දැක්විය හැකිය. විදේශීය අරමුදල් ලබා ගැනීමේ දී මුහුණපෑ ගැටළු ද අඩු වියදමක් වාර්තා වීමට හේතු වී ඇති අතර 2018 වර්ෂය අවසාන වනවිට සැලකිය යුතු වටිනාකමක අතැති බිල්පත් ප්‍රමාණයක් වාර්තා වී තිබුණි.ප්‍රමාණවත්අක්මුදල් හා අතුරු ගෙවීම් සහතිකවලට අදාල කටයුතු වර්ෂය තුල නියමිත පරිදි ක්‍රියාත්මක වූයේ නම් වැඩි වියදමක් වර්ෂය අවසාන වනවිට වාර්තා කිරීමට හැකි වේ.

**වගු අංක 9.1.3. - අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | 2017මූල්‍ය ප්‍රගතිය | | | 2018 මූල්‍ය ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනරු.මි | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු.මි | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % |
| අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන | 82,984.0 | 79,429.2 | 96% | 78,627.25 | 61,454.94 | 78% |

2018 වර්ෂය සඳහාමූල්‍යප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති 07න් , ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක තත්වයේ පවතින අතර පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය - II වන අදියර පමණක් නිම වූ ව්‍යාපෘතික් වන අතර එහි බිල්පත් පියවීමේ කටයුතු සිදුවෙමින් පවතී.

අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතට ගැනෙන එක් එක් ව්‍යාපෘති මඟින් අත් කරගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය වගු අංක 9.1.3 මඟින් දක්වා ඇත.

**වගු අංක 9.1.4-අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහනේ එක් එක් ව්‍යාපෘති මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය**

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදන රු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදන රු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-3-5** | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය - II ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය | 450.00 | 432.00 | 96% | 392.00 | 376.63 | 96% |
| **117-2-3-7** | මධ්‍යම අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 2,861.7 | 2,016.3 | 70% | 7,907.00 | 7,676.00 | 97% |
| **117-2-3-9** | දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය | 66,600.4 | 65,657.6 | 99% | 52,709.5 | 40,019.94 | 76% |
| **117-2-3-10** | පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය - III කඩවත සිට කෙරවලපිටිය දක්වා - චීන ආධාර | 12,663.00 | 11,126.4 | 88% | 17,385.0 | 13,223.59 | 76% |

| අයවැය කේතය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදන රු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදන රු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-3-13** | රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | 100.00 | 92.1 | 92% | 90.0 | 75.03 | 84% |
| **117-2-3-15** | නව කැලණි පාලම සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය | 186.8 | 26.8 | 14% | 111.75 | 53.03 | 47% |
| **117-2-3-16** | වරාය පිවිසුම් මාර්ග ව්‍යාපෘතිය | 45.3 | 24.4 | 54% | 32.00 | 30.45 | 95% |
| | එකතුව | **82,907.2** | **79,375.6** | **96%** | **78,627.25** | **61,454.94** | **78%** |

ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් රු.මි. 78,627.5 ක මුදලක් 2018 අයවැය ප්‍රතිපාදන, පරිපූරක අයවැය සහ අතිරේක ප්‍රතිපාදන මගින් වෙන් කළ අතර එහි මූල්‍යප්‍රගතිය 78% කි.අධිවේගී මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ නව කැලණි පාලම සිට රාජගිරිය හරහා අතුරුගිරිය දක්වා කුළුණු මතින් ඉදිවන මහාමාර්ග ව්‍යාපෘතිය  අවම මූල්‍යප්‍රගතියක් වාර්තා කරන අතර එහි ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂය තුල ද ආරම්භ නොවී ය. එම ව්‍යාපෘතිය හැර සෙසු සියලු  අධිවේගී මාර්ග ව්‍යාපෘති 50% ඉක්මවන මූල්‍යප්‍රගතියක් වාර්තා කර ඇති අතර ඉදිකිරීම් කටයුතු හි අවසාන අදියරෙහි පවතිනදක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියඉහළම වියදමක් වාර්තා කර ඇත.

**(ආ) මහාමාර්ග සංවර්ධන වැඩසටහන**

2017සහ 2018වර්ෂසඳහා මහාමාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මහාමාර්ග සංවර්ධන ව්‍යාපෘති 26 ක් සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් වූ අතර 2017වර්ෂය සමඟ සැසඳීමේදී 2018වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණය පහළ ගොස් ඇත.

**වගු අංක 9.1.5- මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි සමස්ත මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | 2017 මූල්‍ය ප්‍රගතිය | | | 2018 මූල්‍ය ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනරු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| මහාමාර්ග සංවර්ධන වැඩසටහන | 80,994.1 | 76,589.2 | 95% | 79,201.6 | 72,218.51 | 91% |

පූර්වයෙන් සඳහන් කළ ව්‍යාපෘති 26 අතුරින් ව්‍යාපෘති 5ක් 2018 වසරේදී 100% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර තවත් ව්‍යාපෘති 12 ක් 80% ඉක්මවූ මූල්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. අනෙක් ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 5ක් 50% ඉහළ මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති අතර ව්‍යාපෘති 4 ක් 50% අඩු මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත.

අවමමූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇති ව්‍යාපෘතිය වන්නේ බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය අදියර III වන අතර එය අධිකරණ තීන්දුවක් මත තාවකාලිකව ඉඩම් මිල දී ගැනීමේ කටයුතු 2018 වර්ෂයේ මැයි මස වන තෙක් අත්හිටුවන ලදී. වාර්ෂික වැඩසටහන් ලෙස ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක වේ.වෙන් කරන ලද ප්‍රතිපාදන මෙන් ම, වියදම ද 2018 වර්ෂයේ දී 2017 වර්ෂයට වඩා අඩු අගයක් ගෙන ඇත.2018 වර්ෂය අග භාගය දී ඇති වූ අක් මුදල් ලැබීමේ ප්‍රමාදය හා ප්‍රමාණවත් අක් මුදල් නොලැබීමේ ගැටලුව හේතුවෙන් වියදම් වාර්තා වීමේ දී අඩු වටිනාකමක් පෙන්වන අතර අතැති බිල්පත් 2018 වර්ෂය අවසාන වන විට වාර්තා විය.

**වගු අංක 9.1.6- මහාමාර්ග සංවර්ධන වැඩසටහනෙහි එක් එක් ව්‍යාපෘතීන් මඟින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-4-1** | මාර්ග සහ පාලම් නඩත්තු කිරීම ( මාර්ග නඩත්තු භාරකාර අරමුදල ) | 4,000.00 | 3,638.6 | 91% | 5,385.00 | 4,360.00 | 81% |
| **117-2-4-10** | බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය අදියර III | 25 | 15.6 | 62% | 105.00 | 10.85 | 10% |
| **117-2-4-13** | පාදෙණිය - අනුරාධපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 5.0 | 5.0 | 100% | 1.00 | 1.00 | 100% |
| **117-2-4-18** | හැටන් - නුවරඑළිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - ආර්ථික සංවර්ධන සහයෝගීතා පදනම | 50.7 | 18.5 | 37% | 30.60 | 30.60 | 100% |
| **117-2-4-21** | රථවාහන ගමනාගමන කළමනාකරණ ව්‍යාපෘතිය | 25 | 8.5 | 34% | 19.00 | 16.36 | 86% |
| **117-2-4-22** | මහකොළඹ නගර ප්‍රදේශයේ රථවාහන ගමනාගමන කළමනාකරණ | 25.00 | 25.00 | 100% | 41.50 | 37.44 | 90% |

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| | ව්‍යාපෘතිය | | | | | | |
| 117-2-4-23 | පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (ඒ5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල | 1.5 | 1.3 | 85% | 1,215.00 | 694.58 | 57% |
| 117-2-4-28 | ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව | 284.5 | 280.00 | 99% | 100.00 | 100.00 | 100% |
| 117-2-4-29 | මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල | 426.2 | 406.2 | 95% | 163.25 | 47.7 | 29% |
| 117-2-4-30 | උතුරු මාර්ග සබඳතා ව්‍යාපෘතිය - අතිරේක ණය / අරමුදල් සැපයීම- ආසියානු සංවර්ධන බැංකුව | 706.00 | 584.65% | 83% | 828.00 | 708.57 | 86% |
| 117-2-4-31 | මාර්ග ජාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 309.6 | 181.1% | 58% | 275.00 | 145.51 | 53% |
| 117-2-4-32 | කොළඹ දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 2,067.3 | 2,003.12 | 97% | 1,661.00 | 1,461.06 | 88% |
| 117-2-4-39 | ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - චීන සංවර්ධන බැංකුව | 7,900.00 | 7,611.6 | 96% | 3,465.00 | 3,420.91 | 99% |
| 117-2-4-40 | බස්නාහිර පළාත් ජාතික මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 457.3 | 32.4 | 7% | 1,222.70 | 1,022.50 | 84% |

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| 117-2-4-41 | පේරාදෙණිය-බදුල්ල-චෙන්කලාඩි (ඒ5) මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 2,145.5 | 2,084.5 | 97% | 1,765.00 | 1,437.26 | 81% |
| 117-2-4-42 | අධිවේගී මාර්ග සබඳතා ව්‍යාපෘතිය | 285.00 | 72.33 | 25% | 99.50 | 60.39 | 61% |
| 117-2-4-43 | දක්ෂිණ මාර්ග සබඳතා ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකුව | 2,215.00 | 1,789.5 | 81% | 2,829.05 | 2,473.37 | 87% |
| 117-2-4-44 | ඒකාබද්ධ මාර්ග මෙහෙයුම් සහ සංවර්ධන වැඩසටහන (I Road) ආසියානු සංවර්ධන බැංකුව | 18,837.7 | 18,544.4 | 98% | 16,559.00 | 13,933.0 | 84% |
| 117-2-4-45 | මධ්‍යම හා ඌව පළාත් හි මාර්ග හා පාලම් පුළුල් කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | - | - | - | 1,902.00 | 1901.42 | 100% |
| 117-2-4-46 | ප්‍රමුඛතා මාර්ග ප්‍රතිසංස්කරණ කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 3අදියර II -චීන සංවර්ධන බැංකුව | 7,200.00 | 5,991.1 | 83% | 4,470.00 | 3,654.21 | 82% |
| 117-2-4-47 | ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය | 280.00 | 92.3 | 33% | 279.00 | 208.04 | 75% |
| 117-2-4-48 | ප්‍රවාහන සබඳතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | 80 | 63.8 | 80% | 92.00 | 31.22 | 34% |
| 117-2-4-49 | පානදුර දක්වා සමුද්‍රීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 150.00 | 15.00 | 10% | 200.00 | 76.20 | 38% |
| 117-2-4-51 | රජයේ සුරක්ෂිතතාව මත දේශීය බැංකු විසින් අරමුදල් සපයනු ලබන මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති | 30,323.4 | 30,320.7 | 100% | 35,200.00 | 35,194.9 | 100% |

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු. මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| 117-2-4-52 | සම්පූර්ණ කරන ලද සහ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කරගැනීම | 2,350.00 | 2,230.3 | 95% | 1,145.00 | 1,089.44 | 95% |
| 117-2-4-53 | යන්ත්‍රෝපකරණ, පර්යේෂණ හා සංවර්ධන, සමීක්ෂණ සහ ආයෝජන, පුහුණුවීම් | 100.00 | 51.5 | 52% | 149.00 | 101.98 | 68% |
| | **එකතුව** | **80,249.7** | **76,067.7** | **95%** | **79,201.6** | **72,218.51** | **91%** |

ඉහත සඳහන් කළ ව්‍යාපෘති අතුරින් පහත දැක්වෙන ව්‍යාපෘතින්හි බිල්පත් ගෙවීම් කටයුතු පමණක් 2018 වර්ෂයේදී සිදු කෙරුණි.ඒවා නම්,

- ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය
- පාදෙණිය - අනුරාධපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය
- හැටන් - නුවරඑළිය මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය - ආර්ථික සංවර්ධන සහයෝගීතා පදනම
- උතුරුමාර්ගසබඳතා ව්‍යාපෘතිය- ආසියානුසංවර්ධනබැංකුව
- මාර්ගජාලයසංවර්ධනයකිරීමේව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල
- උතුරුමාර්ගසබඳතාව්‍යාපෘතිය - අතිරේකණය / අරමුදල් සැපයීම - ආසියානු සංවර්ධන බැංකුව
- මාර්ගජාලයසංවර්ධනයකිරීමේව්‍යාපෘතිය - සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල

**(ඉ)මාර්ග පුළුල් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන**

මෙම වැඩසටහන සඳහා 2018වර්ෂය තුලදී වාර්තා වූ සමස්ත මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

**වගු අංක9.1.7මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනරු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ** වැඩසටහන | 10,734.4 | 9,211.5 | 86% | 10,865.00 | 7,558.99 | 70% |

මෙම වාර්ෂික වැඩසටහන සඳහා 2017 හා 2018 යන වර්ෂවල දී රු. බිලියන 10 ට වැඩි ප්‍රතිපාදනප්‍රමාණයක් වෙන් කර ඇත. 2017 වර්ෂයට වඩා අඩු මූල්‍ය ප්‍රගතියක් 2018 වර්ෂයේ දී වාර්තා වූ අතර වියදමෙහි ද පහත වැටීමක් දක්නට ඇත. නමුත්, 2018 වර්ෂය අවසාන වන විට අතැති බිල්පත් පැවති අතර ප්‍රමාණවත් අක් මුදල් නොලැබුණි.

**වගු අංක 9.1.8මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහනසඳහා පළාත් මට්ටමින් අත් කරගත් මූල්‍ය ප්‍රගතිය**

| අයවැය ශීර්ෂය | පළාතෙහි නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු .මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදන රු.මි | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-5-01,2,3** | බස්නාහිර පළාත | 1,361.67 | 990.18 | 73% | 2,217.00 | 756.99 | 34% |
| **117-2-5-04,5,6** | මධ්‍යම පළාත | 534.70 | 436.13 | 82% | 1,018.00 | 473.51 | 47% |
| **117-2-5-07,8,9** | දකුණු පළාත | 734.30 | 647.43 | 88% | 914.00 | 559.25 | 61% |
| **117-2-5-10, 11,12,13,14** | උතුරු පළාත | 1,003.65 | 975.17 | 97% | 807.00 | 592.88 | 73% |
| **117-2-5-15,16,17** | නැගෙනහිර පළාත | 367.30 | 367.30 | 100% | 318.00 | 284.27 | 89% |
| **117-2-5-18, 19** | වයඹ පළාත | 665.01 | 607.79 | 91% | 759.10 | 595.35 | 78% |
| **117-2-5-20,21** | උතුරු මැද පළාත | 666.29 | 666.29 | 100% | 587.90 | 494.13 | 84% |
| **117-2-5-22,23** | ඌව පළාත | 264.86 | 231.67 | 87% | 319.00 | 177.83 | 56% |
| **117-2-5-24,25** | සබරගමුව පළාත | 325.00 | 374.90 | 85% | 425.00 | 335.04 | 79% |
| **117-2-5-26** | බදු | 714.57 | 714.57 | 100% | 800.00 | 589.74 | 74% |
| **117-2-5-29** | ජාතික ඉතිරිකිරීම් බැංකු අරමුදල් ව්‍යාපෘති | 4,100.00 | 3,300.00 | 80% | 2700.00 | 2700.00 | 100% |
| | **එකතුව** | **10,737.40** | **9,211.5** | **86%** | **10,865.00** | **7,558.99** | **70%** |

**(ඊ)පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන**

**වගුඅංක 9.1.9. පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන සඳහා සමස්ත මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනරු. මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු. මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන** | 19,774.4 | 17,556.8 | 89% | 14,333.00 | 13,311.00 | 93% |

පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ 2017 වර්ෂයේදී මෙන්ම 2018 වර්ෂයේදීද ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක වූ අතර 2018 වර්ෂයේදී 2017 වර්ෂයට වඩා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් විය. නමුත්, 2018 වර්ෂයේ දී 2017 වර්ෂයට වඩා ඉහළ මූල්‍යප්‍රගතියක් අත්කරගෙන ඇත.

සමස්ත වැඩසටහන මඟින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැක.

**වගු අංක 9.1.10. පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු .මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු .මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-6-8** | ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත් අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය | 274.00 | 224.00 | 82 | 400.00 | 243.68 | 61% |
| **117-2-6-14** | පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 300.00 | 157.00 | 52 | 343.00 | 221.20 | 64% |
| **117-2-6-16** | ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය - අදියර II - HSBC බැංකුව | 981.9 | 940.9 | 96 | 346.00 | 346.00 | 100% |
| **117-2-6-17** | පාලම් 25ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - කුවේට් ආධාර | 287.00 | 254.6 | 89 | 345.00 | 279.21 | 81% |
| **117-2-6-18** | පාලම් 46 ක් නැවත ඉදිකිරීම - ප්‍රංශ රජය | 280.00 | 272.5 | 97 | 119.00 | 118.50 | 100% |

| අයවැය කේතය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-6-19** | ජාතික මහාමාර්ග ජාලයේ පිහිටි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය | 2,994.5 | 2,861.6 | 96% | 2,247.00 | 2,212.24 | 98% |
| **117-2-6-20** | පැලියගොඩ - පුත්තලම මාර්ගයේ කොච්චිකඩේ පාලම ඉදිකිරීම - ඔස්ට්‍රියානු ආධාර | 1,400.00 | 648.2 | 46% | 437.00 | 435.60 | 100% |
| **117-2-6-21** | දෙවන නව කැළණි පාලම ඉදිකිරීම - ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය | 8,750.00 | 8,015.4 | 92% | 9,160.00 | 8,525.39 | 93% |
| **117-2-6-22** | පාලම් නඩත්තු කිරිමේ ඒකකයක් ස්ථාපනය කිරීම | 27.5 | 20.16 | 73% | 15.00 | 12.27 | 82% |
| **117-2-6-23** | තට්ටුතුරේ සපත්තු පාලම හා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම - සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල | 24.6 | 21.9 | 89% | 5.00 | 2.73 | 55% |
| **117-2-6-24** | රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීම - ස්පාඤ්ඤ අරමුදල් | 4,454.9 | 4,140.6 | 93% | 916.00 | 914.18 | 100% |
| | එකතුව | **19,774.4** | **17,556.8** | **89%** | **14,333.00** | **13,311.0** | **93%** |

මෙම වැඩසටහන යටතේ, වාර්ෂික වැඩසටහන් 03 ක් ලෙස ජාතික මහාමාර්ගයන්හි පිහිටි හානියට පත් අබලන් පාලම් නැවත ඉදිකිරීම / ප්‍රතිනිර්මාණය,පැරණි පාලම් කොටස් භාවිත කරමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම හා පාලම් නඩත්තු කිරිමේ ඒකකයක් ස්ථාපනය කිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.වැඩ අවසන් කරන ලද තට්ටුතුරේ සපත්තු පාලම හා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ රාජගිරිය, පොල්ගහවෙල, ගනේමුල්ල ගුවන් පාලම් ඉදිකිරීම යන ව්‍යාපෘතීන් හි බිල්පත් ගෙවීමේ කටයුතු 2018 වර්ෂයේ දී සිදුවිය.මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 07ක් 2017 වර්ෂයට වඩා ඉහළ මූල්‍ය ප්‍රගතියක් 2018 වර්ෂයේ දී ළගාකරගෙන ඇත.

**( උ) . ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන**

ස්වාභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ 2018වර්ෂය සඳහා ක්‍රියාත්මක වූයේ ජාතික මහාමාර්ග ජාලයේ නායයාම් ව්‍යවසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය පමණි. මීට අමතරව දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ද ප්‍රතිපාදන වෙන් වූ අතර එම ව්‍යාපෘති වැඩ අවසන් කරන ලද නමුත්, බිල්පත් පියවීමට පවතින ව්‍යාපෘතියකි.

**වගුඅංක 9.1.11ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහනේ සමස්ත මූල්‍ය ප්‍රගතිය**

| වැඩසටහන | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | සංශෝධිත ප්‍රතිපාදනරු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **ස්වාභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ** වැඩසටහන | 2,548.00 | 1,353.2 | 53% | 3,805.00 | 3,780.75 | 99% |

මෙම වැඩසටහන යටතට ගැනෙන එක් එක් ව්‍යාපෘති මඟින් අත්කරගනු ලැබූ මූල්‍ය ප්‍රගතීන් පහත පරිදි දැක්විය හැක.

**වගුඅංක 9.1.12 ස්වභාවික විපත් වලින් හානියට පත් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය**

| අයවැය කේතය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-7-8** | දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | 500.00 | - | - | 723.00 | 722.52 | 99% |
| **117-2-7-13** | ජාතික මහාමාර්ග ජාලයේ නායයාම් ව්‍යවසන ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය | 2,048.00 | 1,353.2 | 66% | 3,082.00 | 3,058.22 | 99% |
| | **එකතුව** | **2,548.00** | **1,353.2** | **53%** | **3,805.0** | **3780.75** | **99%** |

මෙම වැඩසටහනෙහි සමස්තප්‍රගතිය 2017 වර්ෂයට වඩා ඉහළ අගයක් 2018 වර්ෂයේ දී ගෙන ඇත.

**(ඌ) ආයතනික සහාය වැඩසටහන**

ආයතනික සභාය වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්වූයේ එක් අයිතමයක් සඳහා පමණි. එබැවින් මෙහි මූල්‍ය ප්‍රගතියලෙස මාර්ග සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් වියදමෙහි (ප්‍රාග්ධන)මූල්‍ය ප්‍රගතියසඳහන් කල හැක.

එහි මූල්‍ය ප්‍රගතිය පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

වගුඅංක 9.1.13 ආයතනික සභාය වැඩසටහනේ එක් එක් ව්‍යෘපෘතිය සඳහා මූල්‍ය ප්‍රගතිය

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි | මූල්‍ය ප්‍රගතිය % |
| **117-2-8-1** | මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන | 6,110.00 | 6,108.8 | 99% | 6,112.00 | 6,112.0 | 100% |
| | එකතුව | **6,110.00** | **6,108.8** | **99%** | **6,112.00** | **6,112.0** | **100%** |

උක්ත වැඩසටහන යටතේ 2017 වර්ෂය තුලදී අත්පත් කරගත් සමස්ත මූල්‍යප්‍රගතිය 99% ක් වන අතර එය 2018 වර්ෂයේදී 100% ක් ලෙස වාර්තා විය. එසේම මාර්ග සංවර්ධන අධිකාරියෙහි මෙහෙයුම් පිරිවැය සඳහා වෙන් කෙරුණු අයවැය ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ම උපයෝගී කරගෙන ඇත.

**(එ) ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන**

මෙම වැඩසටහන සඳහා 2018 වර්ෂය සඳහා වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය 2017 වර්ෂයට වඩා අඩු අගයක් ගෙන ඇත..ඒ අනුව ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන මඟින් 2017 වර්ෂයේදී අත්කර ගනු ලැබූ මූල්‍ය ප්‍රගතිය 46% ක් වන අතර 2018 වර්ෂයේදී එම අගය 65% කි.ඒ අනුව, 2018 වර්ෂයේ දී වැඩි වියදමක් වාර්තා විය.

වගුඅංක 9.1.14 ග්‍රාමීය මාර්ග පුනර්ජීවන වැඩසටහන මඟින් අත්කරගනු ලැබූ සමස්ත මූල්‍ය ප්‍රගතිය

| අයවැය ශීර්ෂය | ව්‍යාපෘතියේ නම | 2017 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ප්‍රතිපාදනරු.මි. | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | සංශෝධිත ප්‍රතිපාදනරු.මි. | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % |
